# බස්නාහිර පළාතේ පළාත් සභාව

## மேல் மாகாண மாகாண சபை

## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2017 ජූලි 04** වන අඟහරුවාදා
2017 ஆடி 04 செவ்வாய்க் கிழமை
Tuesday 04th July 2017

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்லஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல. , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.30 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.30 க்கு சபை கூடியது
*The Provincial Council met at 09.30 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு.தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදනය

## ANNOUNCEMENT OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*පසුගිය දිනවල පැවති තැපැල් දෙපාර්තමේන්තු වෘත්තීය ක්‍රියාමාර්ග හේතුකොට ගෙන ඇති වූ අවහිරතාවය නිසා න්‍යාය පත්‍රය ගරු මන්ත්‍රීවරුන්ට ලබා දීමේ අවශ්‍යතාවය මත සභා ලේකම්තුමා තැපැල්පතිතුමා සමඟ සාකච්ඡා කර සභා න්‍යාය පත්‍රය හැකි ඉක්මණින් ගරු මන්ත්‍රීවරුන් වෙත ලබා දීමට අවශ්‍ය පියවර ගෙන තිබෙනවා. සමහර විට ඇතැම් මන්ත්‍රීවරුන්ට න්‍යාය පත්‍රය ලැබීමේ ප්‍රමාදයන් සිදු වී ඇත්නම් සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයෙන් න්‍යාය පත්‍රයේ අමතර පිටපතක් ලබා ගැනීමට හැකි බව කාරුණිකව දැනුම් දෙනවා.*

*ii*

*නව කාර්ය පටිපාටි රීති සංශෝධන පුස්තකයේ කාර්ය පටිපාටි රීති කාරක සභාවේ කාර්යභාරය අවසන් කොට, එහි සාකච්ඡා කොට එකඟ වූ සියලු සංශෝධන ඇතුළත් නව කාර්ය පටිපාටි රීති සංශෝධන පුස්තකය අද දින ගරු මන්ත්‍රීවරුන්ට ලැබීමට සලස්වා ඇත.*

*එම පුස්තකය පිළිබඳව සාකච්ඡාමය වැඩමුළුවක් කොළඹ 07 හි පිහිටි ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී 2017 ජූලි මස 28 වන සිකුරාදා දින පෙ.ව. 9.30 ට ආරම්භ කිරීමට කටයුතු සංවිධානය කර ඇත.*

*ඒ අනුව එකී වැඩමුළුවෙන් පසුව එම සංශෝධන ඇතුළත් නව රීති පුස්තකය සභාවේ අනුමැතියට ඉදිරිපත් කරන අතර, අද දින ගරු ඔබතුමන්ලා වෙත ලබා දෙන රීති පුස්තකය මැනවින් අධ්‍යයනය කොට, වැඩමුළුවේදී සාකච්ඡාවට පහසු වන පරිදි ගරු ඔබතුමන්ලා හඳුනාගත් නව රීති හෝ සංශෝධන රීති ජූලි මස 18 දිනට පෙර සභා ලේකම් වෙත ලැබෙන්න සලස්වන මෙන් ඉල්ලන අතර,*

*2017 ජූලි 28 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ පැවැත්වීමට නියමිත එකී වැඩමුළුවට සහභාගී වන මෙන් ගෞරවයෙන් යුතුව ආරාධනා කරමි.*

# කාරක සභා වාර්තා

## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2017.06.21 වැනි දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තා මම ගරු ඔබතුමන්ලා වෙත පිළිගන්වනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්** [ශ්‍රීනාත් ම. පෙරේරා කාරක සභා ගරු සභාපති වෙනුවෙන් ]
Hon. K.D. Aruna Deepal [On Behalf of Hon.Chairman of the Committee, Srinath M. Perera]

ගරු සභාපතිතුමනි, 2017.06.21 වැනි දින පැවති ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

# පෙත්සම්

PETITIONS

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු සභාපතිතුමනි, කල්එළිය, දූමුන්නේ ගෙදර, සියඹලාගහ වත්ත, අංක 481 හි පදිංචි එස්.ඒ. සිරිසේන යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, පන්නිපිටිය, රුක්මලේ, දඹගහවත්ත, 03 වන මාවත, පන්සල පාර, අංක 87/F හි පදිංචි කේ. අබේනන්ද යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, ජා-ඇළ, උදම්මිට, අංක 36 හි පදිංචි නදුන් තුසිත ජයජීව ද සිල්වා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petitions Presented, ordered to refer to the Petitions committee*

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. විශේෂයෙන්ම අධ්‍යාපන ඇමතිතුමාට. මොකද, වරප්‍රසාද ප්‍රශ්නය අධ්‍යාපන ඇමතිතුමාට තමයි ඉදිරිපත් කරන්නේ. මොකද, අපි බලාපොරොත්තුවෙන් හිටියා, ඉල්ලීමක් කළා. දැන් පළමු වන වසරට ළමයි ගැනීම. බලාපොරොත්තු වුණේ, ප්‍රමුඛතා ලැයිස්තුවෙන් ගන්නවාය කියලා තමයි දැනුම් දීලා තිබුණේ. ඒ නිසා අපි ඒ ළමයින්ගේ ලේඛන කිසිවක් ඉදිරිපත් කළේ නැහැ. එහෙත් දැනට දැන ගන්නට ලැබිලා තිබෙනවා, එක් එක් මන්ත්‍රීවරුන්ට යම් යම් වරප්‍රසාද ලබා දීලා අඩු ලකුණු මට්ටමින් ඉන්න ළමයින්ව පළමු වන වසරේ පන්තිවලට දාන්න. ඒ නිසා ඒ ගැන ඔබතුමා මාර්ගයෙන් මම ඉදිරිපත් කරන්න කැමැතියි. මොකද, විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා මේකේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක් වශයෙන් මට ඒක පිළිගන්න අමාරුයි. ඔබතුමා වෙන පැහැදිලි කිරීමක් කරන්න.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

මම හිතන්නේ, අපේ පළාත් සභා මන්ත්‍රීවරුන්ගේත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒකේ එක මන්ත්‍රීවරයෙකුට -

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු සභාපතිතුමනි, ඒක වරප්‍රසාදයක් විධියට බලපානවා කියලා මම හිතනවා. මොකද, මේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒකට අවස්ථාව දුන්නා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ඒ නිසා මේ ගැන විශේෂයෙන්ම අවධානය යොමු කරලා, පොරොත්තු ලේඛනයෙන් ගන්නවා නම් හොඳයි. මට දැන් අදත් දැන ගන්නට ලැබුණා. එක්කෙනෙකුගෙන් ඇහුවාම කිව්වා, මට තුනක් දුන්නා. තව කෙනෙකුගෙන් ඇහුවාම දෙකක් දීලා තිබෙනවා. ඒ නිසා මේකේ ක්‍රමවේදයක් නැහැ. එහෙම දෙනවා නම්, ඔක්කොටම සමසේ දුන්නොත් හොඳයි. හැබැයි, මම නම් බලාපොරොත්තු වෙන්නේ එහෙම නොදී පොරොත්තු ලේඛනයෙන් ගන්නවා නම් වඩාත් උචිතයි කියලා මම දැනුවත් කරනවා. ඒක යෝග්‍යයි කියලා යෝජනා කරනවා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

යෝජනා විතරක් නොවෙයි. ගරු සභාපතිතුමනි, උත්තරයකුත් දෙන්නය කියන්න ගරු ඇමතිතුමාට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උත්තර දෙන්න බැහැ. එතුමාට උත්තර දෙන්න අවස්ථාව දෙන්න බැහැ.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

අපිත් බැණුම් අහනවා. මිනිස්සු තැන් තැන්වල අපට බණිනවා මේ ඉස්කෝල කථාවට. එක්කෝ ළමයි ටික දාන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ඉස්සෙල්ලාම ඔබතුමාගේ ආසනය මොක්කද කියන්න කෝ? මීළඟට ප්‍රශ්න ඉදිරිපත් කිරීමේ අවස්ථාව.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා. ගරු සභාපතිතුමනි, අද දවසේ ලංකාවේ පුවත්පත් සියල්ලේ පළ වෙලා තිබෙනවා. පළාත් සභාවත්, පළාත් පාලන ආයතනත් සතු වෙලා තිබෙන කසළ කළමනාකරණය කියන විෂය මධ්‍යම රජයේ අමාත්‍යාංශයක් විසින් පවරා ගත්තාය කියලා. ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 8 වන උප ලේඛනයේ 154 උ ව්‍යවස්ථාවට අනුව 4 (3) වගන්තියේ ඉතාම පැහැදිලිව කියලා තිබෙනවා, පළාත් පාලන ආයතන සතුව තිබෙන බලතල කුමක්ද කියන කාරණය. ගරු සභාපතිතුමනි, මේ සභාවේ ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කරලා, මේ සභාවේ අනුමැතිය අරගෙන ගරු ප්‍රධාන අමාත්‍යතුමා කසළ කළමනාකරණය සඳහා වූ ගිවිසුම් දෙකකට එළඹෙනු ලැබුවා. ඒ ගිවිසුම් දෙක එහෙම්මම තිබෙද්දී, ඒ ව්‍යාපෘති දෙක එහෙම්ම තිබෙද්දී, කසළ කළමනාකරණය පිළිබඳ සම්පූර්ණ බලය මධ්‍යම රජයේ අමාත්‍යාංශයක් විසින් පවරා ගෙන, පත්තරවල දැන්වීම් දාලා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පුවත්පත් නිවේදන පළ කරමින් තිබෙනවා. අපට ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු සභාපතිතුමනි, පළාත් පාලන මැතිවරණය ඉදිරියේ තිබිය යුතුව තිබෙනවා. මීට කලින් සැලසුම් අනුමත කිරීමේ බලය අමාත්‍යාංශය විසින් පවරා ගනු ලැබුවා. දැන් කසළ කළමනාකරණය පිළිබඳ බලය එහෙම්පිටින් පවරා ගෙන තිබෙනවා. නැවත පළාත් පාලන මැතිවරණ තියන කොට රොඩ්ඩක් සඳහා ද පළාත් පාලන මැතිවරණ තියන්න හදන්නේ කියන ප්‍රශ්නය අපට තිබෙනවා. ඒ නිසා කසළ කළමනාකරණය සම්බන්ධයෙන් පළාත් සභාවත්, ප්‍රාදේශීය සභාවත්, පළාත් පාලන ආයතනත් සතුව තිබෙන බලතල සම්බන්ධයෙන්, මේ උදුරා ගැනීම සම්බන්ධයෙන් - ඒ වාගේම ගිවිසුම් ගණනාවක් අත්සන් කළා මේ සභාවේ අනුමැතිය අරගෙන. ඒවාට මොනවාද වෙන්නේ කියන කාරණය සම්බන්ධයෙනුත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා හරහා මේ සභාව දැනුවත් කරන්න. පැහැදිලි කිරීමක් කරන්න කියන ඉල්ලීම කරමින්, අපේ බලතල, පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ බලතල මේ හරහා උල්ලංඝනය වෙනවා කියන කාරණය යටතේ අපට පැහැදිලි කිරීමක් කරලා දෙන්නය කියන ඉල්ලීම කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අවස්ථාව අපේ න්‍යාය පත්‍රයේ තිබෙනවා. එහිදී මම හිතන්නේ, එතුමා උත්තරයක් දෙයි. දැන් කාලය දෙන්න බැහැ.

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගේ නමින් යුත් ප්‍රශ්නය ගරු අමාත්‍යතුමාට යොමු කිරීමට අවස්ථාව. ගරු මන්ත්‍රීතුමිය සභාවේ නැහැ. ගරු අමාත්‍යතුමා, පිළිතුරු තිබෙනවා නම් සභාගත කරන්න.

**ගරු ලලිත් වනිගරත්න** (මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

ගරු සභාපතිතුමනි, පිළිතුර සභාගත කරනවා.

** [සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

## 01.

**රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය: (ප්‍ර/vi(1)/17/56)**

*ප්‍රශ්නය :*

*අ. කොළඹ දිස්ත්‍රික්කය තුළ පෞද්ගලික බස් ධාවනයට අදාළව පාරවල් සඳහා අලුතෙන් බස් රථ යෙදවීමට අවස්ථා කීයකදී ටෙන්ඩර් කැඳවන ලද්දේද?*

*පිළිතුර :*

*අ. 2015 වසරේ සිට අවස්ථා 05 කදී ටෙන්ඩර් කැඳවා ඇත.*

*ප්‍රශ්නය :*

*ආ. ඒ කුමන ධාවන අංක සහිත පාරවල් සඳහාද? එකී ටෙන්ඩරයන්ට අනුව ඉදිරිපත් වී ඇති පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම් සහ මිල ගණන් වෙන් වෙන්ව සඳහන් කරන්නේද?*

*පිළිතුර :*

*ආ. කොළඹ දිස්ත්‍රික්කය සඳහා අලුතෙන් බස් රථ යෙදවූ මාර්ග හා එකී ටෙන්ඩරයන්ට ඉදිරිපත් කර ඇති පුද්ගලයින්ගේ හා ආයතනවල මිල ගණන් ඇමුණුම 01[1] මගින් ඉදිරිපත් කරමි.*

*ප්‍රශ්නය :*

*ඇ. එම ටෙන්ඩර් වලංගු වන්නේ වසර කීයක් සඳහාද?*

*පිළිතුර :*

*ඇ. ටෙන්ඩර් මගින් බලපත්‍ර ලබා දුන් පසු එම බලපත්‍රය ඊට අදාළ නියමයන් හා කොන්දේසිවලට යටත්ව මගී ප්‍රවාහන සේවා පවත්වාගෙන යන තෙක් වලංගු වේ.*

[1] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

*ප්‍රශ්නය :*

*ඈ. එම ටෙන්ඩර් මණ්ඩලවල සාමාජිකයන්ගේ නම් හා තනතුරු මොනවාද?*

*පිළිතුර :*

*ඈ. සාමාන්‍යාධිකාරී - කේ.ජී. රුවන්ක මනුජිත්*
*නි/සාමාන්‍යාධිකාරී (ධාවන) - ඩබ්ලිව්.එම්.අයි.කේ. විජේරත්නායක*
*ගණකාධිකාරී - ප්‍රාර්ථනා ෆොන්සේකා*

*ප්‍රශ්නය :*

*ඉ. බස් රථ ප්‍රමාණය අතිරික්ත වීම හේතුවෙන් දිනකට ඇතැම් බස් රථ ධාවනයෙන් ඉවත් කර තිබේද?*

*පිළිතුර :*

*ඉ. බස් රථ අතිරික්ත වීම හේතුවෙන් බස් රථ ධාවනයෙන් ඉවත් කර ඇති මාර්ග පවතී.*

*ප්‍රශ්නය :*

*ඊ. අතිරික්ත බස් තිබෙන පාරවල් සඳහා නැවත ටෙන්ඩර් කැඳවා බස් රථ යෙදවීම නීත්‍යානුකූලද?*

*පිළිතුර :*

*ඊ. පුරප්පාඩුව පවතින මාර්ග සඳහා ටෙන්ඩර් කැඳවා බලපත්‍ර ලබා දීම සිදු කර ඇත.*

*ප්‍රශ්නය :*

*උ. පාරවල් සඳහා බස් රථ ඇතුළත් කිරීමට අධිකරණ නියෝගයකින් යම් ප්‍රමිතියක් හඳුන්වා දී ඇත්තේද?*

*පිළිතුර :*

*උ. අධිකරණ නියෝගයකින් ප්‍රමිතියක් හඳුන්වා දී නොමැති අතර අංක 1488/32 – 2007.03.16 දින ගැසට් නිවේදනයට අනුව මාර්ග සඳහා බස් රථ ඇතුළත් කිරීමට කටයුතු කරනු ලබයි.*

*ප්‍රශ්නය :*

*ඌ. මෙම ටෙන්ඩර් කැඳවීම්වලදී අතයට ගනුදෙනු සිදු වී ඇත්තේද?*

පිළිතුර :

ඌ. එසේ අතයට ගනුදෙනු සිදු වී ඇති බව වාර්තා වී නොමැත.

ප්‍රශ්නය :

එ. මෙලෙස ටෙන්ඩර් කැඳවූ බස් රථ මේ වන විට ධාවනයේ යෙදෙන්නේද?

පිළිතුර :

එ. ධාවනය වේ. එහෙත් යම් යම් අවස්ථාවලදී විවිධ හේතු මත අඛණ්ඩව ධාවනය නොවූ අවස්ථා වාර්තා වී ඇත.

ප්‍රශ්නය :

ඒ. නොඑසේ නම් ඒ මන්ද?

පිළිතුර :

ඒ. අදාළ නොවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අංක 02 ප්‍රශ්නයත් එතුමියගේමයි.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, පිළිතුර සභාගත කරනවා.

*** [සභාගත කරන ලද පිළිතුර]**
*[Tabled Answer]*

**02.**

**රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය: (ප්‍ර/vi(1)/17/57)**

ප්‍රශ්නය :

අ. කළුතර දිස්ත්‍රික්කය තුළ පෞද්ගලික බස් ධාවනයට අදාළව පාරවල් සඳහා අලුතෙන් බස් රථ යෙදවීමට අවස්ථා කීයකදී ටෙන්ඩර් කැඳවන ලද්දේද?

පිළිතුර :

අ. 2015 වසරේ සිට අවස්ථා 05 කදී ටෙන්ඩර් කැඳවා ඇත.

ප්‍රශ්නය :

ආ. ඒ කුමන ධාවන අංක සහිත පාරවල් සඳහාද? එකී ටෙන්ඩරයන්ට අනුව ඉදිරිපත් වී ඇති පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම් සහ මිල ගණන් වෙන් වෙන්ව සඳහන් කරන්නේද?

පිළිතුර :

ආ. කළුතර දිස්ත්‍රික්කය සඳහා අලුතෙන් බස් රථ යෙදවූ මාර්ග හා එකී ටෙන්ඩරයන්ට ඉදිරිපත්ව ඇති පුද්ගලයන්ගේ හා ආයතනවල මිල ගණන් ඇමුණුම 01[2] මගින් ඉදිරිපත් කරමි.

ප්‍රශ්නය :

ඇ. එම ටෙන්ඩර් වලංගු වන්නේ වසර කියක් සඳහාද?

පිළිතුර :

ඇ. ටෙන්ඩර් මගින් බලපත්‍ර ලබා දුන් පසු එම බලපත්‍රය ඊට අදාළ නියමයන් හා කොන්දේසිවලට යටත්ව මගී ප්‍රවාහන සේවා පවත්වාගෙන යන තෙක් වලංගු වේ.

ප්‍රශ්නය :

ඈ. එම ටෙන්ඩර් මණ්ඩලවල සාමාජිකයන්ගේ නම් හා තනතුරු මොනවාද?

පිළිතුර :

ඈ. සාමාන්‍යාධිකාරී - කේ.ජී. රුවන්ක මනුජිත්
නි/සාමාන්‍යාධිකාරී (ධාවන) - ඩබ්ලිව්.එම්.අයි.කේ. විජේරත්නායක
ගණකාධිකාරී - ප්‍රාර්ථනා ෆොන්සේකා

ප්‍රශ්නය :

ඉ. බස් රථ ප්‍රමාණය අතිරික්ත වීම හේතුවෙන් දිනකට ඇතැම් බස් රථ ධාවනයෙන් ඉවත් කර තිබේද?

පිළිතුර :

ඉ. බස් රථ අතිරික්ත වීම හේතුවෙන් ධාවනයෙන් ඉවත් කර ඇති මාර්ග පවතී.

[2] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

*ප්‍රශ්නය :*

*ඊ. අතිරික්ත බස් තිබෙන පාරවල් සඳහා නැවත ටෙන්ඩර් කැඳවා බස් රථ යෙදවීම නීත්‍යානුකූලද?*

*පිළිතුර :*

*ඊ. පුරප්පාඩු පවතින මාර්ග සඳහා ටෙන්ඩර් කැඳවා බලපත්‍ර ලබා දීම සිදු කර ඇත.*

*ප්‍රශ්නය :*

*උ. පාරවල් සඳහා බස් රථ ඇතුළත් කිරීමට අධිකරණ නියෝගයකින් යම් ප්‍රමිතියක් හඳුන්වා දී ඇත්තේද?*

*පිළිතුර :*

*උ. අධිකරණ නියෝගයකින් ප්‍රමිතියක් හඳුන්වා දී නොමැති අතර අංක 1488/32 – 2007.03.16 දින ගැසට් නිවේදනයට අනුව මාර්ග සඳහා බස් රථ ඇතුළත් කිරීමට කටයුතු කරනු ලබයි.*

*ප්‍රශ්නය :*

*ඌ. මෙම ටෙන්ඩර් කැඳවීම්වලදී අතයට ගනුදෙනු සිදු වී ඇත්තේද?*

*පිළිතුර :*

*ඌ. එසේ අතයට ගනුදෙනු සිදු වී ඇති බව වාර්තා වී නොමැත.*

*ප්‍රශ්නය :*

*එ. මෙලෙස ටෙන්ඩර් කැඳවූ බස් රථ මේ වන විට ධාවනයේ යෙදෙන්නේද?*

*පිළිතුර :*

*එ. ධාවනය වේ. එහෙත් යම් යම් අවස්ථාවලදී විවිධ හේතු මත අඛණ්ඩව ධාවනය නොවූ අවස්ථා වාර්තා වී ඇත.*

*ප්‍රශ්නය :*

*ඒ. නොඑසේ නම් ඒ මන්ද?*

*පිළිතුර :*

*ඒ. අදාළ නොවේ.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

03 වන ප්‍රශ්නයත් එතුමියගේමයි.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, පිළිතුර සභාගත කරනවා.

** [සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

**03.**

**රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/58)**

*ප්‍රශ්නය :*

*අ. ප්‍රවාහන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ තනතුරු කීයක් පුරප්පාඩු වී ඇත්තේද?*

*පිළිතුර :*

*අ. තනතුරු 08 ක් පුරප්පාඩුව පවතී.*

*ප්‍රශ්නය :*

*ආ. ඒ කවදා සිටද?*

*පිළිතුර :*

*ආ.*

| අනු අංකය | තනතුර | පුරප්පාඩු වූ දිනය |
|---|---|---|
| 01. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) | 2016.07.01 |
| 02. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) | 2016.04.26 |
| 03. | කළමනාකරු (පාලන) | 2016.06.23 |
| 04. | ගිණුම් නිලධාරී | 2014.01.01 |
| 05. | පොත් තබන්නා | 2014.01.23 |
| 06. | විදුහල්පති (මධ්‍යම පුහුණු පාසල) | තනතුරු පිහිටුවන ලද 2013 වර්ෂයේ සිට |
| 07. | කළමනාකරු (පර්යේෂණ, පුහුණු) | |
| 08. | තොරතුරු තාක්ෂණ නිලධාරී | - |

*සටහන - කළමනාකරු (ධාවන) තනතුර දැරූ නිලධාරියාට එරෙහිව විධිමත් විනය පරීක්ෂණයක් හේතුවෙන් වැඩ තහනම් කර ඇත.*

ප්‍රශ්නය :

ඇ. ඒ සඳහා වැඩ බැලීමට පත් කරන ලද පුද්ගලයන්ගේ නම් සහ තනතුරු මොනවාද?

පිළිතුර :

ඇ.

| අනු අංකය | නම | නියත තනතුර | වැඩ බලන තනතුර |
|---|---|---|---|
| 01. | අසෝක වික්‍රමනායක මයා | ප්‍රාදේශීය කළමනාකරු | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) |
| 02. | ප්‍රසන්න මඩවල මයා | ප්‍රාදේශීය කළමනාකරු | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) |
| 03. | එච්. නිමල් රත්නායක මයා | පරිපාලන නිලධාරී (පාලන) | කළමනාකරු (පාලන) |
| 04. | පී.ඒ.එස්. පෙරේරා මයා | පරිපාලන නිලධාරී (ධාවන) | කළමනාකරු (ධාවන) |
| 05. | පී.කේ.ඒ. අබේසූරිය මිය | පොත් තබන්නා | ගිණුම් නිලධාරී |
| 06. | සමීරා උදයංගනී මෙනවිය | කළමනාකරණ සහකාර | පොත් තබන්නා |

ප්‍රශ්නය :

ඈ. එම වැඩ බැලීම් වෙනුවෙන් එක් එක් පුද්ගලයා වෙත අතිරේකව ගෙවනු ලබන දීමනා වෙන් වෙන්ව සඳහන් කරන්නේද?

පිළිතුර :

ඈ.

| අනු අංකය | නම | තනතුර | මාසිකව ගෙවනු ලබන දීමනාව |
|---|---|---|---|
| 01. | අසෝක වික්‍රමනායක මයා | ප්‍රාදේශීය කළමනාකරු | 9,632.50 |
| 02. | ප්‍රසන්න මඩවල මයා | ප්‍රාදේශීය කළමනාකරු | 9,632.50 |
| 03. | එච්. නිමල් රත්නායක මයා | පරිපාලන නිලධාරී (පාලන) | 6,410.00 |
| 04. | පී.ඒ.එස්. පෙරේරා මයා | පරිපාලන නිලධාරී (ධාවන) | 6,410.00 |
| 05. | පී.කේ.ඒ. අබේසූරිය මිය | පොත් තබන්නා | 5,131.25 |
| 06. | සමීරා උදයංගනී මෙනවිය | කළමනාකරණ සහකාර | - |

ප්‍රශ්නය :

ඉ. මෙම පුරප්පාඩු පිරවීමකින් තොරව පුද්ගලයන් වැඩ බැලීමට යොදවා අතිරේක දීමනා ගෙවන්නේ පෞද්ගලික හිතවත්කම් මතද?

පිළිතුර :

ඉ. පෞද්ගලික හිතවත්කම් මත අතිරේක දීමනා නොගෙවයි.

ප්‍රශ්නය :

ඊ. මෙම වැඩ බැලීම් සිදු කිරීම නවත්වා එකී තනතුරුවලට ආයතනය තුළ සිටින සුදුස්සන් හෝ පිටතින් පුද්ගලයන් බඳවා නොගන්නේ මන්ද?

පිළිතුර :

ඊ. තොරතුරු තාක්ෂණ නිලධාරී තනතුරු, ගිණුම් නිලධාරී තනතුරු, විදුහල්පති (මධ්‍යම පුහුණු පාසල) සහ කළමනාකරු (පර්යේෂණ හා පුහුණු) තනතුරු සඳහා බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ මේ වන විට අවසන් කර ඇති අතර, කඩිනමින් ඒ සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින් බඳවා ගන්නා ලෙසට උපදෙස් ලබා දී ඇත.

ප්‍රශ්නය :

උ. තනතුරු දෙකක වැඩ කිරීමේදී කාර්යගුරුව එකී කාර්යයන් ඉටු කිරීම අපහසු වන බවත්, එමඟින් මහජනයාට විධිමත් සේවාවන් සැපයීමක් කළ නොහැකි බවත් ඔබතුමා පිළිගන්නේද?

පිළිතුර :

උ. ඔව්.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) සහ කළමනාකරු (පාලන) යන තනතුරුවල වැඩ බලන නිලධාරීන් පූර්ණ කාලීනව එම තනතුරේ පමණක් කටයුතු කිරීම පවරා ඇත. ඔවුන්ගේ මුල් තනතුරු සඳහා දීමනාවකින් තොරව වැඩ ආවරණය කිරීම සඳහා නිලධාරීන් පත් කර ඇත.

ප්‍රශ්නය :

ඌ. අමාත්‍යාංශයේ සම්පූර්ණ වැඩ බැලීම් තනතුරු සඳහා දීමනා ගෙවීමට මාසිකව අතිරේකව වැය කරන සම්පූර්ණ මුදල කොපමණද?

පිළිතුර :

ඌ. ප්‍රශ්නය අපැහැදිලියි. (මෙමගින් අපේක්ෂා කරනුයේ අමාත්‍යාංශයට අයත් සියලුම ආයතනයන් ද මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ පමණක්ද?)

*ප්‍රශ්නය :*

*එ. පාඩු ලබමින් සහ රජයෙන් දීමනා ලබමින් ධාවනය වන ශ්‍රී ලංගම සේවාවන්ට වඩා වැඩි බස් රථ ප්‍රමාණයක් තමන්ගේම වියදමින් සියලු කටයුතු සිදු කර ගෙන රජයටද ආදායමක් ලබා දී ධාවනයේ යෙදෙන පෞද්ගලික බස් රථ ධාවකයන්ට වඩා යහපත් සේවාවක් ලබා දීමට හැකි වන ලෙස ඔබ අමාත්‍යාංශයේ පවතින දුර්වලතා/අඩුපාඩු නිවැරදි කිරීමට ඔබතුමා පියවර ගන්නේද?*

*පිළිතුර :*

*එ. ගරු මන්ත්‍රීතුමන්ලා විසින් පෙන්වා දෙනු ලබන අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.*

*ප්‍රශ්නය :*

*ඒ. නොඑසේ නම් ඒ මන්ද?*

*පිළිතුර :*

*ඒ. අදාළ නැත.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 04 යටතේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

* *[කල් ගන්නා ලද ප්‍රශ්නය ]*
*[Adjourned Question]*

**04.**

**ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/59)**

අ. 2015 සිට 2017 ජූනි 06 දක්වා කැස්බෑව නගර සභාව විසින් කරන ලද මාර්ග සංවර්ධන ව්‍යාපෘති ගණන කීයද?

ආ. එම සියලු මාර්ග සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධව,

i. ව්‍යාපෘතියේ නම,
ii. ප්‍රතිපාදන මූලාශ්‍රය,
iii. ඇස්තමේන්තු මුදල,
iv. ව්‍යාපෘතිය ප්‍රදානය කළේ ටෙන්ඩර් මගින්ද වෙනත් ක්‍රමයක් මගින්ද යන වග,
v. අවසාන වශයෙන් කොන්ත්‍රාත්තුව තීරණය වූ මුදල,
vi. ව්‍යාපෘතිය කළ අයගේ නම හා ලිපිනය,
vii. වැඩ පටන් ගත් දිනය,
viii. වැඩ අවසන් කළ දිනය,
ix. ගෙවීම් කර අවසන් නම් එම දිනය,

යන තොරතුරු ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කරන්නේද?

ඇ. මහජන නියෝජිත පාලනයක් නැති තත්ත්වයක් තුළ නගර සභාවේ ප්‍රතිපාදන යොදවා කරන ව්‍යාපෘති කවරේද යන්න තීරණය කරන්නේ කවුරුන්ද?

ඈ. සංවර්ධනය නොකළ එහෙත් සංවර්ධන කළ යුතු මාර්ග ඇති බව ඔබතුමා දන්නේද?

ඉ. ප්‍රමුඛතාවය අනුව හඳුනාගත් මාර්ග සංවර්ධනයට වැඩ පිළිවෙළක් තිබේද?

ඊ. ඉදිරියේ සංවර්ධනය කළ යුතු මාර්ග පිළිබඳ ප්‍රමුඛතාවය අනුව නම් කළ හැකිද?

උ. ඒ අනුව මාර්ග පිළිබඳව ලේඛනයක් ඉදිරිපත් කරන්නේද?

ඌ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

අ. 284 යි.

ආ. ඔව්. X5[3] වශයෙන් වූ වාර්තාවට ඇතුළත් කර ඉදිරිපත් කරමි.

ඇ. නගර සභා ආඥා පනතේ 184 අ වගන්තියෙහි විධිවිධාන අනුව නගර සභාවේ ලේකම් විසින් ය.

ඈ. ඔව්.

ඉ. 2017 වර්ෂයෙහි කැස්බෑව නගර සභා අරමුදලට අදාළව අයවැය ලේඛනයෙහි මාර්ග සංවර්ධනය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමේදී සංවර්ධන ප්‍රමුඛතාවය සඳහා මාර්ග හඳුනා ගැනීමක් සිදු කර ඇත.

ඊ. 2017 වර්ෂයෙහි කැස්බෑව නගර සභා අරමුදලට අදාළව අයවැය ලේඛනයට අනුව සංවර්ධන ප්‍රමුඛතාව සඳහා හඳුනාගත් මාර්ග නම් කළ හැකිය.

උ. X 6[4] වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරමි.

ඌ. පැන නොනගී.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 05 යටතේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ප්‍රශ්නය යොමු කරනවා.

* *[කල් ගන්නා ලද ප්‍රශ්නය ]*
*[Adjourned Question]*

**05.**

**ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/60)**

අ. 2015 සිට 2017 ජුනි 06 දක්වා බොරලැස්ගමුව නගර සභාව විසින් කරන ලද මාර්ග සංවර්ධන ව්‍යාපෘති ගණන කීයද?

ආ. එම සියලු මාර්ග සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධව,

i. ව්‍යාපෘතියේ නම,
ii. ප්‍රතිපාදන මූලාශ්‍රය,
iii. ඇස්තමේන්තු මුදල,
iv. ව්‍යාපෘතිය ප්‍රදානය කළේ ටෙන්ඩර් මගින්ද වෙනත් ක්‍රමයක් මගින්ද යන වග,
v. අවසාන වශයෙන් කොන්ත්‍රාත්තුව තීරණය වූ මුදල,
vi. ව්‍යාපෘතිය කළ අයගේ නම හා ලිපිනය,
vii. වැඩ පටන් ගත් දිනය,
viii. වැඩ අවසන් කළ දිනය,
ix. ගෙවීම් කර අවසන් නම් එම දිනය,

යන තොරතුරු ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කරන්නේද?

ඇ. මහජන නියෝජිත පාලනයක් නැති තත්ත්වයක් තුළ නගර සභාවේ ප්‍රතිපාදන යොදවා කරන ව්‍යාපෘති කවරේද යන්න තීරණය කරන්නේ කවුරුන්ද?

ඈ. සංවර්ධනය නොකළ එහෙත් සංවර්ධන කළ යුතු මාර්ග ඇති බව ඔබතුමා දන්නේද?

ඉ. ප්‍රමුඛතාවය අනුව හඳුනාගත් මාර්ග සංවර්ධනයට වැඩ පිළිවෙළක් තිබේද?

ඊ. ඉදිරියේ සංවර්ධනය කළ යුතු මාර්ග පිළිබඳ ප්‍රමුඛතාවය අනුව නම් කළ හැකිද?

උ. ඒ අනුව මාර්ග පිළිබඳව ලේඛනයක් ඉදිරිපත් කරන්නේද?

ඌ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අ. 112 යි.

ආ. ඔව්. X3[5] වශයෙන් වූ වාර්තාවට ඇතුළත් කර ඉදිරිපත් කරමි.

ඇ. නගර සභා ආඥා පනතේ 184 අ වගන්තියෙහි විධිවිධාන අනුව නගර සභාවේ ලේකම් විසින් ය.

[3] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.
[4] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.
[5] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

ඈ. ඔව්.

ඉ. 2017 වර්ෂයෙහි බොරලැස්ගමුව නගර සභා අරමුදලට අදාළව අයවැය ලේඛනයෙහි මාර්ග සංවර්ධනය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමේදී සංවර්ධන ප්‍රමුඛතාවය සඳහා මාර්ග හඳුනා ගැනීමක් සිදු කර ඇත.

ඊ. 2017 වර්ෂයෙහි බොරලැස්ගමුව නගර සභා අරමුදලට අදාළ අයවැය ලේඛනයට අනුව සංවර්ධන ප්‍රමුඛතාව සඳහා හඳුනාගත් මාර්ග නම් කළ හැකිය.

උ. X4[6] වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරමි.

ඌ. පැන නොනගී.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අංක 06 ප්‍රශ්නය යොමු කිරීමට අවස්ථාව.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ප්‍රශ්නය යොමු කරනවා.

* *[කල් ගන්නා ලද ප්‍රශ්නය ]*
*[Adjourned Question]*

**06.**

**ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/61)**

අ. 2015 සිට 2017 ජූනි 06 දක්වා මහරගම නගර සභාව විසින් කරන ලද මාර්ග සංවර්ධන ව්‍යාපෘති ගණන කීයද?

ආ. එම සියලු මාර්ග සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධව,

i. ව්‍යාපෘතියේ නම,
ii. ප්‍රතිපාදන මූලාශ්‍රය,
iii. ඇස්තමේන්තු මුදල,
iv. ව්‍යාපෘතිය ප්‍රදානය කළේ ටෙන්ඩර් මගින්ද වෙනත් ක්‍රමයක් මගින්ද යන වග,
v. අවසාන වශයෙන් කොන්ත්‍රාත්තුව තීරණය වූ මුදල,
vi. ව්‍යාපෘතිය කළ අයගේ නම හා ලිපිනය,
vii. වැඩ පටන් ගත් දිනය,
viii. වැඩ අවසන් කළ දිනය,
ix. ගෙවීම් කර අවසන් නම් එම දිනය,

යන තොරතුරු ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කරන්නේද?

ඇ. මහජන නියෝජිත පාලනයක් නැති තත්ත්වයක් තුළ නගර සභාවේ ප්‍රතිපාදන යොදවා කරන ව්‍යාපෘති කවරේද යන්න තීරණය කරන්නේ කවුරුන්ද?

ඈ. සංවර්ධනය නොකළ එහෙත් සංවර්ධන කළ යුතු මාර්ග ඇති බව ඔබතුමා දන්නේද?

ඉ. ප්‍රමුඛතාවය අනුව හඳුනාගත් මාර්ග සංවර්ධනයට වැඩ පිළිවෙළක් තිබේද?

ඊ. ඉදිරියේ සංවර්ධනය කළ යුතු මාර්ග පිළිබඳ ප්‍රමුඛතාවය අනුව නම් කළ හැකිද?

උ. ඒ අනුව මාර්ග පිළිබඳව ලේඛනයක් ඉදිරිපත් කරන්නේද?

ඌ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

අ. 625 යි.

ආ. ඔව්. X1[7] වශයෙන් වූ වාර්තාවට ඇතුළත් කර ඉදිරිපත් කරමි.

ඇ. නගර සභා ආඥා පනතේ 184 අ වගන්තියෙහි විධිවිධාන අනුව නගර සභාවේ ලේකම් විසින් ය.

ඈ. ඔව්.

ඉ. 2017 වර්ෂයෙහි මහරගම නගර සභා අරමුදලට අදාළව අයවැය ලේඛනයෙහි මාර්ග සංවර්ධනය

[6] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

[7] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමේදී සංවර්ධන ප්‍රමුඛතාවය සඳහා මාර්ග හඳුනා ගැනීමක් සිදු කර ඇත.

ඊ. 2017 වර්ෂයෙහි මහරගම නගර සභා අරමුදලට අදාළ අයවැය ලේඛනයට අනුව සංවර්ධන ප්‍රමුඛතාව සඳහා හඳුනාගත් මාර්ග නම් කළ හැකිය.

උ. X2[8] වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරමි.

ඌ. පැන නොනගී.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 07 යටතේ මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

* *[කල් ගන්නා ලද ප්‍රශ්නය ]*
*[Adjourned Question]*

**07.**

**මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/62)**

අ. බස්නාහිර පළාතේ අඩු ආදායම්ලාභී පාසල් දරුවන් සඳහා නොමිලේ සපත්තු ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළේද?

ආ. ඒ සඳහා මුදල් ප්‍රතිපාදන කොපමණ වැය කළාද?

ඇ. එම මුදල් ලබා දුන්නේ පළාත් සභා අරමුදල්වලින්ද?

ඈ. සපත්තු මිලදී ගැනීමේදී සැපයුම්කරුවන් තෝරා ගත්තේ කෙසේද?

[8] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

ඉ. ඒ සඳහා සැපයුම්කරුවන් කී දෙනෙකු ඉදිරිපත් වූවාද?

ඊ. සපත්තු ලබා දීමට තෝරා ගත් ආයතනය කුමක්ද?

උ. සපත්තු මිලදී ගැනීම සඳහා පළාත් පාලන ආයතන අරමුදල් කොපමණ ලබා ගත්තේද?

ඌ. බස්නාහිර පළාතේ තෝරා ගත් සිසුන්ට සපත්තු ලබා දී අවසන්ද?

එ. සපත්තු ලබා දීම සඳහා කොපමණ මුදලක් වැය කළාද?

ඒ. කැලණිය අධ්‍යාපන කලාපයේ අඩු ආදායම්ලාභී සිසුන් කී දෙනෙකුට සපත්තු ලබා දී ඇත්ද?

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

අ. ඔව්.

ආ. දැනට වැය කර ඇති හා ඉදිරියේදී වැය කිරීමට නියමිත සම්පූර්ණ මුදල රු. 106,018,082.02 කි.

ඇ. අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතන වෙත පළාත් සභා අරමුදලින් රු. 48,380,000.00 මුදලක් ලබා දී ඇති අතර, ඉතිරි මුදල් ඒ ඒ පළාත් පාලන ආයතන අරමුදලින් දරා ඇත.

ඈ. බස්නාහිර පළාත් පාලන කොමසාරිස් විසින් පුවත්පත් මගින් දැන්වීම් පළ කර ටෙන්ඩර් කැඳවා, බස්නාහිර පළාත් ප්‍රසම්පාදන කාර්යය පටිපාටියට අනුව, ප්‍රසම්පාදන කමිටු නිර්දේශ පරිදි සැපයුම්කරුවෙකු තෝරා ගන්නා ලදී.

ඉ. හත් දෙනෙකු පමණි.

ඊ. Bata shoe company of Ceylon Ltd.

උ. ඒ ඒ පළාත් පාලන ආයතන විසින් මිලදී ගැනීමට යෙදුණු සපත්තු ප්‍රමාණය මත සැපයුම්කරු වෙත ඒ ඒ පළාත් පාලන ආයතන විසින් මුදල් ගෙවා ඇති අතර, පළාත් පාලන ආයතන වෙතින් මුදල් අමාත්‍යාංශය වෙත ලබා ගැනීමක් සිදු කර නොමැත.

ඌ. එම කාර්යය මේ වන විට අවසන් වී ඇත.

එ. දැනට වැය කර ඇති හා ඉදිරියේදී වැය කිරීමට නියමිත සම්පූර්ණ මුදල රු. 106,018,082.02 කි.

ඒ. කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි අඩු ආදායම්ලාභී පවුල්වලට අදාළ සිසුන් 1072 කට සපත්තු ලබා දී ඇත.

*** [පසුබිම් වාර්තාව]**
*[Background Report]*

*බස්නාහිර පළාත තුළ අඩු ආදායම්ලාභී පවුල්වල පාසල් දරුවන් සඳහා පාවහන් යුගලක් ලබා දීම සඳහා වූ වැඩ සටහනක් පළාත් පාලන ආයතන මට්ටමින් ක්‍රියාත්මක කරන ලදී. පළාත් පාලන ආයතන විසින් ස්වකීය අරමුදල් යොදවා වාර්ෂිකව පාසල් සිසුන් සඳහා පාසල් පොත් ලබා දීම ආදී නිසි ඇගයීමකින් තොරව, එතෙක් ක්‍රියාත්මක කරන්නට යෙදුණු වැඩ සටහන් වෙනුවට මෙවැනි වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම යෝග්‍ය බවට බස්නාහිර පළාතේ පළාත් පාලන විෂයයභාර අමාත්‍යවරයා වශයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් තීරණය කරන ලදුව එවැනි වැඩ සටහනක් පළාත් පාලන ආයතන මට්ටමින් ක්‍රියාත්මක විය.*

*බස්නාහිර පළාතේ සියලුම පළාත් පාලන ආයතන විසින් පාසල් පාවහන් යුගලක් අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට ලබා දීම උදෙසා දරන්නට වූ ඉදිරියේදී වැය කරන්නට වූ සම්පූර්ණ මුදල රුපියල් එකසිය හය මිලියන දහඅට දහස් අසූ දෙකයි ශත දෙකකි. එම මුදලින් රුපියල් හාරසිය අසූ තුන් ලක්ෂ අසූදහසක මුදලක් පළාත් සභා අරමුදලින් අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතන වෙත පාවහන් මිලදී ගැනීම වෙනුවෙන් ප්‍රධාන වශයෙන් ලබා දී ඇත.*

*විශේෂයෙන් ප්‍රශ්නගත කරුණ හා සම්බන්ධයෙන් කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාළව සිසුන් එක්දහස් හැත්තෑ දෙදෙනෙකුට (1072) සපත්තු ලබා දීම සිදු කර ඇති බව කාරුණිකව පෙන්වා දෙමි.*

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, මම අතුරු ප්‍රශ්නයක් අහනවා, තෝරා ගත් සැපයුම්කරු දැනට සියලුම සපත්තු සපයා අවසන් වී ඇත්ද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

වාර්තා වන අන්දමට සපයා තිබෙනවා.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු සභාපතිතුමනි, දෙවැනි ප්‍රශ්නය. මේ සපත්තු ලබා දීමේ වැඩ පිළිවෙළ ඉතාමත්ම හොඳ වැඩ පිළිවෙළක්. ඒ එක්කම මේ සපත්තු ලබා දීමේදී අපි ප්‍රායෝගිකව දැක්කා, සමහර ශිෂ්‍යයින්ට මේ සපත්තු දාන්න බැහැ. එක්කෝ කොටයි. එක්කෝ දිගයි. මම හිතන්නේ, මේක ඔබතුමාගේ මුල්ම ක්‍රියාමාර්ගය නිසා අඩුපාඩු තිබෙන්න ඇති. නමුත් ඉදිරියට මේ සපත්තු දාන්න බැරි ශිෂ්‍යයින්ට ඒ සපත්තු මාරු කරලා දෙනවාද? නැත්නම් ඒ ළමයින්ට ඒවා ගෙදර තියා ගෙන ඉන්න වෙනවා. ඒ පිළිබඳව -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

සාමාන්‍යයෙන් ඒ පළාත් පාලන ආයතනවලට උපදෙස් දීලාම තිබෙනවා. ඒගොල්ලන්ගේ කිට්ටුම ආයතනවලට ගිහිල්ලා මාරු වීම් කර ගන්නය කියලා. ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, මේක අපේ මූලික ව්‍යාපෘතියක් නිසා ගැටළු ඇති වුණා. එකක් තමයි, දැන් ඉල්ලුම් කරපු ආයතන සූදානම් වෙලා හිටියේ එක පාට එකක්. 6,8,9 වාගේ එක ප්‍රමාණයක් සහ උසස් පෙළට එක ප්‍රමාණයක්. නමුත් අවසානයට සිද්ධ වුණේ අර 6 -12 කියන පරාසය තුළ ප්‍රමාණය ඒගොල්ලෝ ගණනය කරපු විධියට නොවෙයි වුණේ. ඒක එක ප්‍රමාණයකට ආවා. එතකොට ප්‍රමාදයක් ඇති වුණා. ඔබතුමා කියනවා වාගේ, ඒක බොහොම ජනප්‍රිය දෙයක් වුණා. මිනිස්සුන්ට පොඩි ආශ්වාදයක් වුණා. ඔතැනදී වුණේ ගරු සභාපතිතුමනි, දැන් අපේ ගරු මන්ත්‍රීවරුත් මේකට හරියටම දායක වුණේ නැහැ. ඒක අපේ මන්ත්‍රීවරුත් ඒ ඒ පළාත් පාලන ආයතන එක්ක එදා ඍජු සම්බන්ධතාවයක් ගොඩ නගා ගත්තා නම් - මේක අද මේ ඔබතුමාගේ රජයේ තිබෙන නීතිරීතිවලට අනුගත

වෙමින්, ඒ සම්ප්‍රදායන්වලට ගරු කරමින් මගේ නිලධාරීන් සහ මම FCID යන්නේ නැති විධියට මේක කළා. වැඩේ හොඳයි. දැන් මේකේ තව එකක් වුණා. ගරු සභාපතිතුමනි, අපි ඉස්සෙල්ලාම අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදෙස්වලට අනුකූල වෙමින්, මේක කලාප කාර්යාලය හරහා කළා. කලාප කාර්යාලවලට මේ අත්දැකීම නැහැ. ඒ නිසාත් අවුලක් සිද්ධ වුණා. දැන් මන්ත්‍රීවරුන්ගේ බරපතළ ඉල්ලීමක් තිබෙනවා, මේ අවුරුද්දෙත් ඒක ක්‍රියාත්මක කරන්නය කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අනිවාර්යයෙන්ම.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එහෙම ගැටළුවක් නැහැ නේද සභාවේ?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒක එතකොට පළාත් පාලන ආයතනවලට මේක කරලා පුරුදුයි. ඒගොල්ලෝ සපත්තු දීලා නැතත් ඒගොල්ලෝ පොත් දීලා තිබෙන නිසා ඒගොල්ලන්ට මේක කරන්න ලේසියි. දැන් මහරගමත් වුණා. මහරගම 2000 ක ට වාගේ ගියේ. මටත් බලන්න ලැබුණේ නැහැ. මහරගම අඩු ප්‍රමාණයකට ගියේ. සාමාන්‍යයෙන් මම දන්නවා. ඕනෑම මැතිවරණ කොට්ඨාශයක් තුළ අඩු ආදායම් ළමයි 5000 ක 4000 ක ප්‍රමාණයක් ඉන්න පුළුවන්. නමුත් ඒ පණිවුඩය ගියේ නැහැ. ඒ ගැටළුව තිබෙනවා. දැන් අපි ඒක නිවැරදි කර ගෙන මම බලාපොරොත්තු වෙන්නේ, 2018 වර්ෂයේ දී කෙළින්ම අපේ පළාත් සභා මන්ත්‍රීවරු සම්බන්ධ කරලා, ඒ මැතිවරණ කොට්ඨාශවල ඉන්න අය සම්බන්ධ කරලා විධිමත් වැඩ පිළිවෙළක් කරන්න තමයි මම බලාපොරොත්තු වෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු මහ ඇමතිතුමා, ඒක අපේ මන්ත්‍රී ප්‍රතිපාදන එකතු කරලා දුන්නා නම් ඉවරයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට නොවෙයි අවස්ථාව. මෙතුමාගේ අවස්ථාව.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු සභාපතිතුමනි, මගේ තුන් වන ප්‍රශ්නය. මම හිතනවා, අපේ මහ ඇමතිතුමා කිව්වා වාගේ ඒ වැඩ පිළිවෙළ හොඳ වැඩ පිළිවෙළක්. ඒ පිළිබඳව අපේ මන්ත්‍රීවරු දැනුවත් වෙලා තිබුණේ නැහැ. ඒක ඊළඟ අවුරුද්දේ දැනුවත් වෙයි කියලා අපි හිතනවා. ඒ එක්කම විශේෂයෙන්ම කැලණිය කලාපයේ ඔබතුමාගේ උත්තරේදී කිව්වා, එක් දහස් ගණනකට තමයි මේක දීලා තිබෙන්නේ කියලා. ඉතින් මම ප්‍රාදේශීය සභාවෙන් උත්තරයක් ගත්තා. 3112 කට දීලා තිබෙනවා. ඒ කියන්නේ ඒ වාගේ තුන් ගුණයක් දීලා තිබෙනවා. මේ පිළිබඳව මම හිතන්නේ -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

උත්තරේට ඇවිල්ලා තිබෙන්නේ ගරු මන්ත්‍රීතුමා එක් දහස් ගණනයි.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

මම මේ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ සභාවෙන් ගත් එකක්. ඒ නිසා -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

හැබැයි, තුන් දාහකට දීලා තිබෙනවා නම් ලොකු දෙයක්.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ඔව්.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මහරගමත් මේ අඩුව වුණා.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඊළඟ පාර මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන කොට අඩුම ගණනේ

[ගරු මංජුල ප්‍රසන්න සම්පත්]

මේ අඩුපාඩු මග හරවා ගෙන ශිෂ්‍යයින්ට මොකක් හරි වවුචරයක් හරි දෙන්න පුළුවන් නම්, ඒ සපත්තු දෙක දාලා බලලා ගන්න පුළුවන් තැනකින්. ඒ වාගේ ප්‍රායෝගික දෙයක් කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අපට පුළුවන්. ඊළඟ ටෙන්ඩර් එකේදී තේරෙන කෙනත් එක්ක අපට ඒක කරන්න පුළුවන්. කොහොමත් ටෙන්ඩර් කරලා නේ යන්න වෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා, මම ඔබතුමාට ඒ සම්බන්ධව ස්තූතිවන්ත වෙනවා. අනික් පැත්තෙන් මම කනගාටු වෙනවා. ඒ පාවහන් ලබා දීමේදී විදුහල්පතිවරු ගොඩක් අසරණ වුණා. එතුමා කිව්වා වාගේ ඒ ප්‍රමිතිය නැහැ. දෙපාවලට ගැලපෙන ඒවා නොවෙයි ලැබුණේ. තවමත් ඒ ප්‍රශ්නය තිබෙනවා. පොඩි අවුලක් වුණා. ඒ නිසා ඔබතුමා ඉදිරියේදී මේක ක්‍රියාත්මක කරන කොට ඒක හරියට ක්‍රියාත්මක කරන්න.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මම හිතන්නේ, මම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

08 වැනි ප්‍රශ්නය.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

සමාවෙන්න. මේක අදාළ නැහැ. මම මේ කියන්නේ, අපේ කමිටුවක් දාලා මේ සැරේ අපි මන්ත්‍රීවරු කමිටුවක් දාලා මේ වැඩේ පිළිවෙළකට කර ගනිමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක හොඳයි. මම නම් කියන්නේ, අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් අපි ඒක ක්‍රියාත්මක කරමු.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු සභාපතිතුමනි, මමත් මහ ඇමතිතුමාට කියන්න ගියේ ඒක තමයි. ඒකේදී පොඩි පොඩි ගැටළු සිදු වුණා. කණ්ඩායමක් දාලා ඒ කටයුත්ත කරන්න. මොකද හේතුව, මම ඒකට මුහුණ දුන්නා. දැනටත් ප්‍රශ්න තිබෙනවා. නමුත් ඒක විධිමත් කර ගන්න කණ්ඩායමක් පත් කරලා කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ ලේකම්ගේ ප්‍රශ්නය තවම ඉවරයක් නැහැ නේද? සපත්තු ප්‍රශ්නය නම් දැන් ඉවරයි නේ? මීළඟට අංක 08 යටතේ නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**08.**

**නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/63)**

අ. i. කළුතර දිස්ත්‍රික්කයේ කළුතර අධ්‍යාපන කලාපයේ තිබෙන මුළු පාසල් ප්‍රමාණය කොපමණද?
ii. එය ජාතික පාසල් ලෙස කොපමණද?
iii. පළාත් පාසල් ලෙස කොපමණද?

ආ. i. කළුතර කලාපයේ වර්ෂ 2016 අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි මුළු දරුවන් සංඛ්‍යාව කොපමණද?
ii. මෙම විභාගයට පෙනී සිටි ජාතික පාසල්වල දරුවන් සංඛ්‍යාව කොපමණද?
iii. මෙම විභාගයට පෙනී සිටි පළාත් පාසල්වල දරුවන් සංඛ්‍යාව කොපමණද?

ඇ. i. ඉහත විභාගයට පෙනී සිටි මුළු දරුවන්ගෙන් සමත් හා අසමත් ප්‍රමාණය කොපමණද?
ii. එය ජාතික පාසල් මට්ටමින් සමත් හා අසමත් ප්‍රමාණය කොපමණද?

iii. සමත් හා අසමත් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව කොපමණද?

iv. මෙය පළාත් පාසල් මට්ටමින් සමත් හා අසමත් ප්‍රමාණය කොපමණද?

v. සමත් හා අසමත් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව කොපමණද?

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

අ. i. 151
ii. 11
iii. 140

ආ. i. 7411
ii. 1899
iii. 5512

ඇ. i. සමත් සංඛ්‍යාව - 4527
අසමත් සංඛ්‍යාව - 2884

ii. සමත් සංඛ්‍යාව - 1366
අසමත් සංඛ්‍යාව - 533

iii. සමත් ප්‍රතිශතය - 71.93%
අසමත් ප්‍රතිශතය - 28.07% (ජාතික පාසල් මට්ටමින්)

iv. සමත් සංඛ්‍යාව - 3161
අසමත් සංඛ්‍යාව - 2351

v. සමත් ප්‍රතිශතය - 57.34%
අසමත් ප්‍රතිශතය - 42.66% (පළාත් පාසල් මට්ටමින්)

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු ඇමතිතුමා, අතුරු ප්‍රශ්නය. කළුතර දිස්ත්‍රික්කය තුළ අධ්‍යාපන කලාපවලින් සාමාන්‍ය පෙළ දරුවන්ගෙන් වැඩිපුරම අසමත්. ඒ තිබෙන්නේ, දුර්වල මට්ටමේ තිබෙන්නේ කළුතර අධ්‍යාපන කලාපයේ. මීට ඉස්සෙල්ලාත් මම ඔබතුමාට ප්‍රශ්නයක් යොමු කළා ගිය අවුරුද්දේදී. ගණිතය විෂය සමත් දරුවන්ගේ ප්‍රශ්නය. ඇත්තටම මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා, ඉදිරි වර්ෂයේදී මේ තත්ත්වය වෙනස් කරන්න ඔබතුමා අරගෙන තිබෙන ක්‍රියාමාර්ගයක් තිබෙනවාද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, විශේෂ ක්‍රියාමාර්ගයක් අරගෙන තිබෙනවා. ගණිතය විශේෂ ව්‍යාපෘතියක් දැන් ක්‍රියාත්මකයි. අපි ශ්‍රීන්පාත්වල පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හරහා විශේෂයෙන් ගණිත විෂය අධ්‍යක්ෂවරු, ගුරු උපදේශකවරු, ගුරුවරු පවා පුහුණු කරමින් යනවා. පළමුවැනි කණ්ඩායමට 52 ක් කැඳවලා 27 දෙනයි ආවේ. දෙවැනි සැරේ කැඳවලා, අවවාද කරලා වැඩි ප්‍රමාණයක් කැඳවලා දැන් ඉක්මන් පුහුණුවීම් කටයුතු කර ගෙන යනවා. මම පිළිගන්නවා එතුමාගේ කාරණාව ඉතාම සාධාරණයි. ඒ මතයේම තමයි මමත් ඉන්නේ. ගණිතය විෂය අසමත් නිසාවෙන්ම තමයි මේ දරුවෝ අසමත් වෙන්නේ. ඒ නිසාවෙන් ගණිතය සහ භාෂාව පිළිබඳ විශේෂ ව්‍යාපෘති පළාත් සභාව හැටියට බලගන්වන්නට ඕනෑ. ව්‍යාපෘති දෙකක් දැනට ක්‍රියාත්මකයි. ගණිතය සහ භාෂාව. ඉතින් මම රීති ප්‍රකාරව මට මීට වඩා අදහස් ප්‍රකාශ කරන්න බැහැ. ඔබතුමා අවසර දෙනවා නම්, තව විග්‍රහ කරන්න පුළුවන්.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, දෙවැනි ප්‍රශ්නය. දැන් ගරු ඇමතිතුමා විශේෂ වැඩ සටහන් ක්‍රියාත්මක කරනවාය කියලා තිබෙනවා. මම දැන් මේ අද මතු වුණු තත්ත්වයක් ඔබතුමාට කියන්නම් කෝ? ඔබතුමා දන්නවා, තල්පිටිය කනිෂ්ඨ විද්‍යාලය. දැන් මේ පාර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් විශාල සංඛ්‍යාවක් ඉන්නවා. දැන් අද එම විද්‍යාලයේ ගණිතය ගුරුවරයා මාරු කරලා තියෙනවා පානදුර ශාන්ත අන්තෝනි පිරිමි විද්‍යාලයට. එතකොට මේ අවුරුද්දේ විභාගයට පෙනී සිටින්න ඉන්න දරුවෝ විශාල සංඛ්‍යාවක් ඉන්නවා. ගුරුවරයෙකු නැතිව තමයි මාරු කරන්නේ. ඉතින් ඔබතුමන්ලා කොහොමද මේ දරුවන්ට සාධාරණයක් ඉෂ්ට කරන්නේ?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, සභාවේ මට අවසර දෙන්න. නැවත ඔය වාගේ ප්‍රශ්නයක් නැඟීමේ වගකීමක් නැහැ මේ සභාවේ. ගුරුවරයෙක් මාරු කරනවාය කියන එක මට හෝ මගේ නිලධාරියෙකුට කිව්වාම නිවැරදි කරලා දෙනවා. සභාවේ අහන්න දෙයක් නොවෙයි ඒක.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ඔබතුමන්ලා වැඩ සටහන් ක්‍රියාත්මක කරලා කරනවා නම්, මේ අධ්‍යක්ෂවරුන්ට උපදෙස් දෙනවා නම් -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මේක රීති කාරක සභාවේ යළි යළි විග්‍රහ කරලා, සාකච්ඡා කරලා ගත යුතු තීන්දු මේ. රීති මේකෙන් අවුල් වෙනවා. දැන් මම වුණත් හරිම අකමැත්තෙන් තමයි විස්තරාත්මක උත්තරයක් දෙන්නේ. මම ඒකයි අර කිව්වේ. මට සභාපතිතුමා අවසර - මට බැහැ මීට වඩා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා දැන් -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඉතාම හොඳයි එතුමාගේ කැපවීම. මට ඉදිරිපත් කළා නම් මම ගුරුවරයෙක් සොයලා දෙනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, එතුමා අධ්‍යක්ෂවරුන්ට උපදෙස් දෙනවා නම් -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

සමහර විට ගුරුවරු මාරු වෙන්න පුළුවන්. විශ්‍රාම යන්න පුළුවන්. වෙනත් හේතු මත සේවයෙන් ඉවත් වෙන්න පුළුවන්. අපි ගුරුවරයෙක් දෙනවා. එච්චර නේ උත්තරේ? බොහොම ස්තුතියි.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, මෙතුමා අධ්‍යක්ෂවරුන්ට උපදෙස් දීලා තිබෙනවා නම් - සාමාන්‍ය පෙළ තව මාස කිහිපයකින් තියෙනවා. වාර පරීක්ෂණය පටන් ගන්න මොහොතේ ඉන්නේ. එහෙම තිබෙද්දී ගුරුවරයෙක් මාරු කරන්නේ කලාප අධ්‍යක්ෂතුමාගේ අනුමැතිය ඇතිව නේ? මෙතුමා උපදෙස් දීලා තිබෙනවා නම් එහෙම මාරු කරන්නේ නැහැ නේ? දැන් මේ දරුවෝ අතරමං වෙනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

උපදෙස් කවුරු දුන්නත් රාජ්‍ය සේවයේ ස්ථාන මාරු, විමර්ශන, ඉවත් වීම්, ඉල්ලා අස්වීම් ඕනෑතරම් තිබෙනවා. ඉතින් මම එතැනට ගුරුවරයෙක් දාන්නම්. ප්‍රශ්නයක් නැහැ. බොහොම ස්තුතියි.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

දානවා නම් හොඳයි. ඔබතුමා ඔය වැඩ සටහන් ගිය අවුරුද්දේ ඉඳන් කියනවා. වැඩ සටහන් යන්නේ නැහැ. මේ විෂයට අවධානයක් යොමු කරන්න ඕනෑ කලාපයක් කළුතර අධ්‍යාපන කොට්ඨාශයේ කළුතර කලාපය.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මම මේ උපදෙස් දෙනවා නොවෙයි. හැබැයි, සභා කටයුතු කාරක සභාවේදී මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන කොට යළි යළි පොඩ්ඩක් සාකච්ඡා කරලා ඉදිරිපත් කරන්න. වැල් වටාරම් කියවන්න වෙනවා නේ උත්තරයක් දෙන්න ගියාම.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

වැල් වටාරම් කියන්න ඕනෑ නැහැ, ඔබතුමා මේ වැඩේ හරියට කරනවා නම්. ගිය අවුරුද්දෙත් අපි ඇහුවා. මේ දිගින් දිගටම අහන්න වෙලා තිබෙනවා මේ ප්‍රශ්න පිළිබඳව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. මට අනවශ්‍ය -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

පුද්ගලික ලිපියකින් මගෙන් ඉල්ලන්න. මම ඔබතුමාට තොරතුරු ටික ඔක්කොම දෙනවා. ලියලා දෙන්න කෝ. සභාවේ වෙලාව අපරාදේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය යොමු කිරීමට අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ප්‍රශ්නය යොමු කරනවා.

**09.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/64)**

අ. පාසලකින් තවත් පාසලකට ස්ථාන මාරු ලැබ යන ගුරුවරුන් සතුව පැවති පාසල සතු භාණ්ඩ නැවත භාර ගෙන ලිපියක් නිකුත් කිරීම විදුහල්පති විසින් කළ යුතු බව ඔබතුමා දන්නෙහිද?

ආ. එම ලිපිය නිකුත් කිරීමට විදුහල්පතිවරයෙකු විසින් උපරිම ලෙස ගත යුතු කාලයක් තිබේද? තිබේ නම් කොපමණ කාලයක්ද?

ඇ. භාණ්ඩ භාර දීමේ ලිපිය නිකුත් නොකිරීම නිසා අදාළ සේවකයාගේ වැටුප් නැවැත්විය හැකි බව ඔබතුමා දන්නේද?

ඈ. කොළොන්නාව ශාන්ත ජෝශප් විදුහලේ විදුහල්පතිවරිය ආර්.පී.ඩී.කේ. ශ්‍රීමතී හා එල්.ඊ.එම්.එම්. සුමනරත්න යන ගුරු මහත්මීන්ට මෙම ලිපිය ලබා නොදීමෙන් අගතියක් සිදු වන බව පිළිගන්නේද?

ඉ. ජයවර්ධනපුර කලාප අධ්‍යාපන කාර්යාලය මගින් ආර්.පී.ඩී.කේ. ශ්‍රීමතී මහත්මිය භාර දුන් භාණ්ඩ ලේඛනය සම්පූර්ණ බව පිළිගෙන තිබියදීත් විදුහල්පති මාස 05 ක් භාණ්ඩ භාර දීමේ එම ලිපිය ලබා දීම ප්‍රමාද කිරීම බලය අවභාවිතයේ යෙදීමක් නොවන්නේද? ඒ පිළිබඳව විනයානුකූලව කටයුතු කරන්නේද?

ඊ. එල්.ඊ.එම්.එම්. සුමනරත්න ගුරුවරියට පාසලෙන් වැටුප් නොගෙවීම, බැංකුවට වැටුප් නොගෙවන ලෙස දැනුම් දීම, ගිණුමෙන් වැටුප් මුදල ඉවත් කර ගැනීම මගින් ද්වේශ සහගතව හා අනීතිකව කටයුතු කිරීම සම්බන්ධව ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අ. ඔව්.

ආ. ස්ථාන මාරු ලිපිය ලද පසු එම ගුරුවරයා ඉල්ලා සිටීනම් හා නිවැරදිව භාණ්ඩ භාර දී ඇත්නම්, භාණ්ඩ භාර දීමේ ලිපිය ලබා දිය යුතුය.

ඇ. ඔව්.

ඈ. ඔව්.

ඉ. මේ වන විට භාණ්ඩ භාර දීමේ ලිපිය නිකුත් කර ඇත. මේ සම්බන්ධව විමර්ශනයක් සිදු කරමින් පවතී.

ඊ. විදුහල්පතිගේ ක්‍රියාකාරකම් පිළිබඳව විමර්ශනයක් සිදු කරන බැවින් එහි තීරණ අනුව අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. දැනට අදාළ ගුරු මහත්මියට වැටුප් ගෙවන ලෙස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් නියෝග නිකුත් කර ඇත.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තූතියි ගරු ඇමතිතුමා. මම ඉදිරිපත් කරලා තිබෙන්නේ, ගුරුවරියන් දෙදෙනෙකු පිළිබඳව ප්‍රශ්නයක්. විශේෂයෙන්ම මෙම විදුහල්පතිතුමිය ඉතාමත් අත්තනෝමතික ලෙස තමයි කටයුතු කරලා තිබෙන්නේ. සුමනරත්න කියන ගුරුවරියගේ මාස තුනක වැටුප බලහත්කාරයෙන් නතර කරලා තිබිලා තිබෙනවා. මේක මුදල් රෙගුලාසිවලටත් පටහැනියි. ඒ වාගේම නීති විරෝධීයි. කිසිවෙකුට කිසිවෙකුගේ රාජ්‍ය සේවකයෙකුගේ වැටුපක් ඒ ආකාරයට විලම්බනය කරන්න බැහැ. ඒ නිසා මේක ඉතාම බරපතළ කාරණයක්. ඒ නිසා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි. මම මේ ලිපි දෙකම, මේ ගුරුවරියන් දෙදෙනාම කලාප අධ්‍යක්ෂතුමියට ඉදිරිපත් කරපු ලිපි දෙකම සභාගත කරනවා.[9] මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි. මේ පිළිබඳව විනය පරීක්ෂණයක් සිදු කරලා කොතරම් කාලයකින් මේ සභාවට ඒ පිළිබඳව තොරතුරු වාර්තා කරන්න ඔබතුමා කටයුතු කරනවාද කියලා.

[9] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාවේ අනවශ්‍ය සාකච්ඡා නතර කරන්න. ඇත්ත වශයෙන්ම එතුමන්ලාට උත්තර දෙන්න බැහැ. අනවශ්‍ය සාකච්ඡා වැඩියි. ඔබතුමා ඒකට උත්තරයක් දෙන්න ලැහැස්තියිද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ අතුරු ප්‍රශ්නය මම වගකීම භාර ගන්නවා. දැනටමත් අපි පරීක්ෂණයක් සිදු කරමින් යනවා. මට මේ ප්‍රශ්නය යොමු වුණු ගමන්ම මම මගේ නිලධාරීන්ට උපදෙස් දුන්නා, මේ සම්බන්ධව වඩා විධිමත්ව සොයලා බලලා කටයුතු කරන්නය කියලා. ඉතාම ඉක්මණින් මේ සම්බන්ධව සාර්ථක උත්තරයක් දෙනවා. මම හිතනවා, අවශ්‍ය ක්‍රියාමාර්ග මම ගන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මොකද, මම හිතනවා මේක කඩිනමින් කළ යුතුයි කියලා. ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. දැන් එතුමා උත්තරයක් දුන්නා නේ? එතුමා කඩිනමින් කරයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දෙවැනි ප්‍රශ්නය. කඩිනමින් කළ යුතුයි. ඒ වාගේම එතුමාගෙන් මම අහනවා, ඊළඟ අතුරු ප්‍රශ්නය. මේ විදුහල්පතිවරයා ඉතාම අත්තනෝමතික ලෙස කටයුතු කරලා තිබෙන්නේ. මෙවැනි අත්තනෝමතික ලෙස කටයුතු කරන විදුහල්පතිවරු සම්බන්ධයෙන් ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග මොකක්ද කියලා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

දැන් ඒ අතුරු ප්‍රශ්නය සඳහා පිළිතුරු මම කලින් දීපු පිළිතුරේම තිබෙනවා. ඒ කියන්නේ මම කිව්වා එතුමාට මේ සම්බන්ධව විධිමත් ක්‍රියාමාර්ග ගන්නවාය කියලා. බොහොම ස්තූතියි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා කඩිනම්ව ගන්නවා. කඩිනම්ව ආවේ නැත්නම් ඔබතුමා ආයිත් කඩිනම්ව ප්‍රශ්නයක් අහන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි. අනිවාර්යයෙන්ම.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මන්ත්‍රීවරුන්ට බලපානවා නම්, මිනිස්සු ගෙදරට ඇවිල්ලා කථා කරනවා නම් ඒක අපට බලපානවා. ගරු සභාපතිතුමනි, පසුගිය සතියේ ජා - ඇළ ආසනයේ එක ස්ථානයක සිමෙන්ති කර්මාන්ත ශාලාවක් හදන්න යනවාය කියලා ඊයේ මට දැන ගන්න ලැබුණා. ජා - ඇළ ප්‍රාදේශීය සභාවට ලිපියක් එනවා, නාගරික සංවර්ධන අධිකාරියෙන්. අවසර දීලා හදන්න. ප්‍රාදේශීය සභාව දන්නේවත් නැහැ. ගරු මහ ඇමතිතුමනි, මේක හරි විහිළුවක්. යහපාලනය ගෙනාවේ අපි ඔක්කොම එකතු වෙලා. මේකට කණ්ඩායමක් ඉන්නවා, එක්කහු වෙලා. ගෙනැල්ලා දැන් මෙතැන නාගරික සංවර්ධන අධිකාරියෙන් ඇවිල්ලා අපේ ගමේ ගෙනැල්ලා සිමෙන්ති ෆැක්ටරියක් දානවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කෙටියෙන් කියන්න. ඔබතුමා 36(1) යටතේ ප්‍රශ්නය අහන්නේ. පැහැදිලි කිරීම්වලට මට දෙන්න බැහැ.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

36(1) බලපාන්නේ ගරු සභාපතිතුමනි, දැන් ඒ ප්‍රදේශයේ ජනතාව අපේ ගෙදරට ඇවිල්ලා අපට බණිනවා. තමුන්නාන්සේලා කට වහගෙන ඉන්නවාද? මෙතැන සිමෙන්ති ෆැක්ටරියක් ගැහුවාම අපි කොහොමද ජීවත් වෙන්නේ කියලා. අපට ඡන්දය දෙන මිනිස්සු. මට ආපහු පළාත් සභාවට එන්න විධියක් නැහැ. අද උදේම

මේ කණ්ඩායම අපේ ගෙදරට ආවා. අපි කොහොමද ඉන්නේ කියලා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඒ යහපාලනයේ හොඳ වැඩ.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ඊළඟ එක තමයි, මේ පළාත් සභාවක් හැටියට පළාත් සභාව දන්නෙත් නැහැ. පළාත් සභාව යටතේ තිබෙන ප්‍රාදේශීය සභා දන්නෙත් නැහැ. නාගරික සංවර්ධන අධිකාරියට ඕනෑ විධියට හිතුමතේට ඒගොල්ලෝ වැඩ කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පෞද්ගලික පැහැදිලි කිරීමක් කරන්නේ. මට අවස්ථාව දෙන්න බැහැ ඒකට.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

පෞද්ගලික පැහැදිලි කිරීමක් නොවෙයි. ඒක මට බලපාන වරප්‍රසාද ප්‍රශ්නයක්. මොකද, මට ආපහු පළාත් සභාවට එන්න ලැබෙන්නේ නැහැ. ගමේ මිනිස්සු එතැන පොලු අරගෙන ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ගිහිල්ලා ලොකු පිකටිං එකක් කරන්න.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

පිකටිං කරනවා. පිකටිං කළාට වැඩක් නැහැ. අපට කථා කරන්න තිබෙන තැන මෙතැන. පළාත් සභාව දැඩි ක්‍රියාමාර්ගයක් ගන්න, මේ නාගරික සංවර්ධන අධිකාරිය ගෙන යන අත්තනෝමතික වැඩවලට විරුද්ධව. ගරු මහ ඇමතිතුමාගෙනුත් අපි ඉල්ලනවා. අපට ඉන්න ප්‍රධානියා මහ ඇමතිතුමා. මහ ඇමතිතුමාගෙන් ඉල්ලනවා, මේ පිළිබඳව සොයලා බලලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඊට ඉහළින් ඉල්ලුවත් හම්බ වෙන්නේ නැහැ උත්තරයක් ඕවාට.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු සභාපතිතුමනි, මොකක්ද මේකට අපි කරන්නේ? මොකක්ද අපි මේකට ගන්න තීන්දුව? මොකක්ද කරන්නේ? අපි අසරණ වෙලා ඉන්නේ. ගරු සභාපතිතුමනි, අපට කියන්න ඉන්නේ ඔබතුමයි, මහ ඇමතිතුමායි. කියන්න වෙන කවුරුත් නැහැ ඇත්තටම. බලාගෙන යන කොට වෙන කවුරුවත් නැහැ වාගේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහ ඇමතිතුමා උත්තරයක් දෙයි එතුමාගේ කාල වේලාවේදී.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

අනික් පැත්තෙන් ඇවිල්ලා කුණු දානවා. මිනිස්සු අපට බණිනවා හෝ ගාලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි. හරි ප්‍රශ්නයක් ඒක. කවුරුවත් කියන දේවල් අහන්නේ නැහැ නේද?

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

කවුරුත් අහන්නේ නැහැ.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, මම ඊයේ බේරුවල මැතිවරණ කොට්ඨාශයේ මගේ ගෙවල් එහා පැත්තේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. අනවශ්‍ය සාකච්ඡාවලට යන්න එපා. මොකද, එතුමා 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් අහන්නේ.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මොකද, මේ ජාතික පාසලක් ඉදිරිපිට ළමයි හතර පස් දෙනෙක් ගේට්ටුවෙන් නැගලා ඉස්කෝලෙට පනින්න හදන කොට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, සමාවෙන්න. මේ 36(1) කියන්නේ, ඔබතුමාගේ වරප්‍රසාද කඩ වීමක් සම්බන්ධව පමණක් - ඔබතුමා මේ ළමයි ගේට්ටුවෙන් පනින ඒවා -

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු සභාපතිතුමනි, විස්තර පැහැදිලි කරන්න තත්පරයක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ සමාවෙන්න. මට කාලය -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එයාගේ ළමයා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ වුණාට එතුමාට වුණු ප්‍රශ්නයක් නොවෙයි නේ? ළමයාට නේ ඒ ප්‍රශ්නය වුණේ.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ඒ දරුවන්ගෙන් ඇහුවා, මොකද දරුවනේ ගේට්ටුවෙන් නගින්නේ කියලා. ගේට්ටුවෙන් නගින කොට ඒ අය මට ගහන්න ආවා. ප්‍රශ්නයක් මතු වුණාම ගහන්න ආවා. ඒකයි මම 36(1) කියලා කිව්වේ. ඊට පස්සේ මම ප්‍රශ්න කළා, මොකක්ද ප්‍රශ්නය කියලා. එතකොට ඒගොල්ලෝ මට ප්‍රශ්නය කිව්වේ නැහැ. මට කිව්වා, අයියා යන්න මෙතැනින් කියලා. එතකොට එතැන හිටපු කෙනෙක් කිව්වා, මෙතුමා තමයි මෙහේ සංවිධායක, පළාත් මන්ත්‍රී කියලා කියන කොට, ඒගොල්ලෝ ඒ කොළ ටික හංගා ගත්තා. ඒ වාගේම ආරියවංශ විද්‍යාලයේත් ඒ ප්‍රශ්නය මතු වෙලා තිබෙනවා. අන්තරේ ළමයි, විශ්ව විද්‍යාල ළමයින් ටිකක් ඇවිල්ලා පාසල් පවත්වන වෙලාවේ ඉස්කෝලෙට ගිහිල්ලා කොළ බෙදනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න. ගරු මන්ත්‍රීතුමා මට ඔබතුමාට අවසර දෙන්න බැහැ. කාලය දෙන්න බැහැ. මේවා 36(1) නොවෙයි. සිමෙන්ති කර්මාන්ත ශාලා ප්‍රශ්න, මේ ළමයින්ගේ ප්‍රශ්න. මට ඔබතුමාගේ ප්‍රශ්නය කියන්න කෝ?

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මේ ප්‍රශ්නය උඩ මේවා ඉස්කෝලෙට යවන්න එපාය කියලයි ඉල්ලීමක් කරන්නේ. අධ්‍යාපන ඇමතිතුමා ඒක දැනුවත් කරන්න ඕනෑ. විදුහලේ පාසල් වෙලාවේ අන්තරේ -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මොකක්ද පාසල?

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

අන්තරේ ළමයි, විශ්ව විද්‍යාල ළමයි ගිහිල්ලා ඉස්කෝලේ වෙලාවේ සයිටම් එකට විරුද්ධව පිකටිං එකට එන්න කියලා කොළ බෙදනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මොකක්ද පාසල?

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ආරියවංශ විද්‍යාලයයි, අල් හුමෙයිසරා ජාතික පාසලයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙන්නාම වාඩි වෙන්න. ඕවාට උත්තර දෙන්න බැහැ.

# නොපැමිණ සිටීමේ අවසරය
LEAVE OF ABSENCE

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතුමනි, "*ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා අසනීපයෙන් සිටිනවා. එතුමාට මාස තුනක කාලයක් සඳහා නිවාඩු අනුමත කර දෙන ලෙස යෝජනා කරනවා.*"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
MINISTRIES' ANNOUCEMENTS/ MINISTERS' STATEMENTS

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා මතු කරන කාරණයත්, අපේ ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා මතු කරන කාරණයත් - විශේෂයෙන්ම එතුමා අර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධ කර ගෙන ප්‍රකාශයක් කළා. ගරු සභාපතිතුමනි, ඒ කියන කාරණය මමත් අද මාධ්‍යවලින් තමයි දැක්කේ. මේ වාගේ තීන්දුවක් අරගෙන තිබෙනවාය කියලා. ගරු සභාපතිතුමනි, ඔබතුමා මේ පළාත් සභාවේ සභාපතිවරයා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පළාත් සභාවලට පැවරෙන බලතල අනුව එය එසේ සිදු කළ හැකි දැයි කියා කියන්න තව දුරටත් විමසා බැලිය යුතු බව මේ සභාවට පළමුවෙන්ම කියන්න කැමැතියි. ඒ වාගේම කරුණු හරිහැටි දන්නේ නැතිව මේ සභාවේ ප්‍රකාශයක් කිරීමටත් මට ඉතාමත්ම අපහසුයි. ඒ නිසා මම ඉදිරියේදී ඒ පිළිබඳව කරුණු දැන ගත්තාට පස්සේ මම කථා කරන්නම්. මොකද, මාධ්‍යවල කියන ඒවා පිළිගන්න බැහැ නේ? මාධ්‍යවල මාව ඉවත් කරලත් තිබුණා නේ දවස් තුනෙන්. ඒ වාගේ දේවල් නේ මාධ්‍යවල යන්නේ. ඒ නිසා මට ඒකට උත්තරයක් හරියට දීගන්න බැහැ. හැබැයි, දැන් කවුරු මොනවා කිව්වත් කුණු කසළ බැහැර ලීමේ අයිතිය තිබෙන්නේ පළාත් පාලන ආයතනවලට සහ දැන් වර්තමානයේ මහ ඇමතිවරුන්ට. ඒ පිළිබඳව මන්ත්‍රීවරුන්ව දැනුවත් කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. මොකද, දැනටමත් කැළි කසළ සම්බන්ධයෙන් මහා පරිමාණ ව්‍යාපෘතියක් අපි ආරම්භ කරලා තිබෙනවා. ඒ පිළිබඳව අපට හරි දැනුම් දීමක් කළොත් එහෙම ඒ පිළිබඳව අපි ඉදිරි සභාවාරයේදී ඒ ගැන දැනුවත් කරන්නම්.

ඊළඟට ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා මතු කරපු කාරණාව. ගරු සභාපතිතුමනි, දැන් මේවාට උත්තර දෙන්න ගියාම විෂය භාර ඇමතිවරයායි, මගේ අතරයි ප්‍රශ්නයක් තිබෙන බව තමයි මාධ්‍ය හරහා යන්නේ. නමුත් ප්‍රශ්නයක් කෙසේ වෙතත් අද බරපතළ ලෙස ගැටළුකාරී තත්ත්වයක් නිර්මාණය වෙමින් යනවා. මේ වන කොට සැලසුම් අනුමත කිරීම නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගැනීම තුළ මහජනයා දැඩි අපහසුතාවයකට පත් වෙලා තිබෙනවා. අද උදේ කාන්තාවක් මට තුන්වැනි සැරේට කථා කළා. නාගරික සංවර්ධන අධිකාරියට එතුමියගේ සැලසුම ඉදිරිපත් කරලා, දැන් සති තුනකටත් වැඩියි. ඒකේ ප්‍රතිඵලයක් නැහැයි කියලා. දෙවැනි එක තමයි, ඊයේ කෝට්ටේ නගර සභා සීමාව තුළ පදිංචිකරුවෙක් මට කාර්යාලයට ඇවිල්ලා චෝදනාවක් කළා, එතුමාගේ අනවසර ඉදි කිරීම සම්බන්ධයෙන් මෙතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් නගර සභාව අරගෙන නැහැයි කියලා. මම අදාළ ඉංජිනේරුවරයාට කථා කළාම එතුමා කිව්වා, සම්පූර්ණ විස්තර වාර්තාව අරගෙන, දැන් අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් ක්‍රියා කරන්න බලය තිබෙන්නේ නාගරික සංවර්ධන අධිකාරියට. ඒක නාගරික සංවර්ධන අධිකාරියට ඉදිරිපත් කළාය කියලා.

එතකොට මේ ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා කියන කාරණාව. දැන් ඉස්සර නම් මේ පළාත් පාලන ආයතනවලට මේවාට මැදිහත් වෙන්න බලයක් තිබුණා. නමුත් දැන් මේකත් දැන් නාගරික සංවර්ධන අධිකාරියෙන් උදුරා ගෙන තිබෙනවා. ඉතින් මම හිතන්නේ, අපේ එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන අපේ විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු මන්ත්‍රීවරුන්ට අපි කියන්න ඕනෑ. මේ පිළිබඳව ගරු අගමැතිතුමාව දැනුවත් කරලා මේ ප්‍රශ්නයට යම් විසඳුමක් ලබා ගන්න කටයුතු කරන්නය කියලා. මේ පිළිබඳව මම විටින් විට මාධ්‍යවල සහ අවශ්‍ය තැන්වලදී මේ ගැන කථා කරලා තිබෙනවා. අද රටේ පරිපාලනමය අවුලක් ඇති කරලා තිබෙනවා. මේක මම හිතන්නේ, මහජනයාගේ බරපතළ අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් හැටියට තමයි මම දකින්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මට 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි මම ඇතුළට එන කොටම මට කාර්ය පටිපාටි රීති සංශෝධන පුස්තක කෙටුම්පත කියලා මට මේ ෆයිල් එකක් දුන්නා. මේක ඇතුළේ ලිපියක් නිකුත් කරලා තිබෙනවා. බස්නාහිර පළාත් සභාවේ කාර්ය පටිපාටි රීති පුස්තකය - 2017 සාකච්ඡාමය වැඩමුළුව. 2018 ජූනි 28 වැනිදා 9.30 ට. ඒ කියන්නේ මේක තියන්නේ 2018 ට ද? මේ සභාවේ නැතිව අනික් සභාවකටද? මේ ලියුම කියවලා බලන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා තව ටිකක් යටින් කියවලා බලන්න කෝ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ලබන අවුරුද්දේද මේ සාකච්ඡාව තියෙන් නේ?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒ දිනේ දීලා තිබෙන්නේ හරියට. නැත්නම් එන්නේ නැහැ නේ?

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ලබන අවුරුද්දේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ගරු මන්ත්‍රීතුමා පැහැදිලියි. ඒක පොඩි වැරදීමක් තිබෙන්නේ. අපි නිවැරදි කරන්නම්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මොකද, අපේ ඩයරිය නැහැ නේ? ලබන අවුරුද්දේ ඒක වෙන් කර ගන්න. ඒකයි මම ඇහුවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මේ සභාව මම හිතන්නේ මාසයකට දෙවතාවයි රැස් වෙන්නේ. ඒ දෙවතාවේදී විශේෂයෙන්ම මේ වාගේ මුද්‍රණ දෝෂයක් අල්ලා ගෙන මේ වාගේ මේ සභාවේ කාලය කා දමන එක ගැන මම හිතන්නේ ඔබතුමාගේ පැත්තෙන් තීන්දුවක් ගත යුතුයි. නැත්නම් මේ 104 දෙනාගේම වරප්‍රසාද කඩ වෙනවා. මුද්‍රණ දෝෂයක් තේරුම් ගන්න බැරි මන්ත්‍රීවරුද මේකේ ඉන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මේ අය පසුගිය කාලයේ මේ රටේ දේපළ, ට්‍රාන්ස්ෆෝමර්, බස්, පුස්තකාල, කෘෂිකර්ම මධ්‍යස්ථාන ගිනි තිබ්බේ. මේ රටට අභේනියක් කරන්න කොටි කරපු එකේ අනික් එක කළේ. ජනතා විමුක්ති පෙරමුණට ඇස් පේන්නේ නැහැ. මේගොල්ලන්ට අකුරු පේන්නෙත් නැහැ. ලියුම් කියවන්නෙත් නැහැ. මේ අයට තිබෙන්නේ පාරේ විප්ලවය.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒක මුද්‍රණ දෝෂයක්.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඔය හිතේ අමාරුවට කියවන්නේ.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ V වන පළාත් සභාවේ මූල්‍ය අක්‍රමිකතා පිළිබඳව ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට අවස්ථාව.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම මේ ප්‍රකාශය කරන්නේ,

අපේ විපක්ෂ නායක මංජු ශ්‍රී අරංගල මැතිතුමා වෙනුවෙනුත්, අපේ කණ්ඩායම වෙනුවෙනුත්. නව රජය ආවාට පස්සේ එතුමාත්, මමත් අපේ කණ්ඩායමේ තිස් දෙනෙකුට ආසන්න ප්‍රමාණයක් අත්සන් කරලා, පොලිස් විශේෂ විමර්ශන ඒකකයට, අපි පෙත්සමක් භාර දුන්නා. ඒකේදී අපිත් ප්‍රශ්නවලට උත්තර දෙන්න ගියා. අපි ඒ වෙලාවේදී බස්නාහිර පළාත් සභාවේ සිදු වුණු, ඒ මූල්‍ය අක්‍රමිකතා වීම සම්බන්ධව විමර්ශනය කරලා ඊට සාධාරණය ඉෂ්ට කරන්නය කියලා තමයි ඉල්ලීමක් කළේ.

ඇත්තටම අපි දකිනවා. අද තිබෙන තත්ත්වය අනුව දැන් මේ බස්නාහිර පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) හෝ අධ්‍යක්ෂ (සැලසුම්), වැනි නිලධාරීන් ගණනාවක් මේ තනතුරුවල එදා හිටපු අය දැන් නැහැ. හැබැයි, අද අපට දැන ගන්න ලැබිලා තිබෙනවා. මන්ත්‍රීවරු වශයෙන් අපි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අපේ පළාත් සභා නිලධාරීන් අපේ ව්‍යාපෘති යෝජනා අනුමත කරන්න ගියාම, යම් යම් අවස්ථාවල ඒ නිලධාරීන් අපට චෝදනා කරන බව. ඒ වාගේම ඔවුන්ගේ දුක් ගැහැට ප්‍රකාශ කරනවා, අපේ පිටින් තමයි මේ ඔක්කොම ප්‍රශ්න යන්නේ කියලා. මේක විවෘතව අපි ප්‍රකාශ කරන්න ඕනෑ. අපි හොඳ හිතින් කරපු දෙයක්. ඇත්තටම මේ නිසාම බස්නාහිර පළාත් සභාවේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉන්න නියෝජිතයන්ට, හොරුන්ට යම්කිසි අවහිරතාවයක් වෙලා තිබෙනවා, තමන්ගේ කටයුතු සම්බන්ධව.

ඒ වාගේම කියන්න ඕනෑ. මේ සහකාර අධ්‍යක්ෂ, නිල්මිණි පතිරණ හා විෂය ලිපිකරුවන් වන රේණුකා සේපාලි, සම්මානි ජයවීර, දර්ශිකා පෙරේරා යන අයටත් යම් යම් ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. හැබැයි, මේක ඉහළින් වුණු දේවල්. මේ චක්‍රලේඛය එන්නේ ඉහළින්. පළාත් සභාවේ මිලියන 70 ක අක්‍රමිකතා සිදු වුණාය කියලා අපි කිව්වා. ව්‍යාපෘති 333 ක ප්‍රශ්න කිව්වා. හැබැයි, මේවා අනුමත කරන්නේ මුලින්. මම පුද්ගලයන් ගැන කියන්නේ නැහැ. එතැනින් පල්ලෙහාට එන අයට දැන් මේ ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. ඔවුන්ගේ හිත කැඩිලා තිබෙනවා. ඔවුන්ව යම් යම් ඉන්ටර්ඩික් වෙන්න, නැත්නම් යම් යම් දුෂ්කර තත්ත්වයන්ට පත් වෙන්න පුළුවන්. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා. මම ලිපියක් හදලා තිබෙනවා. ඒක සභාගත කරනවා.[10] ඒ වාගේම ඒ චක්‍රලේඛ අනුව කටයුතු කිරීමේදී ඔවුන්ට යම් දෙයක් වුණා නම්, මේ පොඩි නිලධාරීන්ව, නිදහස් කරන්නය කියලා මම මේ හැන්සාඞ් වාර්තාව විශේෂ පොලිස් විමර්ශන ඒකකයට යවන්නය කියලා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒ වාගේම මම ලිඛිතව ඒ චක්‍රලේඛ අංකත් එක්ක සභාගත කරනවා. ඒවා හැන්සාඞ් ගත කරන්නය කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට කොළඹ කුණු සම්බන්ධව පැහැදිලි කිරීමට අර්ෂාඞ් නිසාම්ඩීන් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු අර්ෂාඞ් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

ගරු සභාපතිතුමනි, බොහොම ස්තූතියි. මේ කුණු ප්‍රශ්නය විශාල ප්‍රශ්නයක් බවට අද පත් වෙලා තිබෙනවා. කොළඹ විතරක් නොවෙයි. මුළු බස්නාහිර පළාතේම මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙනවා. කොළඹ, ගම්පහ, කළුතර සෑම ප්‍රදේශයකම ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. නමුත් විශේෂයෙන්ම අපි ජීවත් වන පළාත අනුව කොළඹ නගර සභාවට අයිතියි. අපේ මහ ඇමතිතුමා හොඳ ප්‍රවණතාවයක් ගත්තා මේ කුණු ඉවත් කිරීම සඳහා. නමුත් මේකේ අඩුපාඩු රාශියක් තිබෙනවා. ඒ කියන්නේ, ගරු සභාපතිතුමනි, කොළඹ මහ නගර සභාවට අයිති ප්‍රදේශවල 1 සිට 15 දක්වා තිබෙනවා. ඒකෙන් කොළඹ මහ නගර සභාව දිස්ත්‍රික් හයකට කඩලා තිබෙනවා. මේ දිස්ත්‍රික් හයේ මේ කුණු ලබා ගැනීමේදී පොලිතින්, පාවහන්, බෑග් මළු ටික ගන්නේ නැහැ. ඒක හොඳ වැඩක් කියමු කෝ. නමුත් ඒගොල්ලන්ට මේකට ප්‍රතිකර්මයක් දීලාත් නැහැ. අද සමහර මිනිස්සු ගිහිල්ලා මේ පොලිතීන්, පාවහන් ටික ගිනි තියනවා. ඒකෙන් විශාල පරිසර හානියක් සිදු වෙන්න පුළුවන්. අනාගතයේදී ඒකටත් අපට මුහුණ දෙන්න වෙනවා. අපේ ළමයින්ටත්. මම ඉල්ලීමක් කරනවා. ජනතාව මේ කුණු වෙන් කරලා දෙන කොටම, මේ පොලිතින් ටිකයි, මේ පාවහන් ටිකයි වෙනත් වාහනයකට දීලා ඒකත් ලබා ගන්නය කියලා ඉල්ලීමක් කරනවා. නැත්නම් අද මේ කොළඹ මොකක්ද වෙලා තිබෙන්නේ? කොම්පඤ්ඤවීදිය, අලුත්කඩේ, මාලිගාවත්ත, මරදාන, පංචිකාවත්ත, මට්ටක්කුලිය, වැල්ලවත්ත සෑම ප්‍රදේශයකම පාරේ කුණු කඳු වශයෙන් ගහලා තිබෙනවා. පෙරේදා මම කොළඹ කලාප කාර්යාලය අසල කුණු ටික නගර සභාවට කියලා සුද්ද කළා. සුද්ද කරලා අනික් දවසේ බලන කොට නැවතත් එතැන කුණු පිරිලා. කොළඹ සිටින ජනතාවගේ නිවෙස් සාමාන්‍යයෙන් පර්චස් එකකට අඩු ප්‍රමාණයකුත්

[10] අද දින වැඩ කටයුතු අවසානයේ පළ කර ඇත.

[ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්]

තිබෙන්නේ. ඉතින් මේ කට්ටිය කියනවා. දැන් උදාහරණයක් වශයෙන් ගත්තාම මේ මිනිස්සු කඩේට ගිහිල්ලා බත් පාර්සලයක් ගත්තා. ඒ බත් පාර්සලයේ පොඩි පොලිතින් බෑග් එකක හොදි දාලා තිබෙනවා. එතකොට ඒක පාවිච්චියට අරන් ඒ පොඩි පොලිතින් බෑග් එක කොහේටද දාන්නේ? ඒකත් ඉදුල්. පොඩි පර්චස් භාගයක ගෙදරක තියාගන්න බැහැ. එවැනි තත්ත්වයක් තිබෙනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

සෝදලා දානවා.

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

සෝදලා දාන්න හරි, මොනවා හරි ක්‍රමයක් යොදවන්න හරි කොළඹ මහ නගර සභාවට නිලධාරීන් නැත්නම් වෙනත් බාහිර නිලධාරීන් හරි ගෙන්වලා මිනිස්සුන්ව දැනුවත් කිරීමක් කරන්න ඕනෑ. මේවා දැනුවත් කිරීමකුත් කරලා නැහැ. අනික් එක දැන් පොලීසියේ සහයකුත් ලැබෙන්නේ නැහැ. පොලීසිය දැන් කොළඹ මොනවාද කරන්නේ? සමහර ත්‍රීවීල් රියදුරන් එක එක ගෙවල්වලින් රුපියල් පනහ බැගින් අරගෙන ගෙවල් හයක, හතක කුණු අරගෙන රට ගිහිල්ලා දාලා යනවා. ඒ වාගේම කාර් එකේ ගෙනැත් දානවා. ඉතින් මෙවැනි ආකාරයට සිදු වෙද්දී පොලීසියත් මේකට උදව් කරන්නේ නැතිව නිහඬ වෙලා බලාගෙන ඉන්න කොට ඒගොල්ලෝ කරන්නේ මේ පොලීසියයි, නගර සභාවයි මහ පාරවල්වල, ඒ කියන්නේ ගාලුපාර, VIP අය යන පාර විතරක් සුද්ද කරනවා. නමුත් ගෙවල්වල residential area එකේ කුණු ගෙනියන්නේ නැහැ. අදත් ගිහින් බැලුවා නම් ඒ දේ වෙනවා. කොළඹ විතරක් නොවෙයි. මම ගම් පළාතත් කියන්න ඕනෑ. ගම් පළාත්වල දැන් පොලිතින් ගන්නෙත් නැහැ. සපත්තු, සෙරෙප්පු ගන්නෙත් නැහැ. දැන් මේ කට්ටිය ඔක්කොම ගිනි තියනවා. මගේ යාළුවෙකුගේ ගෙදරට ගියා. මම දැක්කා එයාගේ නැන්දම්මා පරණ සපත්තු අරගෙන ගිහිල්ලා ගිනි තියනවා. මම ඇහුවා, මේ මොකක්ද කරන්නේ කියලා. එතකොට කියනවා, මේවා අරගෙන යන්නේ නැහැයි කියලා. එවැනි වාතාවරණයක් අද උදා වෙලා තිබෙන්නේ. ඒ වාගේම වැල්ලම්පිටිය, කොලොන්නාව, මෙගොඩ කොලොන්නාව, ගොතටුව, අඹගහ හන්දිය ඒ ප්‍රදේශවලට මාස ගණනකින් කුණු ගන්න ගිහිල්ලා නැහැ. ඒගොල්ලෝ වෙන් කරලා තියලා තියෙන්නේ. නමුත් ගෙවල්වල තියා ගන්න බැහැ. එතකොට මේ මිනිස්සු මොකක්ද කරන්නේ? ගිහින් පාරවල්වල දානවා. ගරු සභාපතිතුමා මඟින් මම ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, අපට මේක විසඳලා දෙන්නය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රටේ ඇති වී තිබෙන වර්තමාන දේශපාලන අර්බුදය පිළිබඳ කාරණාව සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීමට අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, බොහොම ස්තූතියි අවස්ථාව ලබා දුන්නාට. මට මේ කථාව කියද්දී මතක් වුණා විලියම් ෂේක්ෂ්පියර් මහතාගේ කවියක්. Poem එකක්. හැබැයි, මම දන්නේ ඒක විතරයි. ඔහුව දන්නේ නැහැ. මොකද, මම තැනක දැක්කා. ඒක පාඩම් කළ නිසා මට මතකයි. විලියම් ෂේක්ෂ්පියර්ගේ.

There was a young lady of Riga
Who smile as she road on a Tiger
They return on the ride with the lady inside
With a smile on the face of the Tiger

එහෙමයි තිබුණේ. මම පාඩම් කර ගත්තා. ඒකෙන් කියන්නේ,

රිගා පළාතේ විසූ ලලනාවක්
කොටියෙකු පිට නැගී පාමින් ලොකු සිනාවක්
ගසා පොඩි රවුමක් ආපසු පැමිණිය මුත්
ඇය දක්නට නොමැත කොටියා නම් සිනාසෙයි

කොටියාගේ පිටේ නැගලා, කෙල්ලව රවට්ටාගෙන රවුම ගියා. එනකොට කොටියා හිනා වෙවී එනවා. කෙල්ල කාලා. ඒ වාගේ තමයි ගරු සභාපතිතුමනි, මේ යහපාලන ආණ්ඩුවත් ජනතාව රවට්ටලා, ජනතාව නොමග ඇරලා, ජනතාවගේ ඡන්දය ගත්තා. අද ජනතාවට කෙළලා ඉවරයි. අද ජනතාවට තේරෙන කොට පරක්කු වැඩියි. කෙල්ල කොටියාගේ බඩේ වාගේ අද ජනතාවට වෙලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැහැදිලි නැහැ මට ඒ කියපු ටික.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

There was a young lady of Riga
Who smile as she road on a Tiger
They return on the ride with the lady inside
With a smile on the face of the Tiger

ඒ කියන්නේ,

රිගා පළාතේ විසූ ලලනාවක්
කොටියෙකු පිට නැගී පාමින් ලොකු සිනාවක්
ගසා පොඩි රවුමක් ආපසු පැමිණිය මුත්
ඇය දක්නට නොමැත කොටියා නම් සිනාසෙයි

ඒක තමයි සිංහල තේරුම. ඒ වාගේ තමයි ගරු සභාපතිතුමනි, මේ යහපාලන ආණ්ඩුවත් ජනතාව රවට්ටලා. අර කොටියාගේ පිටේ ගිහිල්ලා කෙල්ලව ගිල්ලා වාගේ මේ යහපාලන ආණ්ඩුවත් -

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

Teacher කවුද?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මම.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කොටියා කවුද?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ජනතාව රවට්ටලා, අද ජනතාවට, කොටියා කෙල්ලට ඇරියා වාගේ ජනතාවට මේ ආණ්ඩුව අරිනවා. ගරු සභාපතිතුමනි, රට දිහා බැලුවාම මේ ආණ්ඩු පක්ෂය කියන්නේ, මහින්ද රාජපක්ෂ හොරා. ඔව්. එතකොට මේ මහින්ද හොරකම් කරපු හන්දාද -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔව්ද?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

කියන්න කෝ? මහින්ද හොරකම් කරපු හින්දාද පාරේ කුණු අදින්නේ නැත්තේ. මහින්ද රාජපක්ෂ හොරකම් කරපු හන්දාද මේ ඩෙංගු වැඩි වෙලා තිබෙන්නේ. එතකොට ගරු සභාපතිතුමනි, මහින්ද රාජපක්ෂ හොරකම් කරපු හන්දාද අර හින්දි ෆිල්ම්වල වාගේ පාර දිගේ වෙඩි තියා ගන්නේ. පොලීසියට වෙඩි තියනවා. මේ මහින්ද හොරකම් කරපු හන්දාද? ගරු සභාපතිතුමනි, මේ යහපාලන ආණ්ඩුවට වැඩ බැරි හන්දා. දැන් අර අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, හැම තැනම කුණු කියලා. අද අදිනවා. ආයිත් හෙට කුණු. හෙට කුණු ගෙනැත් දානවා නේන්නම්. ගරු සභාපතිතුමනි, පළාත් පාලන ආයතන ක්‍රියාත්මක නැහැ. පළාත් පාලන ආයතන ක්‍රියාත්මකව තිබුණා නම් ඒ පළාත් පාලන ආයතනය, ඒ සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීවරු ඒ කුණු ටික අදින්න වැඩ පිළිවෙළක් හදනවා. අද පළාත් පාලන ඡන්දය කල් දාලා. ඇයි? මේ යහපාලනයට ඡන්දය තියා ගන්න බැහැ. මම දැක්කා, අර ඇමතිතුමා කියනවා, තවත් තුන් මාසයක් කල් අරිනවා කියලා. ඇයි? ඡන්දය තිබ්බොත් කෙලියා තාප්පෙට. ඉවරයි. සෝදලා යනවා. ඡන්දය තියන්න පුළුවන් හයියක් මේ ආණ්ඩුවට නැහැ. අපේ මහ ඇමතිතුමා මොනවා වුණත් කුණු ටික භාර අරගෙන - දවසක් මම මහ ඇමතිතුමාගේ ළඟ ඉන්න කොට පළාත් පාලන කොමසාරිස්තුමියට කථා කරලා ඒ ඒ පළාත් පාලන ආයතනවලට ගිහිල්ලා කොළඹ කුණු අදින්න කියලා නියෝග කරනවා. ගරු සභාපතිතුමනි, මම මහ ඇමතිතුමාගේ ළඟ ඉන්නකොට. අද මහ ඇමතිතුමාවත් ඒකෙන් අයින් කරලාලු. අර දිගටි ඇමතිතුමා. ඒ දිගටි ඇමතිතුමා කරපු දේකුත් නැහැ. බලාගෙන ගියාම මෙගා පොලිස්. මෙගා පොලිස් වුණාට අර කොළඹ කටුනායක හයිවේ එක තිබෙන්නේ, හයිවේ එකේ -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඒ පව රණවක.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අර වත්තල තිබෙන වතුර ටික බැහැලා යන්න බැසිල් මහත්තයා ඇළක් කැපුවා. ඇළෙන් වතුර ටික බැහැලා

යනවා. ඇළ ලස්සනයි. අද ඒක කපනවා තියා, ඒකේ බජිරි අයින් කර ගන්න බැහැ. කොළඹ කටුනායක හයිවේ එක ළඟ තිබෙන -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බොරු කියන්න එපා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

බොරු නොවෙයි. ඇත්ත. ගිහිල්ලා බලන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කපලා තිබෙන්නේ. බොරු කියන්න එපා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

කපනවා. ගරු සභාපතිතුමනි, එංගලන්තයට බෝම්බය ගිය වෙලාවේ මේ ඊයේ පෙරෙයිදා තෙරේසා මේ කියනවා - අගමැති. නීති වෙනස් කරලා හරි මේ ත්‍රස්තවාදීන් නැති කරනවා කියලා. අපේ නායකයෝ? ත්‍රස්තවාදය නැති කරපු අපේ නායකයින්ව හමුදාව නීති වෙනස් කරලා පාවා දෙනවා. ඔවුන් කියනවා, නීති වෙනස් කරලා ත්‍රස්තවාදය නැති කරනවාය කියලා. අපේ අය කියනවා, නීති වෙනස් කරලා හරි පාවා දෙනවා. ගරු සභාපතිතුමනි, මේ රට මෙහෙම යන්න බැහැ. මේ කාලකණ්නි ආණ්ඩුවට අපි කියන්නේ. ඡන්දය තියලා, ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරලා මේ ජනතාව ආරක්ෂා කරන්නය කියනවා. මේ වනිගරත්න ඇමතිතුමාගේ පුතාටත් ඩෙංගු. දැන් දවස් අටයි. නවලෝකේ ඉස්පිරිතාලේ. එතුමාගේ දුවට ඊයේ මදුරුවෙක් විදලා අන්න, ඊයේ අරගෙන ගියා.

දේවෝ වස්සතු කාලේන - සස්ස සම්පත්ති හේතුව
පීතෝ භවතු ලෝකෝච - රාජා භවතු ධම්මිකෝ

රජ කියන්නේ බොරු. 2017 පොලිතින් අයින් කරනවාය කිව්වා. තවමත් පොලිතින්. 2018 දී ඇස්බැස්ටෝස් අයින් කරනවාය කිව්වා. තියෙන්නේ මොනවාද? උළුත් නැහැ. Talk විතරයි. වැඩ බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වත්මන් ළමා පරපුර සහ ඔවුන්ගේ මානසික තත්ත්වය පිළිබඳව අදහස් දක්වන්න රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු සභාපතිතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා. මම හිතන්නේ, මේ අවස්ථාවේ අධ්‍යාපන ඇමතිතුමාත් හිටියා නම් වඩාත් හොඳයි. ගරු සභාපතිතුමනි, සමස්ත ශිෂ්‍ය ප්‍රජාවම ගත්තොත් එහෙම දැඩි කලකිරීමකට සහ වැටීමකට ලක් වෙලා තිබෙන්නේ. ඔබතුමා දන්නවාද? 2016 කරපු සමීක්ෂණයකට අනුව අද පාසල් නොයන ළමයින් සංඛ්‍යාව 452,661 ක්. ගරු අධ්‍යාපන ඇමතිතුමනි, 452,661 ක් පාසල් නොයන දරුවෝ. 2016 ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් කරලා තිබෙන්නේ. ඒකෙන් ඉන්නවා 51,249 ක් කිසිම දවසක පාසල් නොගිය ළමුන්. මේකේ ශෝචනීය තත්ත්වය තමයි මේ අය 05 ත් 11 ත් අතර සංඛ්‍යාවක් - පොඩ්ඩක් හිතන්න ගරු සභාපතිතුමනි, මේ ශ්‍රී ලංකාව සාක්ෂරතාවයෙන් ඉදිරියට ගිහිල්ලා තියෙනවා කියලා අපි කිව්වත් වත්මනේ අරගෙන තිබෙන ඒවා - දෙසතිය සඟරාව හරහා මම මේ තොරතුරු ගත්තේ. මේ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කරලා තිබෙන තොරතුරු. මේක වැරැදි වෙන්න විධියක් නැහැ. දරුවෝ 452,661 ක් විවිධ හේතුන් නිසා පාසල් යන්නේ නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඒ කියන්නේ පාසල් යන වයසේ අය.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඔව් පාසල් යන වයසේ. ඒ වාගේම තමයි 51,249 ක් කිසිම දවසක පාසලකට ගිහිල්ලා නැහැ. එතකොට හිතන්න කෝ බලන්න අපි අධ්‍යාපනයෙන් කොයි තරම් ඉහළට ගිහිල්ලා තියෙනවා කිව්වත් එහෙම තත්ත්වයක අපි නැහැ. මොනයම් හෝ හේතු සාධක නිසා දැඩි කලකිරීමට ලක් වෙලා තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, අපි විශේෂයෙන්ම බස්නාහිර පළාතේ මහරගම සහ ඒ ප්‍රදේශ ගත්තොත්

එහෙම ළමයින්ගේ දැඩි මානසිකත්ව - දරුවන් විශාල සංඛ්‍යාවකට උගන්වන ගුරුවරයෙක් හැටියට මම දකින එක්තරා දෙයක් තමයි දැඩි ඉච්චාභංගත්වයකට පත් වුණු දරුවෝ සංඛ්‍යාවක් ඉන්නේ. මහ කඩා වැටීමකට ලක් වෙලා තිබෙන්නේ. උදේ 6.20 ට ධර්මපාල විද්‍යාලය ඉදිරිපිටට 11 වසරේ ගැහැණු ළමයෙක් ඇවිල්ලා පාලම උඩට නැඟලා ටයි එක ගලවලා, සපත්තු දෙක ගලවලා, බෑග් එක පැත්තකින් තියලා පොඩි වෙලාවකුත් අරගෙන පාලමෙන් බිමට පනින්න තරමට මානසිකත්වය පිරිහිලා ගිහිල්ලා. ගරු සභාපතිතුමනි, කොට්ටාව රේල් ස්ටේෂන් එක පෙනි පෙනී උසස් පෙළ ඉගෙන ගෙන ආපු දරුවා සෙලියුලර් දුරකථනය තමන්ගේ කලිසම් සාක්කුවට දාගෙන කෝච්චියට බෙල්ල තියන්න තරම් මානසිකත්වය බිඳ වැටිලා. කළල්ගොඩ අපේ ගමේ දරුවෙක්. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ඒ දරුවා අධ්‍යාපනය හදාරලා යම් හේතුවක් නිසා රේල් පාරට බෙල්ල තියලා මැරුණා. මම ගුරුවරයෙක් හැටියට හොයලා බැලුවාම, මේ දරුවෝ දැඩි මානසිකත්වයකින් වැටිලා තියෙන්නේ. ඒ නිසා අද පාසල් පද්ධතිය තුළම ගත්තොත් එහෙම මහ විශාල වශයෙන්, බහුල වශයෙන් දකින්න ලැබෙන දෙයක් තමයි විවිධ හේතූන් යොදාගෙන, විවිධ දේවල් ආශ්‍රය කරගෙන මහ අධ්‍යාපනික කඩා වැටීමක් සහ සමාජමය වශයෙන් කඩා වැටීමකට ලක් වෙලා තිබීම.

ගරු සභාපතිතුමා හරහා ගරු අධ්‍යාපන ඇමැතිතුමාගෙන් විශේෂයෙන් අධ්‍යාපනයේ නියැළිලා ඉන්න ගුරුවරයෙක් හැටියට මම ඉල්ලීමක් කරනවා. මේ දරුවන්ගේ මානසිකත්වය නැවත වතාවක් ගොඩ නැඟීම සඳහා හේතු සාධක සියල්ල ඇසුරු කරගෙන පාසල් පද්ධතිය තුළ ළමුන්ගේ මානසික තත්ත්වය නැවත වතාවක් යථා තත්ත්වයට පත් කරන්න. එක්කෝ වෛද්‍යවරුන් ලවා හරි, වැඩමුළු යොදලා හරි මේ තත්ත්වය ඇති කළ යුතුයි ගරු සභාපතිතුමනි. එහෙම නොවුණොත් අපේ රටේ දරුවෝ විශාල වශයෙන් - හිතන්න කෝ කිසිම දවසක පාසලකට නොගිය 05 ත් 11 ත් අතර 52,000 ක් ලංකාවේ ඉන්නවා කියන එක. ඒ නිසා අපි ඔබතුමාගේ අධ්‍යාපන උපදේශක කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරු හැටියට මහ සභාව හරහා යෝජනාවක් ඉදිරිපත් කරලා, අඩුම තරමින් අපේ බස්නාහිර පළාත තුළ හරි මේ ළමයින්ගේ මානසිකත්වය දියුණු කිරීම සඳහා වැඩ කටයුතු කළ යුතුයි.

ගරු සභාපතිතුමනි, අද පාසල් තුළ බහුල වශයෙන් - මම දන්නේ නැහැ රජයේ තියෙන හේතු මොනවාද කියලා. සලකන්න උත්සාහ කරන්නේ නැහැ. බහුල වශයෙන් විවිධාකාරයේ මධ්‍යසාර පරිහරණය කරනවා. කොට්ටාවේ එක්තරා පාසලක 11 වැනි ශ්‍රේණියේ දරුවෝ 11 දෙනෙක් පැයක් තිස්සේ සිහිය නැතුව. මත්ද්‍රව්‍ය භාවිතා කරලා. එක්තරා ජාතියක් තියෙනවාලු සලා කියලා. ඒ නිසා මම ඔබතුමා හරහා ඉල්ලීමක් කරනවා, මම මේ කෙටි අවස්ථාව ගත්තේ අපි බස්නාහිර පළාත තුළ දරුවන්ගේ මානසිකත්වය වර්ධනය කිරීම සඳහා මහ ඇමැතිතුමාගේත් උපකාරය ඇසුරු කරගෙන මහරගම හරි කමක් නැහැ ඔබතුමා අවස්ථාව දෙන්න. මම මහ ඇමැතිතුමාත් සම්බන්ධ කර ගන්නම්. අපට මේ දරුවන්ගේ මානසිකත්වය ගොඩ නැඟීම සඳහා කිසියම් අවස්ථාවක් ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවසර ඉදි කිරීම් නිසා ගංවතුරෙන් වන හානිය පිළිබඳව කරුණු දැක්වීමට නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, අපි දන්නවා පසුගිය කාලයේ රටේ විශාල ගංවතුර ව්‍යසනයක් සිදු වුණා. අපි හැමෝම ඒ වෙනුවෙන් මැදිහත් වුණා. මහන්සි වුණා. දැන් ඒ තත්ත්වය පහව ගිහිල්ලා තිබෙනවා. නමුත් අපි ඒ ගංවතුරෙන් ඇති වුණු තත්ත්වය පිළිබඳව, එහි සෑහෙන සංඛ්‍යාවක් ජීවිත හානි වුණා. දේපළ හානි වුණා. ඊට පස්සේ ඉදිරි ගංවතුරක් ඇතු වුණොත් ඊට ගන්නා වූ ක්‍රියා මාර්ගය, ඉන් සිදු වුණු හානි සම්බන්ධව අවධානය යොමු කරලා, නිසි ක්‍රියා මාර්ග ගත්තොත් අපට ඉදිරියේදී මොන ගංවතුරක් ආවත් වන ජීවිත හානි ප්‍රමාණය නතර කර ගන්න පුළුවන් වෙනවා. ඒකට හොඳම උදාහරණයක් තමයි මම පෙරෙයිදා ගියා ඉංගිරිය ප්‍රදේශයට. එහි මාවක්ඔය ප්‍රධාන ගංගාවක් වශයෙන් තිබෙනවා. ඉංගිරිය ප්‍රදේශයේ යටවතුර ප්‍රධාන පාරෙන් එන පාලම සම්බන්ධව - ගරු සභාපතිතුමනි, අපි දන්නවා මාවක්ඔය කිලෝ මීටර් 30 ක් විතර ප්‍රමාණයක් ගලාගෙන එන ගංගාවක්. විශාල ජනතාවක් ගොවිතැනෙන් ජීවත් වෙනවා. අනෙකුත් කර්මාන්තවලින් ජීවත් වෙනවා. නමුත් ගැටළුව මතු වෙලා තිබෙන්නේ, මාවක්ඔය කියන

[ගරු නන්දන පත්මකුමාර]

පාසලම අසල, විශේෂයෙන්ම මම මහ ඇමැතිතුමාගේ අවධානයට යොමු කර ගන්න කැමැතියි. කැන්දගොල්ල පාලම අසල තාප්පයක් ඉදි කරලා තිබෙනවා ගරු සභාපතිතුමනි. මේ තාප්පය නිසා තමයි මේ මාවක්ඔය පිටාර ගලන අවස්ථාවේදී අඩි 100 ක් පමණ පිටාර ගලලා වතුර පිට වුණත්, ඒ තාප්පය බැඳීම හේතුවෙන් අඩි 50 කට විතර මේ ගලා එන වතුර පාර අවහිර වෙලා තිබෙනවා. ඒ නිසා පසුගිය කාලයේ මේ ගංවතුර තත්ත්වයෙන් ජීවිත කිහිපයක් නැති වෙන්න ගිහිල්ලා පැය 6 ක් පමණ ගස්වල එල්ලිලා ඉඳලා බේරුණු කිහිප දෙනෙක් ඒ ප්‍රදේශයේ ඉන්නවා. ඒ වාගේම මේ තාප්පය ඉදි කිරීම නිසා සම්පූර්ණයෙන්ම ගමක් යට වුණා. ඒ වාගේම මාපුටුගල ප්‍රදේශයේ හෝටලයක් ඉදි කිරීම නිසාත් ඒ ප්‍රදේශය විශාල වශයෙන් පසුගිය කාලයේ ගංවතුරට යට වුණා. ඔබතුමා මගින් මම ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඇත්තටම මේ පළාත් පාලන ආයතනවලින් විශේෂයෙන් තාප්ප, හෝටල් වාගේ දේවල් ඉදි කරන්න අවස්ථාව සලසන කොට ගම්වාසීන්ගෙන් සොයා බැලීමක් කරන්න. මේ ඉදි කිරීම් නිසා ගම්වාසීන්ට සිදු වන හානි පිළිබඳව සොයා බැලීමක් නොකර තමයි අවශ්‍ය කරන අවසර පත්‍රය පළාත් පාලන ආයතනවලින් ලබා දෙන්නේ. ඒ නිසාම තමයි පසුගිය කාලයේ ගංවතුරෙන් විශාල හානියකට පත් වුණේ.

ඒ වාගේම මේ තාප්පය ඉදි කරලා තිබෙන්නේ එච්.ඒ. පියසේන කියන සමාගම. ගමේ කවුරුවත් දන්නේ නැහැ අක්කර 07 ක ප්‍රමාණයක ඉඩමක මේ තාප්පය ඉදි කරලා තිබෙන්නේ ඇයි කියලා. මොන ව්‍යාපාරයක් කරන්නද? මොන කටයුත්තක් කරන්නද කියලා ගමේ කිසි කෙනෙක් දන්නේ නැහැ. එවැනි තත්ත්වයක් ඇතුළේ ගමම විරුද්ධ වනකොට මේ තාප්පය ඉදි කරලා මුළු ගමක්ම ගංවතුර තත්ත්වයකට පසුගිය කාලයේ මුහුණ දුන්නා. ඒ නිසා මම විශේෂයෙන්ම අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම පාලමක් තිබෙනවා. කැන්දගොල්ල පාලම. විශේෂයෙන්ම මේක අවධානම් තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. 1965 දී මේ පාලම හදලා තිබෙන්නේ ගම්වාසීන් ගමේ සමිතියක් පිහිටුවලා ගමේ මිනිස්සුන්ගේ සල්ලිවලින්. මේ ගංවතුර නිසා මේ තාප්පය ඉදි කිරීම හේතුවෙන් පාලමේ ඇඳි ගැලවිලා ගිහින් තිබෙන්නේ. කොටස් දෙකක්. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ ඉදි කිරීම් සම්බන්ධව අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා පළාත් පාලන ආයතනවලට මැදිහත් වෙලා, මේ පිළිබඳව පරීක්ෂණයක් පවත්වන්න කියලා මම එතුමාගෙන් මේ අවස්ථාවේ ඉල්ලීමක් කරනවා. මේ ඉදි කිරීම් කරන්න පළාත් පාලන ආයතනවලට අවසර ලබා දීමේදී මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වලා, සොයා බැලීමක් කරලා, ගම්වාසීන්ගේ අවශ්‍යතාවය, ඔවුන්ට සිදුවන හානිය පිළිබඳව සොයා බැලීමක් කරලා අවසර ලබා දෙන්නය කියලා. ඒ වාගේම පළාත් පාලන ආයතනයේ මේ අවසරය ලබා දීම පිළිබඳව විශේෂ පරීක්ෂණයක් පවත්වලා අපට වාර්තාවක් ලබා දෙන්න කියන ඉල්ලීමත් ඔබතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපති යසපාල කෝරලගේ මැතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට ඩෙංගු ව්‍යසනය සම්බන්ධව කථා කරන්න ජානක සූරියබණ්ඩාර ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් ලබා දෙනවා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මම කථා කරන්නේ මේ ඩෙංගු ව්‍යසනය සම්බන්ධ ප්‍රශ්නය පිළිබඳවයි. මම මේ කරුණ පිළිබඳව කථා කරන්න අදහස් කළේ, අපි දැනට බස්නාහිර පළාත් සභාව සහ පළාත් පාලන ආයතන ඇතුළු මධ්‍යම රජයේ නොයෙකුත් වැඩමුළු පවත්වලා ඇති තරම් ජනතාව සහ නිලධාරීන් දැනුවත් කරලා තිබෙනවා. විශාල මුදලක් බස්නාහිර පළාත් සභාව යටතේ තිබෙන පළාත් පාලන ආයතන සහ ඒ වාගේම මධ්‍යම රජයේ තිබෙන යම් යම් ආයතන හැමදාම වාගේ මේ ඩෙංගු මර්දනය පිළිබඳ වැඩමුළු, ඒ වාගේම ඒ අයට උපෙදස් දීම් වාගේ වැඩ කටයුතු

කරනවා. නමුත් මෙපමණ කාලයක් මෙහෙම කෙරුවත් මේ ඩෙංගු කියන උවදුර අපේ රටෙන් තුරන් වෙලත් නැහැ. විශේෂයෙන් වත්තල වාගේ ආසනවල එන්න එන්නම වැඩි වෙනවා. අද එනකොට එක්කෙනෙක් මැරිලා. මගේ භාර්යාව ඉස්පිරිතාලේ. මගේ බෑණා ඉස්පිරිතාලේ. අපේ ලලිත් වනිගරත්න ගරු ඇමැතිතුමාගේ පුතා ඉස්පිරිතාලේ. පුතාගේ නැන්දම්මා ඉස්පිරිතාලේ. අපේ මහර මන්ත්‍රීතුමාගේ බිරිඳ ඉස්පිරිතාලේ හිටියා. මේ වාගේ මේ පළාත් සභාව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගේ අය ඉස්පිරිතාලේ. නමුත් අද සමහර අය මේක සැහැල්ලු කොට සලකගෙන ඉන්නවා. සමහර අය මේ ව්‍යසනයත් තමන්ගේ වාසියට හරවාගෙන තිබෙනවා. ඒ කාලේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා යුද්ධය කරන කොට, ඒ යුද්ධය විවේචනය කළා වාගේ අද ඩෙංගු ව්‍යාපෘතිය අපි කරගෙන යනකොට ඩෙංගු ව්‍යාපෘතියට හරස් වන අයත් ඉන්නවා. මේ එල්.ටී.ටී.ඊ. යුද්ධයෙන් පස්සේ ආපු එකම යුද්ධය ඩෙංගු යුද්ධය. මේක යුද්ධයක්. එල්.ටී.ටී.ඊ. කාරයාගේ ඇඳුමෙත් තිත්, තිත් තිබුණ. ඩෙංගු මදුරුවාගේ ඇඟෙත් තිත් තිත් තියෙනවා. ඒ නිසා මේ ඩෙංගු කියන්නෙත් යුද්ධයක්. අද මේ මාස 06 ඇතුළත 215 කට වැඩි පිරිසක් මැරිලා තියෙනවා. සමහර මාසවල යුද්ධය කාලයේදීවත් මෙහෙම මැරුණේ නැහැ. ඒ නිසා මේ ගැන අවතක්සේරුවට හිතන්න එපා. මේක අවමානයට ලක් කරන්න එපා. පළාත් පාලන ආයතන තනිකර මේ වගකීම භාර ගන්න ඕනෑ. පළාත් පාලන ආයතන වගකීම භාර ගන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දැන් එවා නැහැ නේ?

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු ඇමැතිතුමා උපදෙස් දීලා තිබෙනවා. මේක දන්නේ නැතුව නොවෙයි. අපේ ගරු මහ ඇමැතිතුමා පළාත් පාලන ආයතනවලට උපදෙස් දීලා තිබෙනවා. සේවකයන් බඳවා ගන්න කියලා තිබෙනවා. ඩෙංගු මර්දනය සඳහා සේවකයන් අවශ්‍යයි. සේවකයන් ගෙයින් ගෙට නොගිහින් කවදාවත් මේ ඩෙංගු මර්දනය කරන්න බැහැ. මම ඇමැතිතුමාට කිව්වා කරුණාකරලා සතියකට දෙපාරක් ගෙදරකට ගිහිල්ලා කුණු වර්ගීකරණය කරන හැටි, කුණු පාරට දාන්න එපැයි කියන එක ඒ වාගේම දවස ගාණේ නොදිරන කුණු එකතු කරන්න වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා. අද ඒ ක්‍රමය සකස් කරලා තිබෙනවා. අද මහ ඇමැතිතුමා බස්නාහිර පළාතේ කොමසාරිස්තුමන්ලාට උපදෙස් දීලා තිබෙනවා ඩෙංගු මර්දනය සඳහා පමණක් තමන්ට හැකි ප්‍රමාණයෙන් සේවකයන් ඉල්ලන්න කියලා. සේවකයන්ට අවශ්‍ය පුහුණුව දෙන්න කියලත් එතුමා නියෝග කරලා තිබෙනවා. ඒ නිසා දැන් අපට අවශ්‍ය වන්නේ, ඒ සේවකයන්ට පුහුණුවක් දීලා ගෙවල් ගාණේ ඇරලා, ගෙවල්වල තිබෙන අභ්‍යන්තරය ගැන විමසුමක් කරලා ඩෙංගු මර්දනය සඳහා වැඩ පිළිවෙළක් සකස් කිරීමයි. එහෙම කරන්නේ නැතුව අපි කොපමණ දේශන තිබ්බත්, කොපමණ වැඩමුළු තිබ්බත් - ගිය සුමානේ ජනාධිපතිතුමා ඇවිල්ලා දහස් ගණනක් ගම්පහට ගෙන්නලා විශාල වැඩ සටහනක් කෙරුවා. නමුත් මේ එකකින්වත් ප්‍රතිඵල හම්බ වෙන්නේ නැහැ. ගෙයින් ගෙට නොගොස්. මොකද අපේ ජනතාව පුරුදු වෙලා තිබෙන්නේ පාරට කුණු දාන්න. ඒ එදා ඉඳලා පුරුදු වුණු විධිය. ඒකත් මොන්ටිසෝරියේ ඉඳලා උගන්වන්න ඕනෑ. ඒ නිසා මේ ක්‍රමය ක්‍රියාත්මක කරවන්න.

මම ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා කරුණාකරලා ඒ ගන්න දහ දෙනා හෝ පහලොස් දෙනා ගෙවල් 5000 නම් තිබෙන්නේ පන්සියය, පන්සියය වෙන් කරලා සතියකට සැරයක් එක ගෙදරකට ගොඩ වෙලා ඒ ගෙදර කුණු රැස් කරන්නේ කොහොමද? කුණු පාරට දාන්න එපා. මෙන්න බෑග් 05 ක් තිබෙනවා. මේ ජාති පහ බෑග් පහට දාන්න. මේක ගන්න සුමානෙකින් එයි. නොදිරන කුණු හැමදාම ට්‍රැක්ටර්වලින් ඇවිල්ලා එකතු කරනවා. අපේ පැත්තේ එක පාරක් තිබෙනවා, පොල් කුඩු ඉඳුල් කෑමවලට රුපියල් 12 ක් ගෙවනවා. ඌරෝ හදන අය ට්‍රැක්ටරෙන් ඇවිල්ලා පටවාගෙන යනවා. කිලෝ එකට රුපියල් 12 ක් ගෙවනවා. ඉතින් මෙවැනි ක්‍රම ඇති කරන්න ඕනෑ. අපි රස්සාවට ගන්නා 05 දෙනාද, 10 දෙනාද, 15 දෙනාද ඒ අයත් සමග ග්‍රාම සේවක මහත්වරු, ස්වේච්ඡා සංවිධාන ආගමික නායකයන් එකතු වෙලා ගෙයින් ගෙට ගිහිල්ලා, මේ කුණු පාරට දාන්න එපා. මේ ඔක්කෝම ප්‍රශ්න තියෙන්නේ කුණු පාරට දාන නිසා. තමුන්නාන්සේලා බලන්න සමහර රටවල පොඩි බැරල් එකක් හදාගෙන නොදිරන කුණු ඒ බැරල් එකට දාලා පුච්චනවා. අපේ රටේත් එහෙම ක්‍රමයක් ඇති කරන්න. එහෙම නැතුව අපි කොපමණ කථා කළත්, කොපමණ කෑගැහුවත් හෙට අනිද්දා වනකොට මේ රටේ ලොකු විනාශයක් සිද්ධ වෙනවා. අද දහස් ගණන් ඉස්පිරිතාලවල. රාගම ඉස්පිරිතාලේ එක ඇඳේ හය දෙනා ඉන්නවා.

[ගරු ජානක සූරියබණ්ඩාර]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි හැම දේකටම වඩා අපේ මේ පළාත් සභාව එක්කෝ කල් දාලා හරි කමක් නැහැ අපේ මන්ත්‍රීවරු ගමට අරින්න. මන්ත්‍රීවරු ප්‍රාදේශීය සභාවට යවන්න. නගර සභාවට අරින්න. ඒ අයට ගෙවල් ප්‍රමාණයක් තෝරගෙන අධ්‍යයනය කරන්න කියන්න. එහෙම නැතුව මේක කවදාවත් මර්දනය කරන්න බැහැ. මේක යුද්ධය හා සමානයි. සමහර විට යුද්ධයෙන් මැරුණාට වැඩිය ප්‍රමාණයක් ඉදිරියේදී මේ ඩෙංගු ව්‍යසනයෙන් මැරෙන්න ඉඩ තිබෙනවා. ඒ නිසා කරුණාකරලා මේ ගැන අවධානය යොමු කරන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමා මගින් ගරු ප්‍රධාන ඇමැතිතුමාට කියන්නේ ඔය කවුරු මොනවා කිව්වත්, ඔය ඇමැතිවරු මොනවා කිව්වත් - ඇමැතිවරු ගමට යන්නේ නැහැ. ගමට යන්නේ අපි. ප්‍රාදේශීය සභාවට, නගර සභාවට යන්නේ අපි. මිනිස්සුත් එක්ක ඉන්නේ අපි. අපේ ඇමැතිවරු මොන ප්‍රශ්න දැම්මත් ඒ අයගේ ප්‍රශ්නවලින් අපට වැඩක් නැහැ. මම කිව්වේ පසුගිය කාලයේ කිව්වා කියලා. මැදවච්චි යනවා කියලා, එක එක දිහාවේ යනවා කියලා යුද්ධයේදී එක එක ප්‍රකාශ කළා. ඒ වාගේ මේකේදීත් එක එක්කෙනා, එක එක ප්‍රකාශ කරනවා. මහ ඇමැතිතුමා ලකුණු දාගනීද දන්නෙත් නැහැ. නමුත් ඔබතුමා මේ මන්ත්‍රීවරුන්ට කියන්න ප්‍රාදේශීය සභාවලට ගිහිල්ලා, ප්‍රාදේශීය සභාවල ලේකම්වරුත් එක්ක එකතු වෙලා වැඩ සංවිධානය කරලා ගෙයින් ගෙට යන්න කියලා. සුමානෙකට වර්ග කරන්න කියලා එක මන්ත්‍රීවරයෙකුට ගෙවල් 500 ක් දෙන්න. පළාත් සභා මන්ත්‍රී වුණාට කමක් නැහැ. ජනතාව වෙනුවෙන් අපට මේක කරන්න පුළුවන්. අපට ඒ අවස්ථාව ලබා දෙන්න. වෙන මොනවත් නැහැ. ඩෙංගු මර්දනය කරන්න. අපට ව්‍යාපෘති එපා. ඒ නිසා පක්ෂ විපක්ෂ සියලු දෙනාටම කරුණාකරලා ඔබතුමා නියෝග කරන්න. ඔබතුමා ඒ අයට කියන්න මේගොල්ලොත් එක්ක වැඩ කරන්න කියලා. මේ යූ.එන්.පී., ශ්‍රී ලංකා කියලා නැහැ. ඩෙංගු මදුරුවා දෂ්ට කරන්න ගියාම ඔක්කෝටම දෂ්ට කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ශ්‍රීනාත් මන්ත්‍රීතුමා, මෙතුමා මේ ජෝන් අමරතුංග ළඟට ගිහිල්ලා අනෙක් වැඩ කර ගන්නවා. ඕකත් කරගත්තාම ඉවර නේ?

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මහ ඇමැතිතුමනි, මම මං ගැන නොවෙයි කථා කරන්නේ. මම කථා කරන්නේ බස්නාහිර පළාත් සභාව ගැන. ඒ නිසා මන්ත්‍රීවරුන්ට අවශ්‍ය වරප්‍රසාද මන්ත්‍රීවරුන්ට දෙන්න. පුළුවන් තරම් ඉක්මණට සේවකයන් බඳවා ගෙන අවශ්‍ය පියවර ගන්න. ගෙයින් ගෙට ගිහිල්ලා ජනතාව දැනුවත් කරන්න. ඒ වැඩ පිළිවෙළ සකස් කරන්න කියලා ඉල්ලා සිටිනවා. මට අවස්ථාව ලබා දීම ගැන මගේ අවංක ස්තූතිය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බස්නාහිර පළාත් සභාවේ අපේ කාර්ය භාරය පිළිබඳව අදහස් දැක්වීමට උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමාට විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්ක තුන ගත්තාම අපි කියන්නේ බස්නාහිර පළාත කියලා. මන්ත්‍රීතුමන්ලා 104 දෙනෙක් එකතු වුණු, ඇමැතිවරු පත් කරපු, සභාපතිවරයෙක් පත් කරපු මේකට අපි කියන්නේ බස්නාහිර පළාත් සභාව කියලා. ඉතින් මේ බස්නාහිර පළාත් සභාවට මේ විධියට මන්ත්‍රීවරු පත් කරලා එවලා, මේ රටේ බලය විමධ්‍යගත කරලා සමාජයට හා මේ රටට කරන්න අපට කාර්ය භාරයක් පවරලා තිබෙනවා. ඉතින් මේ සභාවට අපි අලුතෙන් ආවේ. සභා වාර 70 ක් 75 ක් තියෙන්න ඇති. මා දන්නා තරමින් ¼ ක්වත් ගණපූරණය නැතුව කල් තියලා තිබෙනවා. මේ ගණපූරණය නැතුව කල් තියලා තිබෙන සභාවට අමතරව මම මගේ පෞද්ගලිකව විරෝධය දක්වනවා. ගියවර සභා වාරයේදී රීති අත්හිටුවීමේ යෝජනාවක් ආවා. එතකොට අපි න්‍යාය පත්‍රය අමතක කරලා තමයි රීති අත්හිටුවීමේ යෝජනාව ගත්තේ. පැය ½ කට කලින් ඒකත් ඉවර වුණා. එතකොට නීත්‍යානුකූලවත් පැය ½ කට කලින් මේ සභාව අවසන් කරනවා. ගණපූරණය නැතුවත් අවසන් කරනවා. එතකොට මේ පළාත් සභාවේ කාර්ය භාරය අපි නිවැරැදිව මේ සමාජයට දීලා නැහැ. ඒ නිසා අද දවසේ ගෙන ආපු රීති අත්හිටුවීමේ යෝජනාවටත් මම

පෞද්ගලිකව විරුද්ධ වෙනවා. කාලය අත්හිටුවලා ගේනවා. න්‍යාය පත්‍රය අමතක කරලා දානවා. අවසානයේ මෙතැන කථිකයෝ නැතුව නිකන් අපරාදේ අපි මේ සභාවෙන් එළියට බැහැලා යන්න ඕනෑ. උදේට මේ සභාවට එනවා කියලා අපි ඇඳ පැළඳගෙන එන්න උත්සාහ කරන කොට අපට හිතෙන්නේ, ගිය සැනින් ආපහු එන්න වෙයිද දන්නේ නැහැයි කියලා. ඇත්තටම අර මන්ත්‍රීතුමා කියපු දේ ඇත්ත. ආසනයේ මළ ගෙවල්වලට ගියා නම් මීට වඩා වටිනවා. ඒ නිසා මේ පළාත් සභාව, වඩා වගකීමක් ඇති ආයතනයක් වෙන්න ඕනෑ. අර මන්ත්‍රීතුමා කෑගහනවා ඩෙංගු තියෙනවා කියලා. එක තැනක කසළ තියෙනවා කියලා. තව තැනකින් අපේ බලතල ටික උදුර ගන්නවා. එතකොට මේ බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීතුමන්ලාට වගකීමක් තිබෙන්නට ඕනෑ. මේ පළාත් සභාවේ සභාපතිවරයා හැටියට ඔබතුමාට වගකීමක් තිබෙනවා. මේක ජනතාවට කියන්න ඕනෑ. ඔබතුමා මූලාසනයේ ඉන්න කෙනා වශයෙන් මාධ්‍යයට කියන්නට ඕනෑ. මේ බස්නාහිර පළාතේ මන්ත්‍රීතුමන්ලා කීදෙනාද පළාත් සභාවට සහභාගී වෙන්නේ. මේ ¼ ක් විතර මන්ත්‍රීතුමන්ලා සහභාගී වෙලා යමක් කරන්න පුළුවන්ද? ඡන්දය කාලයට අපි ජනතාවට දීලා තිබෙන පොරොන්දු ටික ඉටු කරන්නේ කොහොමද? බස්නාහිර පළාතේ වගකීම අපි ඉටු කරන්නේ කොහොමද? මේ ඩෙංගු වෙනුවෙන් විසඳුමක් සොයන්නේ කොහොමද? කසළ වෙනුවෙන් විසඳුමක් සොයන්නේ කොහොමද? ඉඩම් අනුමත කිරීමේ බලතල ටික අපෙන් උදුරා ගත්තා. පළාත් පාලන ආයතනවල බලතල ටික උදුරාගෙන තිබෙනවා. අද මහ ඇමැතිතුමාගේ බලතල ටික උදුරා ගන්නවා. එතකොට කසළ අපහරණය කිරීමේ බලතල ටික උදුරා ගන්නවා. නාගරික සංවර්ධන අධිකාරියේ ඒ බලතල ටික උදුරාගෙන තිබෙනවා. මේවා පිළිබඳව අපට වගකීමක් තිබෙන්න ඕනෑ. මම හිතන විධියට අපි මේවා සම්බන්ධයෙන් වඩා වගකීමෙන් කටයුතු කරන්නට ඕනෑ. ඒ නිසා අපි සභාවක් වශයෙන්, සභාපතිවරයා වශයෙන් ඔබතුමාට වගකීමක් තිබෙනවා. පුළුවන් නම් මේ මන්ත්‍රීතුමන්ලාගේ පැමිණීමේ ලේඛනය මේ සභාවට ඉදිරිපත් කරන්න.

දැන් හදිසියේ හරි අද උදේ පළාත් සභාවේ ගණපූරණය තියෙනවා ද කියලා, සභාපතිවරයාගෙන් ඇහුවා නම් ඔබතුමාට මේ සභාව පටන් ගන්න බැරි වෙනවා. ගණපූරණයක් නැතුව තමයි සභාව පටන් ගත්තේ. ඊයේ පෙරේයිදා මන්ත්‍රීවරයෙක් කථා කරගෙන යනකොට මේ සභාවේ ගණපූරණය නැහැ කියලා සභාව කල් තියන්න වුණා. ඒ නිසා මේක ඛේදජනක තත්ත්වයක්. බස්නාහිර පළාත වැදගත් පළාත් සභාවක් වශයෙන් මේ පළාත් සභාවේ කාර්ය භාරය ඉටු වෙන්නේ නැහැ. ඒ නිසා මන්ත්‍රීතුමන්ලා තමන්ගේ වගකීම ඉටු නොකරන බව ඔබතුමා ප්‍රකාශ කරන්නට ඕනෑ. එහෙම නොවුණොත් මේ බස්නාහිර පළාත් සභාව නිකන්ම නිකන් සභාවක් බවට පත් වෙන්න පුළුවන්. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ සම්බන්ධව මම දීර්ඝ පැහැදිලි කිරීමක් කරන්න උත්සාහ කරන්නේ නැහැ. නමුත් මම එක කාරණයක් කියන්නට ඕනෑ. අපි වගකීම් ගණනාවක් තිබෙන මන්ත්‍රීවරු. ඒ නිසා අපෙන් ඒ වගකීම් ඉටු නොවෙන කොට මම අගය කරන්න ඕනෑ අපේ අත්තනගල්ල ආසනයේ සහ ගම්පහ දිස්ත්‍රික්කය ආශ්‍රිතව අපට මේ බස්නාහිර පළාතේ මුදල් වෙන් වෙලා තිබෙන්නේ අපේ සංවර්ධන කටයුතු සඳහා මිලියන 1180 යි. ඒක ඛේදජනක තත්ත්වයක් කියන එක මේ පළාතේ මන්ත්‍රීතුමන්ලා ඔක්කෝම දන්නවා. අපට කැඩුණු වහලවල් හදන්න, භාගෙට ඉදි වුණු ගොඩනැගිලි හදන්න එහෙම නැත්නම් පාසල් සංවර්ධනයට විශාල මුදලක් අවශ්‍ය වෙනවා. අද අපි යම් අසරණතාවයකට පත් වෙලා ඉන්න එක ගැන හැම මන්ත්‍රීවරයෙක්ම දන්නවා. ඒ නිසා අපි අගය කරන්න ඕනෑ, අපේ අත්තනගල්ල ආසනයේ පන්නිල ශ්‍රී ආනන්ද හාමුදුරුවෝ ඊයේ පෙරේයිදා දවසක උන්වහන්සේ ලක්ෂ 200 ක පමණ මුදලක් පෞද්ගලිකව වියදම් කරලා විද්‍යා, ගණිත පන්ති ආරම්භ කරන්න අත්තනගල්ල ආසනයේ ශාන්ත මේරි විද්‍යාලය ආරම්භ කළා. එහෙම නම් බස්නාහිර පළාත මිලියන 1180 ක් වෙන් කරන කොට උන්වහන්සේ තනියම ඉස්කෝල 08 ක් 09 ක් හදන්න මිලියන 180 ක් 200 ක් වෙන් කරලා තිබෙනවා. ඒ කියන්නේ මේවායේ නිම වීමේ වටිනාකම ගණනය කළොත් එහෙම සමහර විට මිලියන 400 ක් වාගේ වැඩි ප්‍රමාණයකට කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා බස්නාහිර පළාත තුළින් අපට කරන්න බැරි දේ පෞද්ගලිකව -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පිංකැටවල ඒවා.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

පිං කැටවල සල්ලි නොවෙයි ගරු මන්ත්‍රීතුමා. මේවා උන්වහන්සේගේ පෞද්ගලික ධනය. අපි උන්වහන්සේව

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ]

අගය කරන්නට ඕනෑ. ඒ නිසා මට ලැබුණු පෞද්ගලික පැහැදිලි කිරීම් අවස්ථාවේ මේ සභාවට ගෞරවයෙන් යෝජනා කරනවා අපේ අධ්‍යාපනය වෙනුවෙන් මහ කාර්ය භාරයක් - මේක අත්තනගල්ලට සීමා වුණු එකක් නොවෙයි. මේක දොම්පේ ආසනයට සීමා වුණු එකක් නොවෙයි. සමස්ත රටේම අධ්‍යාපනය වෙනුවෙන් තමන්ට ලැබුණු වාහන පර්මිට් එක පවා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

උන්වහන්සේ විශාල කාර්ය භාරයක් කළා. ඒ නිසා අපේ වගකීම් අපි ඉටු නොකරන යුගයක ඉන්නේ. අපි මේ සභාවට සහභාගී වෙන්නේ නැහැ. මේ සභාව පවත්වාගෙන යන්න සහයෝගය දෙන්නේ නැහැ. ඩෙංගු සම්බන්ධයෙන් අපේ තිබෙන වගකීම අඩුයි. කැළි කසළ ටික සම්බන්ධයෙන් අපේ වගකීම අපි දරන්නේ නැහැ. අපේ බලතල ටික උදුරාගෙන තිබෙන අවස්ථාවක පරිබාහිර පුද්ගලයෙක් හරි මේ බස්නාහිර පළාත් සභාව සතු යම් යම් වගකීම් ඉටු කරනවා නම්, ඒ වෙනුවෙන් අපේ ගෞරවය පුද කරන්නට ඕනෑ. එහෙම නම් අපේ මන්ත්‍රීතුමන්ලාගේ පැමිණීම සම්බන්ධයෙන් වරප්‍රසාද ඇති. මන්ත්‍රීතුමන්ලාට කටයුතු කරන්න අභිමතය ඇති. නමුත් බස්නාහිර පළාත් සභාවේ සභාපතිවරයා වශයෙන්, මහ ඇමැතිතුමා වශයෙන් ඔබතුමන්ලාට වගකීමක් තිබෙනවා මෙය වඩා ඵලදායී ආයතනයක් බවට පත් කරන්න. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් බලය බෙදලා දුන්නේ මෙන්න මේ කාර්යයන් කරන්න. මේවා නොකෙරෙනවා නම් මේක පැහැදිලි කරන්න ඔබතුමාට වගකීමක් තිබෙනවා. එය ඔබතුමා අවංකවම ඉටු කරනු ඇතැයි විශ්වාසයෙන් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේ පෞද්ගලික පැහැදිලි කිරීම් අවසන් වෙනවා.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට අවස්ථාව දෙන්නම්. පෞද්ගලික පැහැදිලි කිරීම් අවසන් වෙනවා. මේ අවස්ථාවේ ගරු සභාපතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

*ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.*

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මම උතුර කොළඹ, මෝදර ප්‍රදේශයේ ජීවත් වෙන්නේ. දැන් දවස් 15 කට වැඩියි මගේ පළාතේ කුණු අරගෙන. මගේ ගෙදර පවා දවස් 15 ක් විතර වෙනවා දැන් කුණු අරගෙන. සමහර අය කියනවා කුණු කඳු ගහනවා. එහෙම නැත්නම් ත්‍රිවීල්වලින් රුපියල් පනහ, පනහ එකතු කරලා ඒ කුණු ටික එකතු කරනවා කියලා. දැන් පොලීසිය බලන්නේ නැහැයි කියලා. ඇත්ත වශයෙන්ම පොලීසියේ කුණු ගන්නත් නගර සභාවෙන් කට්ටිය යවන්නේ නැහැ. ඉතින් නගර සභාවෙන් මේක මම හිතන විධියට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න ගරු මන්ත්‍රීතුමා මෙහෙම කිව්වාට. මේක 36 (1) නොවෙයි.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

මගේ ගෙදර කුණු ගන්නේ නැත්නම් මට කථා කරන්න අයිතියක් තිබෙනවා. මේක කොළඹ නගර සභාවේ පරිපාලනයේ දුර්වලතාවයක් තිබෙනවා. එහෙම නැත්නම් මේකට විකල්පයක් තියෙන්නට ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඕක මෙතැන ප්‍රකාශ කරන්න අවශ්‍ය නැහැ.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

සති දෙකක් කුණු ගන්නේ නැත්නම් මේ කුණු ටික ගෙනිහිල්ලා කොහාටද දාන්නේ සභාපතිතුමා. එහෙම නම් මේකට විකල්පයක් තියෙන්නට ඕනෑ. මේක මැද කොළඹ, උතුරු කොළඹ මේ සියලු තැන්වලම කුණු කඳු ගහලා තිබෙනවා. වීදිවල කුණු කඳු ගහලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා සභාවේ, ඔබතුමාගේ වේදනාව ප්‍රකාශ කරනවා.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

එහෙම නම් මේ කුණු කඳුවලට විකල්පයක් නැද්ද? වාහනයක් නැද්ද? ලොරියක් නැද්ද? මහ ඇමැතිතුමා මේක භාර අරගෙන කරන්නට ඕනෑ. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ඉන්න කොට මේ තත්ත්වය මෙහෙම තිබුණේ නැහැ. කොළඹ සුන්දරතාවයක් තිබුණා. මේක අසුන්දර කරලා දැම්මා. එහෙම නොවෙයි. මේකේ මොකක් හරි විකල්පයක් තියෙන්න ඕනෑ. ඉස්සර හය වෙලා හරි කුණු දැම්මේ නැහැ. (බාධා කිරීමක්) අද ඒ තත්ත්වය නැහැ. අපි ජීවත් වන ප්‍රදේශයේ මෙහෙම කුණු කඳු ගහගෙන හිටියා නම් පණුවෝ ගහනවා. අපි ඉන්නේ පුංචි පැල්පත්වල. මේ ජීවත්වන මිනිස්සුන්ගේ තත්ත්වය මොකක්ද? ඒකට විසඳුමක් නැද්ද? හැමදාම කුණු කඳු ගහනවා, කුණු කඳු ගහනවා කියලා මාධ්‍යයෙන් කෑගහලා වැඩක් නැහැ. මේකට කොළඹ නගර සභාවෙන් විකල්පයක් ලබා දෙන්නට කියලා ගරු සභාපතිතුමා හරහා ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාගේ වේදනාව මට තේරෙනවා. කාටද ඕවා කියන්නේ? කාට කිව්වත් වැඩක් නැහැ නේ?

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

කොළඹ නගර සභාවේ කෝටි 120 කට අබාන්ස් එකට කොන්ත්‍රාත් දීලා තිබෙනවා. අබාන්ස් එකේ වාහන නැහැ. මේ කොන්ත්‍රාත්තුව දෙන කොට කොළඹ නගර සභාව බලන්න ඕනෑ. කොමසාරිස්තුමා කියනවා කුමන්ත්‍රණ කරනවා කියලා. කුමන්ත්‍රණ නොවෙයි. ගෙදර ගෑණි රුපියල් 50 ක් දුන්නාම කුඩ්ඩෝ ගිහිල්ලා කුණු ටික දානවා. කුමන්ත්‍රණ නොවෙයි ඒවා. ඒවා පස්සේ කුමන්ත්‍රණ නැහැ. කුණු ටික ගිහිල්ලා ගොඩ ගහනවා ගෙදර තියාගන්න බැරි නිසා. රුපියල් 50 ක් දීලා කුණු බෑග් එක යවනවා. විකල්ප නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පළාත් සභාවේ කටයුතු. සභා කටයුතු පිළිබඳ ගරු ඇමැතිතුමාට අවස්ථාව සභාවේ කටයුතු සම්බන්ධ යෝජනාව ඉදිරිපත් කිරීමට.

# පළාත් සභාවේ කටයුතු
PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) [ගරු සභා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.) [On Behalf of Minister of Council Affairs]

ගරු සභාපතිතුමනි, *"2017.04.25 දින පළාත් සභා රැස්වීමේදී නිවේදනය කරන ලද, 2017.02.07 දින සභා සම්මත "2017 අංක 01 දරන බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය" සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඌ (2) ව්‍යවස්ථාව යටතේ, එතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දන්වා එවනු ලැබූ, අංක GOS/ADM/4/8/69 හා 2017.04.07 දිනැති ලිපියෙන් එවන ලද පණිවිඩයේ හා එහිම කොටසක් ලෙස සලකන ලෙසට දන්වා එවන ලද හා 2017.05.23 දින මෙම පළාත් සභාවේදී නිවේදනය කළ, සමාංක හා 2017.05.15 දිනැති පණිවිඩයේ සඳහන් සංශෝධනයන් ඉදිරිපත් කිරීමේ යෝග්‍යතාවය බස්නාහිර පළාතේ පළාත් සභාවේදී, නැවත සලකා බලන ලෙස දන්වා ඇති හෙයින් හා ඊට අනුගතව පිළිවෙලින් 2017.04.25 හා 2017.05.23 දිනවල පැවැති මෙම පළාත් සභා රැස්වීම් හිදී නිවේදනය කළ හා එකඟතාවයන් පළ කළ පරිදි 2017.05.19 දින පැවැති ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ අදහස් කෙරෙහිද*

[ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා]

*සැලකිලිමත්ව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඌ (3) අනුව්‍යවස්ථාව යටතේ කටයුතු කිරීමට හැකි වන පරිදි හා 2017.06.21 දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී එළඹුණු එකඟතාවයන්ට අනුව ක්‍රියා කිරීමට හැකිවන සේ අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයය යටතේ සඳහන් වැඩ කටයුතු සඳහා කාර්ය පටිපාටි රීති අංක 57(1), 57(3) හා 57(4) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතුය යැයි සළකා ක්‍රියා කිරීමට මෙම පළාත් සභාව එකඟ වෙයි."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, අපට තොරතුරු දැන ගැනීමේ අයිතියක් තිබෙනවා. සභා කටයුතු ඇමැතිකම වෙනස් කරලා තිබෙනවා. අපි දන්නෙත් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, නැහැ. සභා කටයුතු ඇමැතිතුමා එළියට ගියා. ඒ වෙනුවෙන් මේ ඇමැතිතුමා ඉදිරිපත් කළේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

එහෙම කිව්වේ නැහැ. කිව්වේ නැහැ ඒකයි.

## බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය
STATUE OF WESTERN PROVINCE INFORMATION TECHNOLOGY RESOURCES DEVELOPMENT AUTHORITY

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, *"2017.02.07 දින සභා සම්මත "2017 අංක 01 දරන බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය" සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඌ 2 අනු ව්‍යවස්ථාව අනුව බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක GOS/ADM/4/8/69 හා 2017.04.07 දිනැති ලිපියෙන් එවන ලද පණිවිඩයේ හා එහිම කොටසක් ලෙසට සළකන ලෙසට දන්වා එවන ලද මෙන්ම 2017.05.23 දින මෙම පළාත් සභාවේදී නිවේදනය කළ සමංක හා 2017.05.15 දිනැති පණිවිඩය කෙරෙහිද සැලකිල්ල ඇතිව, ප්‍රඥප්තිය නැවත සළකා බලා සංශෝධන සහිතව හෝ රහිතව එම ප්‍රඥප්තිය සම්මත කර ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමතය සඳහා, එතුමා වෙත ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි ක්‍රියා කළ යුතු යැයි"* මම යෝජනා කර සිටිනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම යෝජනාව පිළිබඳව 2017.05.19 දින පැවැති ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ අදහස් මා වෙත ලැබී තිබෙනවා. එම අදහස් ඇමුණුම් අංක 03 වශයෙන් මා වෙත ඉදිරිපත් කරලා තිබෙනවා. එසේම ඇමුණුම් අංක 03, 2017.06.22 වන දින පැවැති ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ වාර්තාව මේ වන විට ඔබතුමන්ලා වෙත බෙදා දී තිබෙනවා.

අදාළ ඇමුණුම් අංක 01, ආණ්ඩුකාරතුමාගේ ලිපිය වශයෙන් GOS/ADM/4/8/69 හා 2017.04.07 දිනැති ලිපියත්,

ඇමුණුම් අංක 02, ගරු ආණ්ඩුකාරතුමාගේ GOS/ADM/4/8/69 හා 2017.05.15 දිනැති ලිපියත්,

ඇමුණුම් අංක 03, 2017.05.19 දින පැවැති ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ වාර්තාවත්,

ඇමුණුම් අංක 04, 2017 අංක 01 දරන බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය 2017.02.17 දින සභා සම්මත වූ එම ලිපියත්,

ඇමුණුම් අංක 05, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඌ(1), 154ඌ (2), 154ඌ(3) යන අනු ව්‍යවස්ථාවන් යන ලිපියත්

මේ වන විට ගරු මන්ත්‍රීතුමන්ලාට ලැබෙන්නට සලස්වා තිබෙනවා. ගරු ආණ්ඩුකාරතුමාගේ පණිවිඩ කෙරෙහි සැලකිල්ල දක්වා සභාවට අදහස් දැක්වීම සිදු කළ යුතුව පවතිනවා. විශේෂයෙන් ඒ සඳහා ප්‍රඥප්ති හා නීති කාරක

සභාවේත් වාර්තාවක් මා වෙත ඉදිරිපත් කර තිබෙනවා. ඒ නිසා මෙම ගරු සභාව විශේෂයෙන්ම ගරු ආණ්ඩුකාරතුමාගේ ඒ පණිවිඩ කෙරෙහි සැලකිල්ලට ගෙන ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ එම කාරණා සම්බන්ධයෙනුත් සැලකිල්ලට ගෙන කටයුතු කරන්න. මේකේ යම් යම් පොඩි ගැටුම් කිහිපයකුත් තිබෙනවා. මොකද මේ ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ සමහර වාර්තා මට ඉදිරිපත් කරලා තිබෙනවා, සභාවේ මතය විමසන්න කියලා. ඒ නිසා මම මේ අවස්ථාවේදී ඒ පිළිබඳව එකින් එක සභාවට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ඔබට පුළුවන් ඔබගේ මතය පිළිබඳව, සභාවේ මතය පිළිබඳව අදහස් ප්‍රකාශ කර සිටින්න.

2017.05.15 දිනැති ලිපියෙන් ගරු ආණ්ඩුකාරතුමා විසින් යෝජනා කර ඇති සංශෝධන. 3(අ) හි i වශයෙන් තිබෙන්නේ, නිල බලයෙන් පත්වන සාමාජිකයන්. ප්‍රඥප්තියේ තිබෙන්නේ, නිලබලයෙන් පත්වෙන සාමාජිකයන් කියලා. ප්‍රඥප්තියේ කලින් තිබුණේ, මේ ආකාරයට.

i. විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙක්
ii. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
iii. බස්නාහිර පළාත් භාණ්ඩාගාර ලේකම්ගේ නියෝජිතයෙක්
Iv. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)

එහෙම තමයි කලින් ප්‍රඥප්තියේ සඳහන් වෙලා තිබෙන්නේ. ඊට පස්සේ ඒ සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමා සංශෝධනයක් එවලා තිබෙනවා. නිලබලයෙන් පත්වෙන සාමාජිකයන් යටතේ,

i. බස්නාහිර පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
ii. බස්නාහිර පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)
iii. බස්නාහිර පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)
iv. බස්නාහිර පළාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

එතකොට මේකේ භාණ්ඩාගාර ලේකම්ගේ නියෝජිතයෙක් කියන එක අයින් වෙලා තිබෙනවා. මේ පිළිබඳව අපේ ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ නිර්දේශ ලබා දීලා තිබෙන්නේ. මේ පිළිබඳව සභාවේ මතය විමසිය යුතුයි කියලා. ඒ නිසා මම මේ වෙලාවේ ගරු මන්ත්‍රීතුමන්ලාට ආරාධනා කරනවා. ඔබගේ මතය පිළිබඳව මට ඒ සම්බන්ධයෙන් -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
**Hon. Hector Bethmage**

ඒ කියන්නේ සංශෝධනය පිළිබඳවද?

**ගරු සභාපතිතුමා**
**Mr. Chairman**

ඔව්. ඔව්. සංශෝධන. ආණ්ඩුකාරතුමා සංශෝධනයක් එවලා තිබෙනවා නේ. එච්චරයි තිබෙන්නේ?

**ගරු හෙක්ටර් බෙත්මගේ**
**Hon. Hector Bethmage**

ගරු සභාපතිතුමනි, ගරු ආණ්ඩුකාරතුමා විසින් නම් ඒ සංශෝධනය එවලා තිබෙන්නේ. මම හිතනවා, ඉතාමත්ම කාලෝචිත වැදගත් සංශෝධනයක් කියලා. මොකද, දැන් අපේ සම්ප්‍රදාය පුරුදු වෙලා තිබෙනවා. වැදගත් රැස්වීම්වලට ප්‍රධාන නිලධාරියා එන්නේ නැහැ. ගෝලයෝ තමයි එවන්නේ. දැන් අපි දැකලා තිබෙනවා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම්වලදී - ඉතාමත්ම වැදගත් රැස්වීමක්. එවන්නේ ආයතනයේ තුන්වැනියා විතර. එයාට තීන්දුවක් ගන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
**Mr. Chairman**

ගරු මන්ත්‍රීතුමා, පළාත් සභාවේ වැදගත්ම රැස්වීම නේ මේ රැස්වීම. මේ රැස්වීමට එන්නෙත් නැහැ නේ අමාත්‍යාංශයේ නිලධාරීන්.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
**Hon. Hector Bethmage**

ඒකයි. එවන්නේ නිකන් මේ ගෝලබාලයෝ.

**ගරු සභාපතිතුමා**
**Mr. Chairman**

එන තුන් හතර දෙනා තමයි හැමදාම එන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඉතින් මේක සම්ප්‍රදායක් වෙලා තිබෙනවා. මම හිතන්නේ ආණ්ඩුකාරතුමාට ඒක දැනිලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැමදාම අපේ ප්‍රධාන ලේකම්තුමා එනවා. එතුමා සහභාගි වෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමිය සහභාගි වෙනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ආණ්ඩුකාරතුමා කෘතහස්ත පරිපාලන නිලධාරියෙක් හැටියට එතුමාට තේරිලා තිබෙනවා. මේ මහහැරීමේ කලාව තමයි මේ නිලධාරීන් කරන්නේ. ඒ නිසා ප්‍රධාන නිලධාරියාවම සම්බන්ධ වෙන්න ඕනෑය කියලා. හැබැයි, මේක නීතියක් බවට පත් වෙලා තිබෙනවා කියන එක ඒ නිලධාරීන්ටත් තේරුම් යන්න ඕනෑ. එහෙම නැත්නම් වැඩක් නැහැ. ඉතින් මම විශ්වාස කරනවා. ගරු ආණ්ඩුකාරතුමා විසින් මේ ගෙනාපු සංශෝධනය, මේ උත්තරීතර සභාවේ සංශෝධනයක් හැටියට, ඒක ඉතාමත්ම වැදගත් කියලා මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, අවසර ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමිය කාරක සභාවේ ඉන්නවා නේද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔව්. ඇත්ත වශයෙන්ම මේ සභාව වටහා ගත යුතු දෙයක් තිබෙනවා. ආණ්ඩුකාරවරයාට යම්කිසි ප්‍රඥප්තියක් සම්මත කරලා යැව්වාම අපේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථාවේ 154 අනුව ගරු ආණ්ඩුකාරතුමාට යම්කිසි සංශෝධනයක් එවීමේ හැකියාව තිබෙනවා. නමුත් මම ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ සාමාජිකයෙක් හැටියට සභාවේ අවධානය යොමු කරනවා. එහි තිබුණේ, කාරණා තුනක්. එක නිලධාරීන් පත් කිරීම. දෙවැනි එක ගණපූරණය සලකා බැලීම හා තුන් වෙනුව විගණනය කිරීම යන කාරණා සම්බන්ධයෙන් යෝජනා එවලා තිබුණා. එහිදී අපි සලකා බැලුවේ, එතුමා විසින් එවපු නිර්දේශවල තිබුණ, යම්කිසි නිලධාරියෙක් පත් කරන කොට මහ ඇමැතිවරයා විමසා පත් කරන්නය කියන කාරණාව. ඒක ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ අවධානයට යොමු වුණා. නමුත් මේතාක් දුරට එක් එක් අමාත්‍යාංශවල අධිකාරීන් පත් කිරීමේදී එහි සම්පූර්ණ බලය අමාත්‍යවරයාට තමයි තිබෙන්නේ. ඉතින් මෙහිදී පමණක් මේ මහ ඇමැතිවරයා විමසා කටයුතු කිරීම කියන එකේදී අපි දැක්කා, නිදහස්ව කටයුතු කිරීමේ බලය අමාත්‍යවරයාට ඒ යෝජනාවෙන් නැතිව ගිහිල්ලා තිබෙනවා.

එහිදී විශේෂයෙන් සලකා බලන්නට යෙදුණේ අද ඉන්න අමාත්‍යවරයා කවුද? අද ඉන්න ප්‍රධාන අමාත්‍යවරයා කවුද? කියන කාරණාව නොවෙයි. පොදුවේ යම් අමාත්‍යවරයෙක් කටයුතු කරද්දී එතුමාට ඒ පූර්ණ නිදහස තිබෙන්න ඕනෑය කියන එක. එහිදී ප්‍රඥප්ති හා නීති කාරක සභාව අවධානය යොමු කළා. ඒ නම් කරන නිලධාරියෙක්ව අපි නිශ්චිත වශයෙන් නම් කළොත් - අපි උදාහරණයක් හැටියට අධ්‍යාපන අධ්‍යක්ෂව හිතමු. මේ තැනැත්තාට යම්කිසි වැඩ කිරීමේ දුර්වලතාවයක් තිබෙනවා නම්, මේ තැනැත්තා වැඩට සුදුසු නැත්නම් වෙනත් කෙනෙක් පත් කිරීමට තිබෙන අධිකාරී බලය අහිමි වෙනවා. ඒ නිසා අපි ප්‍රඥප්ති හා නීති කාරක සභාව, නීතිඥ දැනුම ඇති සියලු දෙනාම එකතු වෙලා තීන්දු කළේ, නියෝජිතයෙක් හෝ නියෝජිතයෙක් කියන කොටස ඒ විධියටම තිබෙන්න ඕනෑය කියලා. හේතුව තමයි, යම් හෙයකින් මේ කියන නිශ්චිත පුද්ගලයා සුදුසු නැත්නම් වෙන කෙනෙක් පත් කිරීමේ අභිමතය අමාත්‍යවරයාට තිබෙන්න ඕනෑ නිසා. අපි නීතියක් සම්මත කරන්නේ, අද පනත සම්මත කරලා හෙට සංශෝධනය කරන්න නොවෙයි. අපි පසුගිය කාලයේ දැක්කා. පාර්ලිමේන්තුවෙන් තොරතුරු දැන ගැනීමේ පනත සම්මත කළා. ඊට පස්සේ අභ්‍යන්තර, කැබිනට් මණ්ඩලයේ ඒවත් ඉල්ලනවා. ඉතින් මේවායේ අඩුපාඩු එක්ක සම්මත කළොත් ආයේ සංශෝධන එනවා. එතුමාගේ අවධානය යොමු කිරීම ගැන අපේ ගෞරවය ස්තුතිය ප්‍රකාශ කරන ගමන්ම, යම්කිසි අභිමතානුසාරී බලයක් අමාත්‍යවරයාට වෙන් කරන්නේ එතුමා තමයි වග කියන්න ඕනෑ. හදිසියේ අපි වෙන කෙනෙක් විමසලා පත් කරන්න කියලා, එහෙම

පත් කළොත් එයා වැරැදි වැඩක් කළොත් මේ අමාත්‍යවරයාට වගකීම ගන්න බැහැ. එතකොට අපට ඒ අමාත්‍යරවයාට ඒ ගැන දෝෂාරෝපණයක් කරන්නත් බැහැ. ඒ අභිමතානුසාරී බලය එක් තැනකට ගොනු වෙන්න ඕනෑ. ඒක එකක්.

දෙවැනි එක ලෙස තිබුණු කාරණය තමයි, ගණපූරණය. යම්කිසි තැනක ගණපූරණයක් එද්දී ගණපූරණය 04 ක් වෙන්න ඕනෑය කියලා යෝජනාවක් තිබුණා. ගණපූරණය 04 ක් වුණොත් දෙකට දෙකක් බෙදුණොත් තීන්දුවක් ගන්න බැහැ. ඒ නිසා එය තුනක් වශයෙන් විය යුතුයි කියලා කලින් ප්‍රඥප්තියේ තිබුණු ක්‍රමයම සුදුසු බවට ප්‍රඥප්ති හා නීති කාරක සභාව යෝජනා කළා.

තෙවැනි කාරණාව තමයි, යම්කිසි ගිණුම් සම්බන්ධ කටයුතු වලදී විගණකාධිපතිවරයා සතු බලය පාවිච්චි කරලා විගණනය කිරීම අපි ඇතුළත් කරලා තිබෙනවා. එහි යම්කිසි විධිමත් කිරීමක් කරන්න, ඒ වගන්තියට අංකයක් ඇතුළත් කරන්නය කියන යෝජනාවක් තිබුණා. ඒ සම්බන්ධයෙනුත් සාකච්ඡා කරලා එයත් ආවරණය වන විධියට ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ ඒ යෝජනා ඇතුළත්ව ඒ සියල්ල ඉදිරිපත් කරලා තිබෙනවා. දළ වශයෙන් ගත්තොත් මේ ටික තමයි එවලා තිබුණේ. ඒ එවීම ගැන අපි සතුටු වෙනවා. අවධානය යොමු කිරීම ගැන ගෞරවය ප්‍රකාශ කරනවා. එවැනි අවධානයකින් ආණ්ඩුකාරවරයෙක් සිටීම හොඳයි. නමුත් නීතිමය ගැටුමත් එක්ක අපි සන්නද්ධව ඒ කරුණු සලකා බලලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් ප්‍රඥප්ති හා නීති කාරක සභාව වෙනුවෙන් සභාව දැනුවත් කරනවා. මම කියන්නේ, ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ කරලා තිබෙන යෝජනා අනුව මෙය සම්මත කරලා ඉදිරිපත් කිරීමෙන් නැවත සැරයක් ආණ්ඩුකාරවරයාට එවන්න හැකියාවක් නැහැ. ඒ ආකාරයෙන්ම සම්මත වෙන්න ඕනෑ. මේක තමයි දළ අදහස. සියලුම දෙනාටම ස්තුතිවන්ත වෙනවා. ඒගැන අවධානය යොමු කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, අදහස් දක්වන්න පුළුවන්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පුළුවන්. පුළුවන්. ගැටලුවක් නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය නීතිඥවරියක් හැටියට කරුණු ගෙනහැර පෑවා. නීතිමය කරුණු ඉතා වැදගත් වුණත් මම හිතනවා, සම්ප්‍රදායික කරුණු ගැන පොඩ්ඩක් සැලකිලිමත් වෙන්න ඕනෑ. දැන් ආණ්ඩුකාරතුමා අදහස් කරලා තිබෙන්නේ ප්‍රධාන අමාත්‍යවරයාගෙන් විමසලා කරන්නය කියලා. මම හිතන්නේ ඒක හරි වැදගත්. අභිමතානුසාරී බලය අමාත්‍යවරයෙක්ට තිබුණත් ප්‍රධාන අමාත්‍යවරයා තමයි, ඉසුර දේවප්‍රිය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මේක අපි කථා කරන්න ඕනෑ නම් සභා අවස්ථාවෙන් පූර්ණ කාරක සභා අවස්ථාවට යන්න ඕනෑ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වෙනත් අධිකාරීවල එහෙම එකක්වත් නැහැ. වෙන කෙනෙක් විමසන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙමනම් අපි සභාවේ එකඟතාවය මත -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

එහෙනම් සාකච්ඡා නොකර සම්මත කරනවාද? එහෙමද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සම්මත කරන්න තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නැත්නම් අපට මේක මෙහෙම යන්න බැහැ නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එහෙම යන්න බැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

එහෙමනම් ආණ්ඩුකාරතුමා එවපු විධියටම සම්මත -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙමනම් සභාවට යෝජනා කරන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නැහැ. කලින් ප්‍රඥප්තිය විධියට සම්මත වෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ නිර්දේශ අනුව මේක සම්මත කරන්න තිබෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැහැ. නැහැ. ගරු සභාපතිතුමනි, පොඩි කාරණාවක් තිබෙනවා. ප්‍රඥප්ති හා නීති එකේ මොනවා කිව්වත් මේ සංශෝධය ඉදිරිපත් කළේ ආණ්ඩුකාරතුමා. හරිද? මහ ඇමැතිගෙන් විමසන්න ඕනෑය කියලා. අනික් එක මේක පටලවා ගන්න ඕනෑ නැහැ. මේ මන්ත්‍රීවරුත්. මෙකී තනතුර, දැන් Tourist board එකට හරි, පරිසරයට හරි වෙන එකකට දානවා නම් දේශපාලන කෙනෙක් දාන්න පුළුවන්. විපක්ෂ නායකතුමා. හරිද? එයාට විෂයානුබද්ධ දැනීමක් තිබෙන එක පිළිබඳ කාරණාවක් නොවෙයි. නමුත් අපි දන්නවා, රජයේ ආයතනවලට, සංස්ථාවලට පත් කරන කොට ඒ Subject එකට නැති අයත් දානවා නේ ගරු මන්ත්‍රීතුමා. නමුත් මේක ගරු මන්ත්‍රීවරු පටලවා ගන්න එපා. මේ කියන තනතුර එහෙම දේශපාලන වශයෙන් දාන්න බැහැ. තොරතුරු තාක්ෂණ අධිකාරියේ සභාපති දානවා නම් ගරු සභාපතිතුමා මේකට තිබෙනවා, අපි නොවෙයි. අපි එන්න ඉස්සෙල්ලා කරපු සුදුසුකම් වගයක්. මේ මේ සුදුසුකම් තිබෙන්න ඕනෑය කියලා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒ සියලු දේම ඇතුළත්ව තමයි තිබෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔව්. හරිද? දැන් අපේ අධිකාරියකට ඕනෑ කෙනෙක් දාගන්න පුළුවන්. විශේෂ දැනුම නැති කෙනෙක් වුණත් දානවා නේ. අපේ රටේ එහෙම වෙලා තිබෙනවා නේ. නමුත් මේකට එහෙම දාන්න බැහැ. එතකොට මේකේදී ආණ්ඩුකාරතුමා තමයි - මේක අපෙන් විමසුවා කියලා දැන් මම වාගේ මහ ඇමැති කෙනෙක් නම් ඕක විමසන්න යන්නේ නැහැ. දැන් මම මෙච්චර කාලයක් ඕක හෙව්වේ නැහැ. ඕකේ අර අපේ නෙලුක් මල්ලව හිටියා නේ? මම ඕක සොයන්න ගියේ නැහැ. මොකද, ඒක මෙතුමාගේ කියලා මමත් සිටියේ. නමුත් නැවත පත් කරනවා නම්, ඒකත් කරන්න ඕනෑ මගෙන්. එහෙමනම් මගෙන් විමසන්න ඕනෑ. ඉතින් මම අහන්නේ මේ ප්‍රඥප්තියට ඒක ඇතුළත් වුණාම ඇති වරද මොකක්ද?

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ප්‍රධාන අමාත්‍යවරයා තමයි ප්‍රධානියා. එතුමා දැනුවත් වෙන්න ඕනෑ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

හොඳයි. දැන් මෙතුමාට නේ ඕක තිබ්බේ. මම ඔය තොරුතුරු තාක්ෂණය ගැන සොයන්න ගියේ නැහැ, සිරිකමල් ගරු මන්ත්‍රීතුමා. නමුත් එතුමාට කාලය දීර්ඝ කිරීම ආවා. ඒක කරන්නත් ඕනෑ මම. මේක මේ අපි හදපු එකක් නොවෙයි. සභාව නොමඟ යවන්න එපා. මන්ත්‍රීවරු නොමඟ යන්න එපා. මට වැඩක් නැහැ. මොකක් හරි කරදරයක් වුණේ නැත්නම් මම 2019 ගෙදර යනවා. නමුත් ඊළඟටත් මහ ඇමැති කෙනෙක් එනවා. එයාටත් මේ විෂයය එන්න පුළුවන්. අර හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේක මගේ ප්‍රශ්නයක් නොවෙයි. මේක තිබුණා. එහෙම නම් නෙලුක් මල්ලවගේ කාලය ඉකුත් වන කොට නෙලුක් මල්ලවට තිබුණා නේ අපේ අධ්‍යාපන ඇමැතිතුමාගෙන් බේරගන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඒක නේ දැන් මේ වෙනත් ප්‍රශ්න වෙලා තිබෙන්නේ. අයාලේ යන්නේ ඒක නේ?

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මම හිතන්නේ සාමාන්‍ය සම්ප්‍රදායක් නැහැ, ආණ්ඩුකාරවරයා විසින් එවන යෝජනාවක් ප්‍රතික්ෂේප කරන්න. කථා කරන්න පුළුවන්. නමුත් ප්‍රතික්ෂේප කරන්න?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගටම මෙහෙම අදහස් ප්‍රකාශ කරන්න දෙන්න බැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මට විනාඩියක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සම්බන්ධයෙන් අපේ ප්‍රඥප්ති හා නීති කාරක සභාව ගත්තු තීරණ තිබෙනවා නේ? ඒ කාරක සභාව දිගින් දිගටම මේ ගැන සාකච්ඡා කළා. මේ ආණ්ඩුකාරතුමා එවපු සංශෝධන පිළිබඳව සාකච්ඡා කළා. අද අපට යන්න තිබෙන්නේ ඒ සාකච්ඡාවේ නිර්දේශයි, -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒක සම්මත කරනවාද නැද්ද කියන එකයි තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩුකාරතුමාගේ සංශෝධනයි අතර සභාවේ එකඟතාවය ප්‍රකාශ කරන්න විතරයි තිබෙන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේක විවාදයකට යන්න පුළුවන් වෙලාවක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොරුවට යන්න ඕනෑ නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේක තුන්වැනි වර කියවලා ඉවරයි. ඒක නිසා මේක පැහැදිලි කර ගැනීමක් කරගෙන, සම්මත කරන්න තිබෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ප්‍රඥප්ති හා නීති කාරක සභාවට එහෙම කරන්න බැහැ. මේක පළාත් සභාවේ ඒ සම්බන්ධව නිපුණතාවයක් තිබෙන අයෙක්, පත් කරන්න ඕනෑ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පුංචි කාලයක් මම ඔබතුමාටත් දෙන්නම්. මේ සම්බන්ධයෙන් මහන්සි වුණ -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඒ ගැන පොඩ්ඩක් පැහැදිලි කිරීමක් කරන්න කෝ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

පළාත් සභාව විසින් යම් ප්‍රඥප්තියක් තුන්වන වර කියවලා සම්මත කළාට පස්සේ ගරු ආණ්ඩුකාරතුමාගේ අත්සන සඳහා යොමු කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ 154 අනුව සිද්ධ වෙනවා. ඒ අනුව 154 ඌ(3) යටතේ ආණ්ඩුකාරතුමාට හැකියාව තිබෙනවා,

[ගරු කේ.ඩී. අරුණ දීපාල්]

ඒ සම්මත කරන ලද ප්‍රඥප්තිය ආණ්ඩුකාරතුමාගේ අත්සන නොතබා නැවත යම් සංශෝධන සහිතව, එතුමාගේ සංශෝධන සහිතව මෙන්න මේ සංශෝධන නැවත පළාත් සභාව විසින් සලකා බලන්නය කියන සංදේශයත් එක්ක පළාත් සභාව වෙත යොමු කරන්න. දැන් අපි මේ මුහුණ දීලා ඉන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඌ(3) යටතේ තිබෙන මෙන්න මේ නීතිමය අවස්ථාවට. ඒ නීතිමය අවස්ථාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සඳහන් කරන්නේ,

*"ආණ්ඩුකාරවරයා විසින් (2) වන අනු ව්‍යවස්ථාව යටතේ පළාත් සභාවක් වෙත ප්‍රඥප්තියක් ආපසු එවනු ලැබූ අවස්ථාවක, පළාත් සභාව විසින් ආණ්ඩුකාරවරයාගේ පණිවුඩය කෙරෙහි සැලකිල්ල ඇතිව ප්‍රඥප්තිය නැවත සලකා බැලිය යුතු අතර සංශෝධන සහිතව හෝ රහිතව එම ප්‍රඥප්තිය සම්මත කර, ආණ්ඩුකාරවරයාගේ අනුමතය සඳහා ඔහු වෙත ඉදිරිපත් කළ හැකිය"* කියලා.

ඒ නිසා ප්‍රඥප්ති කාරක සභාවට ආණ්ඩුකාරතුමා අවස්ථා දෙකකදී එවන ලද ලිපි දෙකක් මගින් සංශෝධන දක්වලා තිබෙනවා. ප්‍රඥප්ති කාරක සභාව අවස්ථා තුනකදී රැස් වෙලා, මේ කාරණය සම්බන්ධයෙන් සාකච්ඡා කළා. ඒ තුන්වැනි අවස්ථාවේදී විෂයය භාර අමාත්‍යවරයා විසින් පළාත් සභාවෙන් ඉල්ලීමක් කළා. මේ සම්බන්ධයෙන් ප්‍රඥප්ති කාරක සභාවට ඔහුගේ අදහස් දැක්වීමට අවස්ථාවක් දෙන්නය කියලා. ඒ අනුව එතුමාගේ ලේකම්වරයෙක් සහ තවත් නිලධාරිවරයෙක් පැමිණියා. ඒ ලේකම්වරයාගේ සහ පැමිණි නිලධාරියාගේ අදහසුත් සැලකිල්ලට අරගෙන, ප්‍රඥප්ති කාරක සභාව අද දින ඔබතුමාගේ මේ සභාවට මේ ප්‍රඥප්ති කාරක සභාවේ සංශෝධන යෝජනා කරන ආකාරය - ප්‍රඥප්ති කාරක සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා යෝජනා කරන ආකාරය සඳහන් වාර්තාවක් සභාගත කරලා තිබෙනවා.

ඒ වාර්තාවට අනුව එකේ සිට අනු අංක කරන ලද අංක 06 ක් යටතේ මේ සංශෝධන 06 ක් තිබෙනවා. මේ සංශෝධන හයෙන් සංශෝධන තුනක පළාත් සභාව විසින්, ඒ කියන්නේ ආණ්ඩුකාරතුමාගේ සංශෝධන පිළිබඳව සාකච්ඡා කරලා මේ සංශෝධන ටික පළාත් සභාවට එවලා තිබෙනවා. දැන් මේක සාකච්ඡා කරන්න ඕනෑ. ඒ සාකච්ඡා කරලා තමයි මේ පනතේ තිබෙන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයට අනුව මේක නැවත සම්මත කරන්න ඕනෑ. එලෙස නැවත සම්මත කරලා තමයි ඕනෑ නම් සංශෝධන රහිතව පුළුවන්. ඕනෑ නම් සංශෝධන සහිතව පුළුවන්. හැබැයි පනත සාකච්ඡා කරන්න බැහැ. ඒ සංශෝධන, ඒ කියන්නේ ආණ්ඩුකාරතුමා යොමු කරලා තිබෙන කාරණාවලට පමණක් මේ සාකච්ඡාව සීමා වෙලා නැවත සම්මත කරලා ආණ්ඩුකාරතුමාට යවන්න ඕනෑ. ඒ අනුව මෙහි අනිකුත් කාරණාවලදී ප්‍රඥප්ති කාරක සභාවේ, ඔබතුමාගේ අතේ තිබෙන, දෙවැනි අනු අංකය යටතේ තිබෙන සංශෝධන යෝජනාව හැර අනික් යෝජනා සම්බන්ධයෙන් ප්‍රඥප්ති කාරක සභාවේ ඒකමතික තීරණයක් තිබෙනවා. දෙවැනි යෝජනාව සම්බන්ධයෙන් ජනාධිපති නීතිඥ ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේත් මගෙත් වෙනස් මතයක් තිබෙනවා. අනික් මන්ත්‍රීවරුන්ගේ වෙනස් මතයක් තිබෙනවා. ඒ ඕකේ දෙවැනි අනු අංකය යටතේ තිබෙන කාරණාව. අනික් සියලුම කාරණා සම්බන්ධයෙන් ප්‍රඥප්ති කාරක සභාවේ හැම දෙනාගේම තිබෙන්නේ එක මතයක්. ඒ නිසා මේ කාරණය සම්බන්ධයෙන් පළාත් සභාව සුදුසු පරිදි මේ නීතියට අනුව, පනතට අනුව කටයුතු කිරීම තමයි මේ වෙලාවේ කරන්න ඕනෑ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඔබතුමන්ලාගේ මතය ප්‍රකාශ කරන්න පුළුවන්ද?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඔය සභාගත කරපු කොළයේ තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ පිළිබඳව සභාවේ සාකච්ඡාවකට යනවා නම් අපට සිද්ධ වෙනවා, සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් කරන්න. එහෙම පත් කරලා තමයි අපට මේ ගැන සාකච්ඡා කරන්න වෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ප්‍රඥප්ති කාරක සභාව පත් කරලා තිබෙන්නේ, දැන් ඒ අය මේක සම්බන්ධයෙන් සාකච්ඡා

කරලා තීරණයකට ඇවිල්ලා තිබෙනවා. මම හිතන්නේ මේ ගරු සභාව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තීරණයකට ඇවිල්ලා නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමන්ලා ඇවිල්ලා තිබෙනවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලබා දීලා තිබෙන්නේ නිර්දේශ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නිර්දේශයකට ඇවිල්ලා තිබෙනවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කරුණාකර වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒ නිර්දේශ අනුව මේක සම්මත කරන්න. එච්චරයි. ආයේ මේකේ කථා කරන්න දෙයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නිර්දේශ ඇවිල්ලා තිබෙන්නේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙහෙම දෙන්න බැහැ. ඔබතුමා පොඩ්ඩක් වාඩි වෙන්න කෝ. අපි මේ සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් කරමු. ඊට පස්සේ සාකච්ඡා කරමු. නැත්නම් මේක එක එක්කෙනා කථා කරනවා. ඉවරයක් වෙන්නේ නැහැ නේ? ඔබතුමා නැඟිටිනවා. එතුමන්ලා ඉන්නවා. ගරු සභා නායකතුමා යෝජනා කරන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

කාරක සභා අවස්ථාවට පත් කරන්නද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඇමැතිවරයෙක්ද? එහෙමනම් ඇමැතිවරයෙක්ට කියන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කළබල වෙන්න එපා.

## පූර්ණ කාරක සභාව
## COMMITTEE OF THE WHOLE COUNCIL

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, "*මෙම සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් කළ යුතු යැයි*" යෝජනා කරනවා.

***ඊට අනුකූලව පළාත් සභාව පූර්ණ කාරක සභාව බවට පරිවර්තනය විය.***
*Accordingly, the Provincial Council resolved itself into a Committee of the whole Council.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ අනුව මේ අවස්ථාවේදී ගරු සභාව පූර්ණ කාරක සභා අවස්ථාවට පත් වෙනවා. සෙංකෝලය ස්ථානගත කරන්න. මේ සම්බන්ධයෙන් මම අර මුලින් කිව්වා වාගේ ප්‍රඥප්ති හා නීති කාරක සභාවත් යම් යම් නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කරලා තිබෙනවා. හයක් සම්බන්ධව. අපේ අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, ඒ පිළිබඳවත් ඒ කාරක සභාවේත් යම් යම් පොඩි පොඩි මතවාද කිහිපයක් ආවා කියන එක. අපේ ගරු ඇමැතිතුමාටත් අනිවාර්යයෙන්ම

[ගරු සභාපතිතුමා]

අවස්ථාව ලබා දෙන්න ඕනෑ. සාකච්ඡා කරලා ආණ්ඩුකාරතුමාට මතය අරින්න ඕනෑ. ඒක තමයි කෙටිම දේ. එච්චරයි තිබෙන්නේ. ඒ නිසා අපි සාකච්ඡාවට යමු. මට ඕනෑ නම් කියන්න පුළුවන්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, 3(අ) යන්න. නිල බලයෙන් පත්වන සාමාජිකයන්. රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය කිව්වා, ගණපූරණය තුන් දෙනෙක් සිටිය යුතුයි කියලා. මීට ඉහත අපි ඉදිරිපත් කරලා තිබුණා. මොකද නිල බලයෙන් නිලධාරීන් හතර දෙනෙක් පත් වෙනවා. ඒ වාගේම අමාත්‍යවරයා විසින් නම් කරන සාමාජිකයන් තිදෙනෙක්. ගණපූරණය තිදෙනෙක් වුණොත් අමාත්‍යවරයා විසින් පත් කරන තිදෙනාට පුළුවන් ගණපූරණය පවත්වාගෙන, රැස්වීම් පවත්වාගෙන යන්න. අන්න ඒ නිසා තමයි මේ තුන් දෙනා වැඩි කරන්න කියන ඉල්ලීම කෙරුවේ. නැවතත් ඒක තිදෙනෙකු හැටියට සිටිය යුතුයි කියලා තිබෙනවා. රැස්වීමේ ගණපූරණයට වැඩිය එදා අපි අදහස් කළේ ගණපූරණය නිලධාරීන් නැතිව පවත්වාගෙන ගියොත් නිලධාරීන් දන්නේ නැහැ ගන්න තීන්දුව මොකක්ද කියලා. ඒ නිසා නිලධාරියෙක් ඇතිව තමයි තුන්දෙනා විය යුතුය කියලා එදා අපි යෝජනා කළා. මම හිතන්නේ මෙතැන ඒ යෝජනාව නැහැ. මීට ඉහත තිබුණු එකේදී ආණ්ඩුකාරතුමා ඉදිරිපත් කරපු එකේ ඒ යෝජනාව තිබුණා. මම හිතන්නේ අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා මේක -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ආණ්ඩුකාරතුමා හතර දෙනෙක් කියලා තිබුණේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු මන්ත්‍රීතුමිය, හතර දෙනෙක් යෝජනා කළේ අමාත්‍යවරයා පත් කරන තිදෙනාට පමණක් නිලධාරීන් නැතිව පවත්වාගෙන යන්න පුළුවන් නිසා. ඒ නිසා මේක -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අමාත්‍යවරයාට බලය තිබෙන්න ඕනෑ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නැහැ. අමාත්‍යවරයා විසින් පත් කරන තුන් දෙනා විතරක් ගණපූරණය ඇතිව රැස්වීමක් අරගෙන ගියොත් නිලධාරීන් නැතිව අරගෙන යන්න පුළුවන්. ඒ නිසා තමයි හතර දෙනෙක් පත් කරන්න කිව්වේ. නිලධාරියෙක් ඇතුළුව කියලා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අමාත්‍යවරයාට බලය තිබෙන්න ඕනෑ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

බලය තිබෙන එක නොවෙයි, එතැන තිබෙන්නේ. අමාත්‍යවරයා විසින් පත් කරන තුන් දෙනෙකුට රැස්වීමක් පවත්වාගෙන යන්න බලය තිබුණොත් ගරු සභාපතිතුමනි, නිලධාරීන් නැතිව කරගෙන යන්න පුළුවන්. එදා අපි ගණපූරණයට හතර දෙනෙක් ඉදිරිපත් කරන්නය කියලා කිව්වේ, ඒ නිසයි. එදා අපි කිව්වේ, නිලධාරියෙක් ඇතුළුව තුන් දෙනෙක් නම් කරන්න කියලා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

හතර කරන්න බැහැ. එහෙමනම් පහක් ඕනෑ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නැහැ. නැහැ. අපි කියන්නේ නිලධාරියෙක් ඇතුළුව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපේ ගරු අධ්‍යාපන ඇමැතිතුමා. ඒ සම්බන්ධව තවත් අදහස් තිබෙනවාද? මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කරපු ඒ කාරණා සම්බන්ධයෙන්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, ගණපූරණය තුන්දෙනෙක් වුණාට කමක් නැහැ. නිලධාරියෙක් ඇතුළුව තුන් දෙනෙක් වෙන්න ඕනෑ. එහෙම නිලධාරියෙක් නැති වුණොත් තුන් දෙනාට මේක පවත්වාගෙන යන්න පුළුවන්.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, සාමාන්‍ය සම්ප්‍රදාය තුළ විෂයය තිබෙන අමාත්‍යවරයාට තමයි පත්කිරීම් සහ - ව්‍යවස්ථාපිත තත්ත්වයට ඉහළින් මම මේ කියන්නේ. ඉවත් කිරීම ආදී වගකීම දැනෙන්නේ. මට අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය, අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කළෙත් ඒක. පසුගිය අවස්ථාවේදී, මීට කලින් ඉදිරිපත් කරපු වෙලාවේ අර්බුදකාරී මතයක් ගොඩනැඟුනා විෂයය භාර අමාත්‍යවරයා නොව ප්‍රධාන ඇමැතිවරයා විමසා කටයුතු කළ යුතුයි කියලා. ප්‍රධාන අමාත්‍යවරයායි මගෙයි අතර එහෙම පුද්ගලිකව හෝ සභාවේ විරසකයක් මොකුත් නැහැ. නමුත් අපි සොයලා බැලුවාම මෙවැනි ක්‍රමවේදයක් ලංකාවේ කොහෙවත් සිද්ධ වෙලා නැහැ. අධිකාරියක බලය, සභාපතිවරයා හෝ වෙනත් නිලධාරීන් පත් කිරීමේ ව්‍යවස්ථාපිත තත්ත්වයෙන් බැහැර බලය ලැබෙන්නේ අමාත්‍යවරයාට. ඒ නිසාවෙන් තමයි මම ඉදිරිපත් කළේ, විෂයය මගේ අතේ. ඒ කියන්නේ අලියා මගේ අතේ. හෙණ්ඩුව වෙන කෙනෙක් අතේ. ඒ නිසා මෙතෙක් කල් එසේ සිද්ධ නොවී තිබුණු නිසා මම ප්‍රඥප්ති හා නීති කාරක සභාවට ඉදිරිපත් කළා, මේ කාරණාව මට විමසලා ඉදිරිපත් කරන්නය කියලා. ඔවුන් ඉදිරිපත් කරලා තිබෙනවා - මගේ ලේකම්තුමා සහ මගේ නිලධාරියෙක් සහභාගි වෙලා තිබෙනවා. විෂයයට අදාළ ඇමැතිවරයාට තමයි මේ බලය සතු විය යුත්තේ කියලා. හේතුව, මේ පත්කිරීම නිසාවෙන් ඒ පත් වන පුද්ගලයාගේ යම් යම් ක්‍රියාකාරකම්, ඔහුගේ නොමනා හැසිරීම් ස්වභාවයක් තිබුණොත්, ඒ වැඩ කටයුතු නිවැරදි විධියට නොකෙරී තිබුණොත්, ඒ විෂයයේ වගකීම දරන්නේ නැතිව ඔහු දුර්වල කෙනෙක් වුණොත්, ඒ විෂයයට අදාළ ඇමැතිවරයාට තමයි - මම රංජිත් සෝමවංශ අද. හෙට වෙන කෙනෙක් වෙන්න පුළුවන්. ඔහුට තමයි මේ වගකීම් පැවරෙන්නේ.

ඒ නිසාවෙන් තමන්ගේ යටතේ තිබෙන අධිකාරියක හෝ ආයතනයක මේ පත් කිරීම විෂයය භාර ඇමැතිවරයාට ලබා දීම සුදුසුයි කියලා තමයි මම ඉදිරිපත් කළේ ගරු සභාපතිතුමනි. බොහොම ස්තුතියි. නැතුව මේ ආණ්ඩුකාරතුමාගේ යෝජනාවට එරෙහි වීමක් නොවෙයි. ඉතාම ගෞරවාන්විතව මම අපේ ගරු මන්ත්‍රීතුමියගේ අදහස් අනුමත කරනවා. ඇමැතිවරයා හැටියට අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාගේ අදහස් මම අනුමත කරනවා. ඉතාම ගෞරවාන්විතව මම ආණ්ඩුකාරතුමාට මේක ඉදිරිපත් කරනවා. මේ කාරණාව විෂයය භාර අමාත්‍යවරයාට වගකීම් පැවරෙන ලෙස ඉෂ්ට කර දෙන්න. නැතුව මෙතැන මේ වෙනත් කිසිඳු බේදයක් මෙතැන නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, මෙහි ගණපූරණය සම්බන්ධ ප්‍රශ්නය සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න මම අවසර ඉල්ලනවා. මේ අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, අමාත්‍යවරයා නිලධාරීන් තුන් දෙනෙක් පත් කරද්දී නිල වශයෙන් හතර දෙනෙක් මේ කළමනාකරණ මණ්ඩලයට පත් වෙනවා. සියලු දෙනාම හත් දෙනෙක්. යම්කිසි තීන්දුවක් ගන්නවා නම් මේ හත් දෙනාම සහභාගි වෙනවා නම් ගැටලුවක් නැහැ. හදිසියේ සහභාගි නොවුණු අවස්ථාවක තීන්දුවක් ගන්නවා නම් තමයි ඔය ගැටලුව ඇති වෙන්නේ. මෙහිදී අපට තිබෙන්නේ, යම්කිසි අගතිකාරී දෙයක් සිද්ධ වෙනවා නම්, මේ හත් දෙනාම සහභාගි වෙනවා නම් ඒකේ බහුතරය තීන්දුව ගන්නවා. අඩුම වශයෙන් ගණපූරණය තුනක් කියන එකයි සඳහන් වන්නේ. ඒක මම හිතන්නේ තීන්දු තීරණ ගනිද්දී අධිකාරී බලයක් ඇමැතිවරයාට තිබෙනවා කියන එක අදහස් වෙන්නේ නැහැ. ප්‍රධානම දේ මේ න්‍යාය පත්‍රය කලින් යැව්වාට මේක කියවලා එන්නේ නැතිකමයි තිබෙන්නේ. මෙතැන ගැටලුව. කළමනාකරණ මණ්ඩලයේ මෙතැන හත් දෙනෙක් ඉන්නවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගණපූරණය කියන්නේ මෙහෙමයි. මොන රැස්වීමකටවත් සියලුම දෙනා සහභාගි වෙන්නේ නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒක හරි. යම්කිසි දෙයක් තීන්දු ගන්නවා නම් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, දැන් පළාත් සභාවේ රැස්වීමටත් සහභාගි වෙන්නේ නැහැ නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

තමන්ට උනන්දුවක් තිබෙනවා නම් මේක වැරැදි දෙයක් කියලා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

උනන්දුව තිබුණත් එන්නේ නැහැ නේ ගරු මන්ත්‍රීතුමිය? දැන් මේ පළාත් සභාවට 104 එනවාද ජීවිතේට?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අවමය තුන් දෙනයි කියන එක තිබෙන්නේ. ඒක කිසිම බාධාවක් නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අවමය ගණපූරණය කියන කොට ගණපූරණයට නිලධාරියා ඇතුළත් වෙන්න ඕනෑ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒකට නීතිමය කාරණාවක් වශයෙන් බාධාවක් වෙන්නේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමා, හත් දෙනා කවදාවත් රැස්වීමට එන්නේ නැහැ නේ ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

හත් දෙනෙක් ඉන්නවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මේකේ 104 ක් ඉන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අවම වශයෙන් තුනක් කියලා කියන්නේ. හත් දෙනාටම ඉන්න පුළුවන්. ඒක ගැටලුවක් වෙන්නේ නැහැ. නීතිමය වශයෙන්.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

හත් දෙනාම සහභාගි වෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එන්නේ නැති වෙලාවට. තුන් දෙනෙක් ඇවිල්ලා? ගණපූරණය කිව්වාම ඒක තිබෙන්න ඕනෑ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව අදහස් හුවමාරු වුණා. මම කියන්නේ ප්‍රධාන අමාත්‍යවරයා විමසීම කියන කාරණය සම්බන්ධව. මගේ කල්‍යාණ මිත්‍ර මගේ ගරු අධ්‍යාපන ඇමැතිතුමා කියපු කාරණාව මට පුළුවන් විධියට මම පහදනවා. එතුමා කිව්වේ. හෙණ්ඩුව එක තැනක. අලියා එතුමාගේ කියලා. නැහැ. මම කියන්නේ, හෙණ්ඩුවයි අලියයි දෙන්නාම ඇමැතිතුමා ළඟ තිබෙන්නේ. හැබැයි, මේ අලියාව කොහාට හරි නාවන්න යනවා නම් ප්‍රධානියා දැනගන්න ඕනෑ, මේ නාවන්න යන්නේ කියලා. අන්න ඒ වාගේ එකක්. ඒ නිසා ඉසුරු දේවප්‍රිය හැටියට නොවෙයි. කවුරු ප්‍රධාන අමාත්‍යවරයා වුණත් ඒ ආයතනයේ වෙන දේවල් පිළිබඳව දැනුවත් වෙන්න ඕනෑ. ඒකයි විමසා කියන්නේ. අනුමැතිය නොවෙයි. ප්‍රධාන අමාත්‍යවරයාගෙන් අනුමැතිය ගත යුතුයි කියන කාරණාව නොවෙයි මෙතැන ආණ්ඩුකාරවරයා කියලා තිබෙන්නේ. ගන්නා තීන්දු තීරණ පිළිබඳව එතුමාගෙන් විමසීම කළ යුතුයි කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නොකියා නාවන්න එපා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඉතින් මේක මම හිතන්නේ -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඇමැතිතුමා නාගන්න ඉස්සෙල්ලා මහ ඇමැතිතුමාට කියන්න ඕනෑ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මේ කාරණාවේදී ඉදිරියටත් මේක පැවැතෙන්න ඕනෑ නිසා මම හිතනවා - මම සත්භාවයෙන් කියන්නේ. ප්‍රධාන අමාත්‍යවරයා විමසිය යුතුයි කියන කාරණාව ඒක හරියි කියලයි මගේ මතය.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

සබන් ද දන්නේ නැහැ ගාන්නේ, මේ අලියා නාවන කොට.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව සම්මත කරලා අවසන් කරන්න පුළුවන්කම තිබෙනවා. කාලය නාස්ති කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, කථා කරන්න විනාඩියක් දෙන්න. දැන් නොයෙකුත් සම්ප්‍රදායන් ගැනත් කථා කළා. සාමාන්‍යයෙන් ඇමැතිවරයෙක් යටතේ තිබෙන ආයතනයක පත්වීම් කරන්නේ ඇමැතිවරයා. ඒක පළාත් සභාවේ විතරක් නොවෙයි. මහ ආණ්ඩුවෙත් වෙන්නේ එහෙමයි. ඒ සම්බන්ධයෙන් මහ ඇමැතිවරයාව දැනුවත් කරන එක ඇමැතිවරයාගෙයි මහ ඇමැතිවරයාගෙයි තිබෙන සම්බන්ධය අනුව ඒක වෙනවා. නමුත් දැන් ඇමැතිවරයෙකුගේ අමාත්‍යාංශයක් යටතේ තිබෙන ආයතනවලට පත් කරද්දී ඒක කරන්න අමාත්‍යවරයාට බලය දීලා තිබෙනවා. එතකොට අගමැතිතුමා හරි ජනාධිපතිතුමා හරි ඒ සම්බන්ධයෙන් කොහොමත් දැනුවත් කරනවා. මහ ඇමැතිතුමා යටතේ ඇමැතිවරු පත් කරලා තිබෙන්නේ, එතුමාගේ විශ්වාසය තිබෙන හින්දා නේ? ඉතින් ඒක නිසා මේක ආයෙත් අහ අහා ඉන්න දෙයක් නැහැ. මේ බලය ඇමැතිතුමාට දෙන්න. ඇමැතිතුමාට මේකේ බලය දීලා, මේකට වග කියන්න ඕනෑ එතකොට ඇමැතිතුමා. එතකොට මහ ඇමැතිතුමා වග කියන්න ඕනෑ නැහැ. හැබැයි, ඒ අමාත්‍ය මණ්ඩලය ඇතුළේ ඒක සාමූහිකව වෙන්න ඕනෑ වැඩක්. අපි ඒක ආයේ කියන්න ඕනෑ නැහැ. ආයෙත් අපි කියන්න ඕනෑ නැහැ, මහ ඇමැතිවරයාගෙන් අහලා පත් කරන්න ඕනෑය කියලා. එතුමන්ලා ඒක එකඟතාවයකින් පත් වෙනවා නම් පත් කරනවා. සාමාන්‍යයෙන් සම්ප්‍රදාය ඒකයි. ඒ අනුව අපේ කාරක සභාව යෝජනා කරලා තිබෙන විධියට මේක සම්මත කරන්න කියලා මම සභාවට යෝජනා කරනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මෙතැන එහෙම මොකුත් ප්‍රශ්නයක් නැහැ. අලියා නාවන එකේ සබන් මොනවද ගාන්නේ කියන එක නම් මම දන්නේ නැහැ. හැබැයි, මේක අපේ මහ ඇමැතිතුමාගෙයි මගෙයි අතර ප්‍රශ්නයකුත් නැහැ. රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය, අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා, අපේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ දැන් මහ ඇමැතිතුමාගෙන් විමසලා කටයුතු කිරීමට මම එකඟයි. ඒ ගැන ගැටලුවක් නැහැ නේ. ප්‍රශ්නයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්නය ඉවර නේ ඉතින්.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඇමැතිතුමාට ප්‍රශ්නයක් නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

හැබැයි, අපි කිව්වේ මේක සම්ප්‍රදානුකූලව - මේක ගැටලුවක්. මට විනාඩියක් දෙන්න. සම්ප්‍රදානුකූලව - ඒක අපි දෙන්නා අතර තිබෙන දෙයක්. සාමාන්‍යයෙන් විෂය භාරව - අපේ මන්ත්‍රීතුමන්ලා තුන්පළම සඳහන් කළා වාගේ විෂයයක් තිබෙන ඇමැතිවරයෙකුට තමයි මේ බලය තිබෙන්නේ. අපේ සභාවේ තිබෙන මිත්‍රත්වය සහ බැඳීම තුළ අපට සුහදව කටයුතු කරන්න බැරි කමක් නැහැ. අන්‍යෝන්‍ය සුහදතාවයෙන් යුතුව කටයුතු කරන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා - දැන එකඟයි නේද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි. එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම හිතන්නේ මේ සම්බන්ධයෙන් සභාව කිසිම බේදයක් නැතිව එකඟ වුණා. දැන් නීති කාරක සභාව ඉදිරිපත් කරපු සංශෝධනවලට සහ ආණ්ඩුකාරතුමා ඉදිරිපත් කරපු සංශෝධනවලට මුළු සභාවම එකඟයි. මේක ඉතින් ප්‍රශ්නයක් නැහැ. අලියා ගාන සබන් මොනවාද කියලා මම දන්නේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නාන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැබැයි, සභාවේ අනික් අය නම් මත ඉදිරිපත් කළා. ජනතා විමුක්ති පෙරමුණේ අය නම් පොඩ්ඩක් සද්ද නැතිව ඉන්නවා. කමක් නැහැ. එහෙම ඉන්න එක හොඳයි. මොකුත් ප්‍රකාශ කළේ නැහැ. මධ්‍යස්ථව ඉන්නවා. එහෙමනම් මේ ආණ්ඩුකාරතුමා එවන ලද ඒ සංශෝධන පිළිබඳව ගරු සභාවේ එකඟතාවය අනුව -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කාරක සභාවේත්, ආණ්ඩුකාරතුමාගේත් සංශෝධන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙකේම. ඒ කියන්නේ කාරක සභාවේත්, ආණ්ඩුකාරතුමාගේත් සංශෝධන එකඟතාවය මත සභා සම්මත වූ බව මේ අවස්ථාවේ මම ප්‍රකාශ කර සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව දිගින් දිගටම අපේ ප්‍රඥප්ති හා නීති කාරක සභාවේත් ගරු මන්ත්‍රීතුමල්ලා තුමියන්ලා දැඩි කැපවීමකින් කටයුතු කළා. ඒ නිසාවෙන් ගරු සභාපතිතුමාට ප්‍රථම වශයෙනුත් ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මගේ යුතුකමක්. ඒ වාගේම ගරු මන්ත්‍රීතුමිය, ගරු මන්ත්‍රීතුමන්ලා සියලු දෙනාටම මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, ඔබතුමා තීරණය කරනවා නම් මේ ප්‍රඥප්තිය සම්බන්ධයෙන් ආණ්ඩුකාරතුමා එවපු ලිපිය ප්‍රමාණවත් පරිදි සාකච්ඡා කරලා නිවැරැදිව වුණා කියලා එහෙම කළාට කමක් නැහැ. හැබැයි, මම විශ්වාස කරනවා, මේ ආණ්ඩුකාරතුමාගේ ලිපියේ තිබුණු කාරණා සංශෝධන එය ප්‍රඥප්ති කාරක සභාවෙන් දීලා තිබෙන නිර්දේශ සහ මේ සභාවේ මතයට අනුකූලව නොවෙයි වුණේ කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇත්ත. ඇත්ත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතැන පොඩි ගැටලුවක් මටත් තිබෙනවා. එතැන මත දෙකක් තිබුණේ. දැන් ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ එක මතයක් තිබෙන්නේ. ආණ්ඩුකාරතුමා එවපු සංශෝධන තව පැත්තකින් තිබෙනවා. එහෙමනම් මට වගන්ති වශයෙන්ම ගන්න සිද්ධ වෙනවා. අපි එහෙමනම් ගමු.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමා, අද සාකච්ඡා කරලා අවසන් කරමු.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු සභාපතිතුමා, ඔබතුමා ප්‍රකාශ කරන්න සම්මතයි කියලා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මෙතැන සාකච්ඡා කරලා අවසන් කරන්න ඕනෑ. ආයේ ප්‍රඥප්ති කාරක සභාවට යන්න ඕනෑ.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

සම්මතයි කියලා ඔබතුමා ප්‍රකාශ කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැබැයි, මම ප්‍රකාශ කළා. මම සභාවේ මතය ප්‍රකාශ කළා. මගේ මතය නොවෙයි. මේ සභාවේ යම් යම් අදහස් ප්‍රකාශ කළා. ආණ්ඩු පක්ෂයෙන් සහ විපක්ෂයෙන්. ඒ අනුව මම සභාවේ මතය පිළිබඳව ප්‍රකාශ කළා. එකඟතාවය.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ වෙලාවේ සාකච්ඡා කරලා අවසන් කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතැන පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, ප්‍රඥප්ති හා නීති කාරක සභාවෙන් මේ ගැන අහලා තිබෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මෙතැන සාකච්ඡා කරන්න තමයි දැන් දීලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ආණ්ඩුකාරතුමා එවලා තිබෙනවා, 3 (ආ) යන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, මම මේ අවස්ථාවේදී ඉතාම පැහැදිලිව සහ නීතියට අනුකූලව ඔබතුමාගේ අවධානය යොමු කර සිටිනවා. ගරු සභාපතිතුමනි, යම්කිසි දෙයක් ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු වුණාට පස්සේ, ඒ නිර්දේශ ඉදිරිපත් කළාම සභාව අවසාන තීන්දුව ගන්න ඕනෑ. නැවත යොමු කිරීමක් කරන්නේ නැහැ. කරන්න අවශ්‍ය නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හැබැයි කියන දේම කරන්න ඕනෑ නැහැ නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගැටලුවක් නැත්නම් සභාව සම්මත කරලා අවසන් කරන්න. ආයේ ඒ කාරක සභාවට යොමු කරන්න ඕනෑ නැහැ. කාලය නාස්ති කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගැටලුවක් නිර්මාණය වෙනවා නේ?

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ගැටලුවක් නිර්මාණය වුණා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, තවත් මේක දුරදිග ගෙනියන්න එපා. මම දැන් මේ තිලකසිරි ගරු ඇමැතිතුමාත් එක්කත් කථා කළේ. මේ ප්‍රඥප්ති මොනවා කරලා හරි මේ සභාපති තෝරන්න නේ හැදුවේ. සභාපතිතුමා තේරුවත්, මම මේ කියන්නේ, අපේ රටේ තිබෙන දේශපාලන සංස්කෘතිය අනුව, බලයේ ඉන්නේ නම් එක්සත් ජාතික පක්ෂය. ඒ නායකයා කථා කරලා අපේ මංජු ශ්‍රී අරංගල මහත්මයාට කියනවා, අර ඉන්න සභාපති අයින් කරන්න කියලා. එතකොට මොකද වෙන්නේ? දැන් අතිගරු ජනාධිපතිතුමා මට කථා කරලා කිව්වොත් හොඳයි, රංජිත් සෝමවංශ ඇමැතිතුමා පත් කරලා ඉන්න අර සභාපති අයින් කරන්න. දැන් මට පුළුවන්ද, ඇමැතිතුමාගෙන් විමසා ඉන්න. එතකොට අපි කවුරුත් කරන්න වෙනවා. ඒක නිසා මේක මේ අනවශ්‍ය ප්‍රශ්නයක් දාගන්න අවශ්‍යතාවයක් නැහැ. මොකද, මේ ආණ්ඩුකාරතුමා - අපි පිළිගන්න ඕනෑ. අපේ ගරු මන්ත්‍රීවරුත් එක්ක බොහොම සත්භාවයෙන් වැඩ කරන, නීතිගරුක, නීත්‍යානුකූල, අපේ මන්ත්‍රීවරයෙක් ගිහිල්ලා කිව්වොත් ඒ වැඩේ නීතියට හරවලා කරලා දෙන එක්කෙනෙක්. ඇත්ත කියන්න කෝ. ඒක කිසිම පළාතකට නැහැ. පරිපාලන සේවයේ ඉහළ නිලධාරියෙක් ගෙනාපු තීන්දුවක් වෙනස් කරන්න එපා. එතුමාව මම පුද්ගලිකව

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

හම්බ වෙලා සර් දාන්න කියලා මේක මේ ප්‍රඥප්තියට ගෙනාවේ නැහැ, ගරු ඇමැතිතුමා. අනික කවුරු පත් කළත් අවසානයේ කවුද තීන්දු ගන්නේ. හොඳයි, ජනාධිපතිතුමා මට කථා කළොත්, ඔය ඔක්කොම අහෝසියි නේ? ගරු විපක්ෂ නායකතුමා නේද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒවා නීතියට අදාළ නැහැ. පක්ෂ වශයෙන් කරගන්න ඒවා නීතියට අදාළ නැහැ. අපි වැඩ කරලා තිබෙන්නේ නීතියට අනුව.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ආණ්ඩුකාරතුමාගේ තීන්දුවට අපි එකඟයි. පාලක පක්ෂය එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මහ ඇමතිතුමා, දැන් මෙහෙමයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

විහිළුවක් නොවෙයි. මේක නීතියක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමිය පොඩ්ඩක් මට සමාවෙන්න. ආණ්ඩුකාරතුමාගේ මේ සංශෝධන සම්බන්ධයෙන් පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත කමිටුවකට මේක අපි ඉදිරිපත් කළා. ජනාධිපති නීතිඥ අපේ ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා. නීතිඥ මණ්ඩලයක් වාගේ. කමිටුවක්. ඒකේ යම් යම් තීන්දු ගත්තා. යම් යම් නිර්දේශ දුන්නා. එහෙමනම් මේක රැස් වෙන්න ඕනෑ නැහැ නේ?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ශ්‍රීනාත් මන්ත්‍රීතුමාගේ තීරණය මේකට පටහැනි නැහැ. එතුමා මේකට විරුද්ධ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම කිව්වේ සභාවේම යෝජනා කරපු මන්ත්‍රී කමිටුවක් අපේ තිබෙනවා. ඒ සාකච්ඡාවට, ඒ මතයට අපි පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න ඕනෑ. ආණ්ඩුකාරවරයාට අපි මොකුත් කියන්නේ නැහැ. ආණ්ඩුකාරතුමාට අපි ගරු කරනවා. ආණ්ඩුකාරතුමාගේ මතය වාගේම අපේ ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ මතයට අපි සොයා බලන්න ඕනෑ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පරස්පරයි නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, පරස්පර නැහැ. නිර්දේශ දීලා තිබෙන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පරස්පර වුණාට නීතියට පටහැනි ඒවා සම්මත කරන්න බැහැ නේ?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එහෙම එකක් නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ජනාධිපතිතුමාගෙන් වුණත් වැරැදි දෙයක් සම්මත කරන්න බැහැ. හතර දෙනෙක් කොහොමද ගණපූරණය දෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේකයි ගරු මහ අමැතිතුමා. මෙහෙම වුණොත් එහෙම ප්‍රඥප්ති හා නීති කාරක සභාව හැල්ලුවට ලක් වෙනවා. ඒකත් අපට තිබෙන ප්‍රශ්නයක්.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

හැල්ලු වෙන්නේ නැහැ. සම්ප්‍රදායක් තිබෙනවා. එහෙමනම් ඔබතුමන්ලාට කවුරු හරි වගකිවයුතු නිලධාරියෙක් කිව්වේ නැහැ. ආණ්ඩුකාරතුමා යෝජනාවක් ගෙනාවාම ඒකට සම්ප්‍රදායානුකූලව විරුද්ධ වෙන්න බැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එහෙම එකක් නැහැ. සංශෝධන සහිතව හෝ රහිතව යවන්න පුළුවන්. කැමැති නම් සහිතව. කැමැති නම් රහිතව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විෂයය භාර ඇමැතිවරයා ඉල්ලීමක් කළා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මම නොවෙයි. අපේ අධ්‍යාපන ඇමැතිතුමා උප සභාපති හැටියටත් අධ්‍යාපන ඇමැති හැටියටත් ආණ්ඩුකාරවරයා සම්බන්ධයෙන් ගැටලු මතු වුණාට පස්සේ මෙතුමාම ප්‍රකාශ කරලා නිතුක් කරලා - දැන් මතයක් නිකුත් කරලා තිබෙනවා. ආණ්ඩුකාරවරයාට විරුද්ධව කටයුතු කරන්න බැහැ. ඒක එච්චර යන්න ඕනෑ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩුකාරතුමාගේ සංශෝධනවලට අපි අභියෝග කරන්න යන්නේ නැහැ. නමුත් ගරු ඇමැතිතුමා සභාවෙන් ඉල්ලීමක් කළා, මාසයක් කල් දෙන්න. සාකච්ඡා කරලා, මගේ මතය ඉදිරිපත් කරන්න කියලා. ඒ අනුව තමයි අපි කමිටුවක් පත් කළේ. කමිටුවේ වාර ගණනක් සාකච්ඡා කළා. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා, අපේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය. නිර්දේශ දීලා තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දැන් තීන්දුවක් ගන්න බැහැ. කල් තියලා තීන්දුවක් ගන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

කල් තියන්න දෙයක් නැහැ. දිගින් දිගටම මේක - හැබැයි ආණ්ඩුකාරතුමා යම්කිසි යෝජනාවක් හෝ මේ සම්බන්ධව එතුමාගේ ලිඛිතව දැනුම් දීමක් කළා වුවත් එහි සංශෝධන සහිතව හෝ රහිතව නීතියට අනුකූල විධියට අදහස් ප්‍රකාශ කිරීම සහ ඒ සම්බන්ධව තීන්දු ගැනීමේ බලයක් ප්‍රඥප්ති හා නීති කාරක සභාවට තිබෙනවා. ගරු සභාපතිතුමනි, මම මේ ප්‍රශ්නය අවසන් කිරීම සඳහා තමයි මගේ එකඟතාවය පළ කළේ. මොකද සභාවේ ඉදිරි වැඩ කටයුතු කරගෙන යන්න මම එකඟත්වය පළ කළා. මම කියන්නේ මේකයි. ප්‍රඥප්ති හා නීති කාරක සභාවට දොස් කියන්න බැහැ. නීතියට අනුකූලද නැද්ද කියන එක තමයි එතුමන්ලා එතුමියන්ලා විග්‍රහ කරලා තිබෙන්නේ. මම විෂයය භාර ඇමැතිවරයා හැටියට මම මේකට එකඟත්වය පළ කළේ, මේ කටයුතු ඉස්සරහාට ගෙනි යන්න අපි එකඟයි කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එච්චරයි නේ. විෂයය භාර ඇමැතිවරයාත් එකඟ නම්, පාලක පක්ෂයත් එකඟ නම් ඔබතුමාට තිබෙන ප්‍රශ්නය මොකක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා මට ප්‍රශ්නයක් නැහැ. ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ නිර්දේශ මට ලබා දීලා තිබෙනවා. ඉදිරිපත් කරලා තිබෙනවා, සභාවේ මතය විමසිය යුතුයි කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔබතුමා අපට කියන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මම මේ මහ ඇමැති මානසිකත්වයෙන් නොවෙයි මම මේ කථා කරන්නේ. මට ඔබතුමා කියන්නේ උපදේශක කාරක සභාව ගත්තු තීන්දුව ද අපි අනුමත කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. උපදේශක කාරක සභාව නොවෙයි. ගරු ඇමැතිතුමා, සාකච්ඡා කරන්න ඕනෑ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ඉතාම ගෞරවයෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙමනම් ප්‍රඥප්ති හා නීති කාරක සභාවට දාන්න ඕනෑ නැහැ නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මෙතැන ගැටුමක් හදාගන්න අවශ්‍ය නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඊ වෙනකන් -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මේක සම්මත කරමු. එච්චරයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ 154 –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සාකච්ඡා නොකර මට ඒකට එකඟ වෙන්න බැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 සියලු දෙනාටම ලැබිලා තිබෙනවා, න්‍යාය පත්‍රයේ පිටපත අමුණලා තිබෙනවා. මෙහි පැහැදිලිව දෙවැනි උපවගන්තියේ තිබෙනවා, මේ ආණ්ඩුකාරවරයෙක් එවන ඒවා සංශෝධන සහිතව හෝ රහිතව අපට සම්මත කරලා යවන්න පුළුවන්. එතුමා කියන එක රහිතව යවන්නත් පුළුවන්. සහිතව යවන්නත් පුළුවන්. ඉතින් අපි නීතියට අනුකූලව සලකා බැලීමක් කරලා තිබෙනවා. ඉතින් ඒක එකඟතාවය අනුව අවසන් කරන්න තිබෙන්නේ. මෙකේ කිසිම ගැටුමක් ඇති කරගන්න අවශ්‍ය වෙන්නේ නැහැ. සහිතව හෝ රහිතව අරින්න පුළුවන්. දැන් අපි රහිතව අරින්නේ. කිසිම ගැටුමක් ඇති කරගන්න ඕනෑ නැහැ.

***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම.***
*THE PROVINCIAL COUNCIL RESUMED.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ගොඩක් අදහස් ප්‍රකාශ කර සිටියා. නොයෙක් නොයෙක් අදහස් ප්‍රකාශ වුණා. ඒ නිසා සභාවේ මතය සම්බන්ධව මට එකඟතාවය ඉදිරිපත් කරන්න. මම මේ අවස්ථාවේදී පූර්ණ කාරක සභාව පළාත් සභාවක් බවට පත් කරනවා.

***ඊට අනුකූලව පූ.භා. 11.44 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***
*Accordingly at 11.44 a.m. the Provincial Council resolved it self in to a committee of the whole Council.*

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ නිර්දේශ සහිතව තමයි ගරු සභාපතිතුමනි, මම එකඟත්වය පළ කළේ. ඉතින් මේක අපි අවසන් කරමු. තේරුමක් නැහැ. වෙලාව යනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සහිතව වෙන්න බැහැ ඇමැතුමා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඇමැතිතුමා හරි. හරි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

රහිතව දාමු.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේක රංජිත් සෝමවංශගේ ප්‍රශ්නයක් නොවෙයි නේ? හෙට එතැනට කවුරු එයිද දන්නේ නැහැ නේ?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මේක කවදා ආවත් එනවා. එදාටත් ගාන සබන් වර්ගය සොයාගන්න ඕනෑ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සබන් ගාන්නේම නැහැ. ඒකයි ප්‍රශ්නය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී සභාව පූර්ණ කාරක සභා තත්ත්වයෙන් සභා අවස්ථා තත්ත්වයට පත් වී තිබෙනවා. කරුණු කාරණා හයක් සම්බන්ධයෙන් -

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු සභාපතිතුමනි, නරක ආදර්ශයක්. සෙංකෝලය උඩින් තිබ්බා. කිසි කෙනෙක් ඒකට ගරු කළේ නැහැ. වාඩි වෙලා ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම තමයි ඉතින්. ගරු කරන්නේ නැහැ. ගාණක්වත් නැහැ.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ඒක නරක ආදර්ශයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩුකාරතුමා ජේද කිහිපයක් යටතේ සංශෝධන හයක් ඉදිරිපත් කරලා තිබෙනවා. එකින් එක කියවන්නම්. ඒ පිළිබඳව සභාවේ මට එකඟතාවය ප්‍රකාශ කරන්න. 3 (අ) යන්න. නිල බලයෙන් පත්වන සාමාජිකයන්.

i. බස්නාහිර පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
ii. බස්නාහිර පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)
iii. බස්නාහිර පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)
iv. බස්නාහිර පළාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

මේ සම්බන්ධයෙන් ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ නිර්දේශ ලබා දීලා තිබෙනවා. සභාව විසින් තීරණයක් ගත යුතු බවට යෝජනා කරලා තිබෙනවා. සභාවේ මතය විමසිය යුතුයි කියලා තිබෙනවා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් සභාවේ මතය ඉදිරිපත් කරන්න. සභාව ඒකට එකඟයිද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එකඟයි. හරි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මම එකඟත් නැහැ. මම නිහඬව ඉන්නවා කියලා ලියාගන්න.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු සභාපතිතුමනි, මමත් ඒ තීරණයේමයි ඉන්නේ. අපි තීන්දු ගත්තා. තීරණ ගත්තා. ඒ නිසා මමත් ඒ තීරණයේම තමයි ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙමනම් අපට ප්‍රශ්නයක් නේ. අනිවාර්යෙන්ම අපට ඡන්දයකට යන්න වෙනවා. ආයේ ඉතින් දැන් ඡන්දයකට යන්න වෙනවා. දෙන්නෙක් වැළකී ඉන්නවා. හරි. මම දෙවැනි එකත් කියන්නම්. 3 (ආ) යන්න. ආණ්ඩුකාරතුමා ඉදිරිපත් කරපු සංශෝධන.

i. තොරතුරු හා සංනිවේදන තාක්ෂණය, ව්‍යාපාර කළමනාකරණය හා නීතිය යන ක්ෂේත්‍රයන්ට අදාළ අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද ඇති දෙදෙනෙකු හා

ii. තවත් එක් අයකු ප්‍රධාන අමාත්‍යවරයා විමසා පත් කරනු ලැබිය යුතු අතර, එසේ පත් කරනු ලබන තැනැත්තා අධිකාරියෙහි සභාපතිවරයා වශයෙන් පත් කළ යුතුය.

ආණ්ඩුකාරතුමාගේ සංශෝධනය සම්බන්ධයෙන් සභාවේ මතය විමසන්න කියලා ප්‍රඥප්ති හා නීති කාරක සභාව යෝජනා කරලා තිබෙනවා. දෙවැනි කාරණාවට. ඒ සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එකඟයි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මම ඒ යෝජනාවටත් නිහඬයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මෙතැන පොඩි ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා කොහොමද ප්‍රඥප්ති කාරක සභාවේ ඉඳලත් නිහඬව ඉන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ප්‍රඥප්ති කාරක සභාවේදී එකඟ වෙලා තිබෙන්නේ. ආයේ නිහඬ වෙන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කාරක සභාවේ ඉඳගෙන නිහඬ වෙනවා. ගරු සභාපතිතුමනි, මේකේ තේරුමක් තිබෙන්න එපැයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතැන මටත් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. එහෙම වුණොත් මට සිද්ධ වෙනවා, ඡන්දයකට යන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ප්‍රශ්නය එතුමා ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ ඉඳගෙන කොහොමද නිහඬ වෙන්නේ. එතුමාම තීන්දු තීරණ අරගෙන එතුමාට නිහඬ වෙලා ඉන්න බැහැ නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කාරක සභාවේදී එකඟ වෙලා තිබෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේක විහිළුවක් නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී එතුමා දීපු මතයක් තිබෙනවා නේ? ඒ මතය කියන්න. අපි දන්නේ නැහැ නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒකට පටහැනිව ක්‍රියා කරන්නේ දැන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මතය කියලා තිබෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මතය නිහඬ නම්, නිහඬ වෙන්න බැහැ නේ? මතය මොකක්ද කියලා තිබෙන්න ඕනෑ. ඒකයි අපි කියන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඕකට කියන්නේ මෛනියා කියලා. එක එක මෛනියා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මතය කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා ඔබතුමා මේ සභාවේ බෙදීමද ඉල්ලන්නේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

නැහැ. නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔය දේම කථා කරලා සභාවේ අනුමත කරලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙදීමක් තිබෙනවාද?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

බෙදීමක් නැහැ. ඔබතුමා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කැමරාවලටයි, පත්තරවලටයි වැඩ කරන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙදීමක් නැත්නම් ඔබතුමා -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මේකේ බෙදීමක් නැතිව යමු. තේරුමක් නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඔබතුමා මතය විමසනවා. පක්ෂ කට්ටිය ඉන්නවා. විරුද්ධ කට්ටිය ඉන්නවා. ඉන්න පුළුවන්. පක්ෂ කට්ටිය ඉන්න පුළුවන්. විරුද්ධ කට්ටිය ඉන්න පුළුවන්. ඒ එකක්වත් නැතිව මම ප්‍රශ්න අහන්නෙත් නැහැ. විරුද්ධ වෙන්නෙත් නැහැ, ඔය මතයට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා බෙදීමක් ඉල්ලන්නේ නැහැ නේ. සභාවේ එකහයි කියලා මෙතුමිය කියනවා. එතුමා බෙදීමක් ඉල්ලන්නෙත් නැහැ. බෙදීමක් ඉල්ලන්නේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

බෙදීමක් අවශ්‍ය නැහැ. මොකද ගරු ආණ්ඩුකාරතුමාගේ -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ කැමරාවලට, පත්තරවලට මෙතැන නීති සම්මත කරන්න බැහැ. කැමරා පත්තරවලට.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු ආණ්ඩුකාරතුමාගේ කාරණා නිසා අපට බෙදීමක් අවශ්‍ය නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවශ්‍ය නැහැ. මම කියන්නේ මේකට අවශ්‍ය නැහැ. එහෙම බෙදීමකට අපි යන්න ඕනෑ නැහැ. එහෙමනම් එම වගන්ති දෙක ඇතුළු, තවත් කිහිපයක් තිබෙනවා. 6(4), 8(1), 9(2), 24 ඒ සියලුම දේ ආණ්ඩුකාරතුමාගේ සංශෝධන සහිතව නිර්දේශවලට යටත්ව අපි එහෙම කියමුද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නිර්දේශ නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නිර්දේශ රහිතව.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ආණ්ඩුකාරතුමාගේ සංශෝධනවලට යටත්ව.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සංශෝධන රහිතව

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සංශෝධන දැන් අපි පිළිගන්නවා නේ? ආණ්ඩුකාරතුමා විසින් මෙම කාරණාව සම්බන්ධයෙන් -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එහෙම කියන්න ඕනෑ නැහැ. හරි. හරි. එහෙමනම් කියන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එක එක්කෙනා මේවා අධ්‍යයනය කරන්නේ නැති වැරැද්ද නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

3 (අ) යන්න, 3(ආ) යන්න, (4), 8(1), 9(2), 24 ගරු ආණ්ඩුකාරතුමාගේ ඒ සියලුම සංශෝධන මෙම සභාව පිළිගත් බවට මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමා, 9(2) -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආයෙත් බැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

නැහැ. නැහැ. මගේ මතය. 9(2),24 –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ඉවරයි. දැන් බැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

විගණනය සම්බන්ධයෙන් එකඟත්වය පළ කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කලින් කියන්න තිබ්බා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අනික් සියලු කාරණා සම්බන්ධයෙන් නිහඬව ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඕක හැන්සාඩ් වෙන්නෙත් නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

9(2), 24 සහ අධිකාරියේ විගණනය සම්බන්ධයෙන් එකඟත්වය පළ කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව අවුල් කරන්න එපා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අනික් සියලු කාරණා සම්බන්ධයෙන් නිහඬව සිටිනවා. නැවත වතාවක් කියන්නේ මම. 9(2), 24 සහ අධිකාරියේ අරමුදල් විගණනය සම්බන්ධයෙන් එකඟත්වය පළ කරනවා. අනික් සියලු කාරණා සම්බන්ධයෙන් නිහඬව ඉන්නවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

විරුද්ධ නම්, විරුද්ධයි කියලා කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ඉවරයි. දැන් මත මොකුත් නැහැ. මගේ මතය මම ඉදිරි පත් කළා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

හරි මතය ඒක තමයි. 9(2), 24 සහ විගණනය සම්බන්ධයෙන් එකඟයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පත්තර ටී.වී. ආපුවාම මෙතැන වැඩ කරන්න බැහැ. පත්තරවල කැපී පෙනෙන්න -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා මට පොඩ්ඩක් උදව් කරන්න කෝ. කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. න්‍යාය පත්‍රය අනුව පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනා තුනක් තිබෙනවා.

නමුත් ඒ අතරතුර උදේ පෙ.ව. 08.50 ට කේ.ඩී.අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා තව රීති අත්හිටුවීමේ යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා මට සිද්ධ වෙනවා, එතුමාගේ යෝජනාව සභාවේ සාකච්ඡාවට ගන්න. මම එතුමාට ආරාධනා කරනවා, එම රීති අංක 107 යටතේ යෝජනාව ඉදිරිපත් කරන ලෙසට. රීති අත්හිටුවීමේ යෝජනාව ඉදිරිපත් කරලා ඊළඟට ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.

ඒ අතරතුර ගරු නියෝජ්‍ය සභාපති, යසපාල කෝරලගේ මැතිතුමාට මූලාසනයේ අසුන් ගන්නා ලෙස මම ආරාධනා කරනවා.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***
*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.

# රීති අංක 107 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 107

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,"*පොදු වැදගත්කමකින් යුක්ත වූ පහත සඳහන් වන යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති අංක 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට ආනුෂාංගිකව කාර්යපටිපාටි රීති 8(5), 8(6), 15(2), 15(5), 53(2), 53(3), 57(2) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි*" මම මෙම සභාවට යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ සඳහා සභාව එකඟද?

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමාගේ රීති අත්හිටුවීමට අපි විරුද්ධ වෙනවා. හේතුව එතුමා ඉදිරිපත් කරන යෝජනාව ඉතාම බරපතළ, ප්‍රජාතන්ත්‍ර විරෝධී යෝජනාවක්. කෙටියෙන් සඳහන් කළොත් එතුමාගේ යෝජනා කරනවා, වැඩ වර්ජන වහා නැවැත්විය යුතු බවත්. ඒක ඉතාමත්ම බරපතළ කාරණාවක්. ආණ්ඩුවට වැඩ බැරි නිසා, කළමනාකරණයක් නොමැතිකම නිසා අද රටේ හැම තැනම උද්ඝෝෂණ පැවැත් වෙනවා. ඉතින් මහජනතාවගේ අවශ්‍යතා ඉෂ්ට කරන්නේ නැති ආණ්ඩුව වෙනුවෙන් මෙතුමා යෝජනා කරනවා, වැඩ වර්ජන නවත්වන්න කියලා. ඒ නිසා මේ රීති අත්හිටුවීමට අපි විරුද්ධයි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එහෙනම් රීති අත්හිටුවීම පිළිබඳව ඡන්දයකට යන්න වෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මගේ අදහස පොඩ්ඩක් කියන්න දෙන්න. මෙතුමා කියපු කාරණය හරී. මේ යෝජනාවෙන් අපට එතුමා එක පැත්තකින් කියනවා, වැඩ වර්ජන වහා නැවැත්විය යුතුයි කියලා මහජනතාවගේ මූලික අයිතීන් ආරක්ෂා කරන්න ඕනෑය කියලා. මේක හරියට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තිබෙන්නේ අර මරන්න. එතැනට කොමා වැටුණොත් මරන්න, එපා ඉතුරු කරන්න. හැබැයි මරන්න එපා කියන තැනට කොමා වැටුණොත් මරන්න එපා, ඉතුරු කරන්න. දැන් මේක සොයා ගන්න බැහැ. මොකක්ද? මරන්න එපා, ඉතුරු කරන්න කියනවාද? මරන්න, එපා ඉතුරු කරන්න කියනවාද? තේරෙන්නේ නැහැ. මේ සම්බන්ධව අපට අයිතියක් නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මේ වැඩ වර්ජන නතර කරන්නය කියලා අපට යෝජනාවක් සම්මත කරන්න බැහැ. එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කරලා තිබෙන එකක්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඒ ගැන කථා කරන්නවත් අයිතියක් නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කරලා තිබෙන එකක්. අපට කියන්න බැහැ, එහෙම කරන්න එපාය කියලා. ඒ නිසා මේ යෝජනාවම වැරැදියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සීනුව නාද කරන්න මෙයට ඡන්දයක් විමසීම සඳහා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

විපක්ෂයේ කණ්ඩායම් රැස්වීමේ මේක කථා කළේ නැද්ද?

[සභාවේ ඝෝෂා]

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

යූ.ඇන්.පී. එකේ සංවිධායක කෙනෙක් නැද්ද?

[සභාවේ ඝෝෂා]

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

එච්චරයි අයිතියක්ව තිබෙන්නේ. ඡන්දයක් නැති කොට උද්ඝෝෂණ විතරයි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මට කථා කරන්න පුළුවන්ද? මගේ මතය කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අත්හිටුවීමේ යෝජනාව පිළිබඳව ඡන්දයක් විමසන්න වෙනවා. ඔබතුමා ඉතා කෙටියෙන් ප්‍රකාශ කරන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

එහෙමනම් අපටත් වෙලාවක් ඕනෑ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මම ජ්‍යෙෂ්ට මන්ත්‍රී කෙනෙක්. ඕනෑම මන්ත්‍රී කෙනෙක්ට රීති අත්හිටුවලා මේ රීති අංකය යටතේ යෝජනාවක් ගෙනෙන්න අයිතිය තිබෙනවා. මේ සම්බන්ධව මමත් ඉන්නේ එක මතේ. කථා දෙකක් නැහැ. අපි කියන්නේ මේකයි. එතුමාගේ පුද්ගලික මතයක් වෙන්න පුළුවන්. එතුමා හැබැයි හොඳ අදහසකින් මේක ගේන්නේ. එතුමා කියන්නේ මේක සාධාරණයක් වෙන්න කියන එකයි.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මෙන්න මේක පත්තරේ දාන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මේක සංශෝධනය කරලා මේ ගැන කථා කරමු.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. හරි.

[සභාවේ ඝෝෂා]

රීති අත්හිටුවීමේ යෝජනාවට පක්ෂව ඡන්දය විමසනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව සම්බන්ධයෙන් වෙන්න ඕනෑ දේ ඉෂ්ට වුණා. දැන් ඒ ගැන අවශ්‍ය ප්‍රචාරත්තිය පළ වුණා. දැන් එතුමාට ඒ පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. නිකන් අපි දෙගොල්ලෝ රණ්ඩු වෙන්න වැඩක් නැහැ. එතුමාට ඇති ප්‍රශ්නයක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අත්හිටුවීම පිළිබඳව පක්ෂව ඡන්දය විමසනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජනතා විමුක්ති ගරු මන්ත්‍රීතුමා කිව්වා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බැහැ. බැහැ. පක්ෂව -

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

විහිළුවක්ද? බෙල් එක ගැහුවාට පස්සේ ආයේ මොනවද සාකච්ඡා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පක්ෂව ඡන්දය විමසනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

යෝජනාව පිළිබඳව වැරදි අර්ථ නිරූපණයක් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පක්ෂ අය නැඟිටින්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

දෙන එක වැරැදියි. මේ යෝජනාවේ කිසිම තැනක කියන්නේ නැහැ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභා රීති අනුව කරන්න බැහැ. ඒකට ඉඩ දෙන්න බැහැ. පක්ෂ අය නැඟිටින්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

වැඩ වර්ජන අය නතර කරන්න ඕනෑය කියලා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

පක්ෂ අය කවුරුවත් නැහැ. ඔයා විතරයි. මේක හරි යන්නේ නැහැ. කාලය කන වැඩක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එතුමා විතරයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

විපක්ෂ අය නැඟිටින්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේ රීති අත්හිටුවීමටද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඔව්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සිරිකමල් මන්ත්‍රීතුමාත් පක්ෂ නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

නැහැ. නැහැ. මම පක්ෂයි. මම කථා කෙරුවා නම් දුවන්න තමයි කථා කරන්න හිටියේ.

[සභාවේ සෝෂා]

ගහපු හැටි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

යෝජනාවට කථා කරන්න බැහැ, රෙදි ඇඳගෙන. දැන් බොරුවට කෑ ග හනවා. හැමදේටම මහින්ද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඡන්දයෙන් වැළකී ඉන්න අය නැඟිටින්න.

ඒ අනුව රීති අත්හිටුවීමේ යෝජනාව අයින් වෙනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට -

[සභාවේ ඝෝෂා]

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මම දන්නේ නැති හින්දා අහන්නේ. දැන් පක්ෂත් නැහැ. විපක්ෂත් නැහැ. වැළකීත් නැහැ. එතකොට ඉන්නේ කොයි ගොඩේද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

තැනක් නැහැ. මීළඟට තිබෙන්නේ -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පෞද්ගලික මන්ත්‍රී යෝජනා අනුව -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එතුමා මේ අවස්ථාවේ සභාවේ නැහැ. ඒක නිසා සභාවෙන් ඒ යෝජනාව අයින් වෙනවා. මම යෝජනා කරනවා. සභාවේ න්‍යාය පත්‍රයෙන් අයින් වෙනවා. මීළඟට පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බයේ ගිහිල්ලා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් යොමු කරනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව නිසා මේ පළාත් සභාවේ කටයුතු දිනපතා කරගෙන යන්න ලොකු ගැටලුවක් මතු වෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක අයින් වුණා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ඒ යෝජනාව සභාවේ න්‍යාය පත්‍රයෙන් ඉවත් කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එතුමා නැත්නම් -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

දැන් මාස ගණනාවක් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මන්ත්‍රීතුමා නැහැ නේ. අයින් වුණා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මාස ගණනාවක ඉඳලා න්‍යාය පත්‍රයේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා, යෝජනාව ඉදිරිපත් කරන්නය කියලා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

කටයුතු කෙරෙන්නේ නැහැ. යෝජනාව අයින් කරන්න. ඒක න්‍යාය පත්‍රයෙන් ගන්න. අරගෙන සාකච්ඡා කරලා ඉවර කරන්න. හැමදාම න්‍යාය පත්‍රයේ කොළ පිරෙනවා. අපරාධයක්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

දැන් ඡන්දේ ගන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

එහෙම අයින් වෙන්න බැහැ. විවාද කරමින් ඡන්ද විමසීම දක්වා ආපු යෝජනාවක්. අලුත් යෝජනාවක් නොවෙයි. තර්කානුකූලව කියන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අලුත් යෝජනාවක් නොවෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමා එහෙම තීන්දු ගන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාවේ යෝජනා අනුව ඒ අදාළ මන්ත්‍රීවරයා නැත්නම් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

තේ බොන්න යන්නේ නැතිව ඉන්න ඕනෑ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

වැරැදියි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමා, දැන් ඡන්දය තියන්න, බෙල් එක ගැහුවාම එන්න බැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මේ යෝජනාව යන යෝජනාවක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම විනාඩි පහකට සභාව කල් තියනවා. පක්ෂ නායක රැස්වීමක් සභාපතිතුමාගේ මූලිකත්වයෙන් රැස් වෙනවා.

*ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් අ.භා. **12.17** ට යළිත් රැස් විය.*
*Sitting, accordingly suspened untill 12.17 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු සභාවේ -

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමා, අපේ ජ්‍යෙෂ්ටතම මන්ත්‍රීතුමෙක් වැරැදි ආදර්ශයක් මේ සභාවට සැපයුවා. ඔබතුමා මේ සභාවට ප්‍රවිශ්ට වෙන කොට. කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා. ඒක වැරැදි ආදර්ශයක්. ඔබතුමා මේ සභාවේ ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එතුමා දැනගන්න ඕනෑ සභාවේ ගරුත්වය ආරක්ෂා කරන්න ඕනෑ කියන එක පිළිබඳව.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

අපි නවක මන්ත්‍රීවරු. ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරු ආදර්ශයක් දෙන්නට ඕනෑ. මේ වාගේ වැරැදි කරපුවාම අපටත් තීන්දුවක් ගන්න වෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. සභාවේම වාගේම මගේ. මෙතුමා කිව්වා, මෙතුමා සිටියේ පුස්තකාලයේ කියලා. පුස්තකාලයට බෙල් එක නාද වෙන සද්දය ඇහෙන්නේ නැද්ද? මම ඔබතුමා මගින් ලේකම්තුමාගෙන් අහනවා. ඇහෙනවාද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇහෙනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඇහෙනවා නම් බෙල් එක නාද කරන කොට මේ ජ්‍යෙෂ්ටම මන්ත්‍රීවරයෙක් කිත්සිරි කහටපිටිය මන්ත්‍රීතුමා. හිටපු විපක්ෂ නායකතුමා. එතකොට එතුමා තමන්ගේ පිළේ. තමන්ගේ සහෝදර මන්ත්‍රීවරයෙක් යෝජනාවක් ගෙනැල්ලා බෙල් එක නාද කරන්නේ ඡන්දයකට. එතුමා දන්නවා. ඡන්දයක් විමසන්න බෙල් එක නාද කරන කොට එතුමා ඒත් පැමිණෙන්නේ නැතිව ඉඳගෙන ඉඳලා පස්සේ එතුමාගේ යෝජනාවටත් මෙතැනට එන්නේ නැතිව ඇවිල්ලා කවල් දානවා. කවල් දානවා මදිවට ඔබතුමා සභාවට එන කොට මොන ප්‍රශ්න අඩුපාඩු තිබුණත් සභාවේ නියෝජ්‍ය සභාපතිතුමා ඔබතුමා. ඔබතුමාගේ තනතුරට ගරු කරනවා. නියෝජ්‍ය සභාපති තනතුරට ගරු කරන්නේ නැහැයි කියන්නේ ඔබතුමා ගැන කථා කරලා වැඩක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කාල වේලාව මදි වෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මේ සභාවට ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත් ගෝලීයකරණ ලෝකයේ ජාත්‍යන්තර සම්බන්ධතාවය දිනා ගැනීම පිළිබඳව යෝජනාව අපි මේ සභාවට ගෙනාවා. ගෙනාවට පස්සේ විවාද කරන්න -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දැන් බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මොකද බැරි?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා මේ ගැන දිගට කථා කරන්න වෙලාවක් දෙන්න බැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඇයි බැරි? 36(1) යටතේ මොකද බැරි කියලා කියන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

36(1) යටතේ බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අපට ආපසු අදින්න බැහැ. දැන් පක්ෂ නායක රැස්වීමේදී මේක සාකච්ඡා කළා නේ?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ පක්ෂයේ ඉඳගෙන මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ පාලක පක්ෂයේ ඉඳගෙන -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා හිතේ වේදනාවට කථා කළාට -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

හොර -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මෙතැන මේ සභාව. ඒක නිසා වාඩි වෙන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මගේ වරප්‍රසාදයක්.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එතුමා සිටියේ නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

රීති කඩනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කරුණාකර වාඩි වෙන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

විවාද වෙමින් තිබුණු එකක, ගාමිණී තිලකසිරි ඇමැතිතුමා එදා ගණපූරණය නැතිව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම ගත්තු තීන්දුව පක්ෂ නායක රැස්වීමේ අනුමත කළා නේ? මේක නිවැරැදියි කිව්වා නේ? පක්ෂ නායක රැස්වීමේ කට්ටිය මේක අනුමත කළා නේ? මේක නිවැරැදියි කිව්වා නේ?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාවේ ගරුත්වය රකින්න.

[සභාවේ ඝෝෂා]

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා නොවෙයි. උප සභාපතිතුමා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

යෝජනාවක් ගෙනාපුවාම මන්ත්‍රීතුමා මෙතැන සභාවේ ඉන්න ඕනෑ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මූලසුනේ ඉඳගෙන -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා දීපාල් මන්ත්‍රීතුමාට රිද්දන්න එළියට ගියාට කරන්න දෙයක් නැහැ ගරු මන්ත්‍රීතුමා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔබතුමා පිළිගන්නවාද ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගාමිණී ඇමැතිතුමා අද කථා කරන්නේ නැහැයි කිව්වා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගණපූරණය නැතිව මේ යෝජනාව කල් ගියා කියලා ඔබතුමා පිළිගන්නවාද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔව්. හත් වතාවක්, පස් වතාවක් මේ යෝජනාව කල් ගියා.

[සභාවේ ඝෝෂා]

මට මීට වැඩිය කථා කරන්න දෙන්න බැහැ. මම පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා. පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව සභාවට ඉදිරිපත් කරන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාවට පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සභාව තුළ නැති ඒවා කථා කරන්න බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා සභා රීති අනුව -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

රීති අංක 36(1) යටතේ කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

සිරසට ප්‍රවෘත්තියක් හදන්න පරක්කු වෙලා ආවේ.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ යෝජනාව අයින් කරන්න තීන්දු කළා. මීළඟට තිබෙන්නේ ඊළඟ යෝජනාව ගන්න. ගරු මන්ත්‍රීතුමා. මගේ පුද්ගලික න්‍යාය පත්‍රයක් නොවෙයි මේ යන්නේ. ඒ නිසා පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

හොර කරන කොට ඔබතුමාව අපට ඕනෑ නැහැයි කියලා කියන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාට -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මම ගරු කරන්නේ නැත්තේ ඒකයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මගේ යෝජනාව මොන නීතිය යටතේද -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පුස්තකාල නීතිය යටතේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා ආයෙත් පස්සේ යෝජනාවක් දාන්න. පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

*[නැඟී සිටියේය. ]*
*[Stood.]*

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පුස්තකාලයට වෙලා එහෙම වාඩි වෙලා ඉන්න පුළුවන්ද?

[සභාවේ ඝෝෂා]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මගේ වෙලාව ඕනෑ, මට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පක්ෂ නායක රැස්වීමේදී මේක තීන්දු කළා නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔය සිරසට ප්‍රවෘත්තියක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභා රීති අනුව යන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පක්ෂ නායක රැස්වීමේදී තීන්දු කළා, ගන්න එපා කියලා.

[සභාවේ ඝෝෂා]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඇමැතිතුමා කථා කරන්න සිටියේ.

[සභාවේ ඝෝෂා]

මෙතුමා කථා කර කර සිටියා නම් ආරාධනා කරන්න ඕනෑ මෙතුමාට.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එතුමා නම දීලා නැහැ කථා කරන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අලුතෙන් ගෙනාපු යෝජනාවක් අරගෙන ඔබතුමා කොහොමද - සභාව හැල්ලු කරන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ. නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔබතුමා කොහොමද නැහැයි කියන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේක අවුරුදු 10 ක, 12 ක අත්දැකීමෙන් කරන්නේ. ගත්තු තීන්දුව පක්ෂ නායක රැස්වීමේදී වැරදියි කිව්වා නම්, ඒක පිළිගන්නවා. ඒ නිසා මම ඊළඟ යෝජනාව පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාට කියනවා, ඉදිරිපත් කරන්නය කියලා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මයික් එක ඕෆ් කරන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔබතුමා මොනවා කිව්වත් මට ප්‍රශ්නයක් නැහැ. මගේ යෝජනාව ගණපූරණය නැතිව -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සිරසට ප්‍රවෘත්තියක්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

එතකොට ආරාධනා කරන්න ඕනෑ කථා කර කර හිටපු කෙනාට.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එතුමා අද කථා කරන්නේ නැහැයිලු.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

යෝජනාව කථා කරන්න එවලේ සභාවේ ගණපූරණයත් නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒ යෝජනාව ඕනෑ නම් තව මාස හයකින් පස්සේ ගේන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඕක සිරසට ප්‍රවෘත්තියක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා සභාවේ නැති වුණාම, ඔබතුමාගේ ඒ යෝජනාව න්‍යාය පත්‍රයෙන් අයින් වුණා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ඔය යෝජනාව දැන් ගෙනැල්ලා ඉවරයක් කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දැන් අනික් යෝජනාව ආවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමා, මෙතුමා කථා කරන්න නම දීලා නැහැ නේ? මෙතුමා කථා කරන්නේ නැහැයි කිව්වා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔව්.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන්න කියලා මම ආරාධනාත් කළා, මූලාසනයෙන්.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

කොහොම හරි දැන් සභාවේ මතය විමසන්න කෝ.

[සභාවේ ඝෝෂා]

එතකොට ප්‍රශ්නය ඉවරයි නේ?

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

දැන් සභාවේ මතය විමසන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගිය හකුරට නාඩන්නේ තිබෙන හකුර රැක ගන්නේ කිව්වා වාගේ දැන් මේ දෙපැත්තටම එක්ක මම කිව්වේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගණපූරණයක් නැතිව කථා කර කර හිටපු එක්කෙනාට ආරාධනා කරන්න ඕනෑ, ඊළඟ කථාවට. මෙතුමාගේ ඔළුවේ වෙන වැඩ තියාගෙන මෙතුමා ඒක කල් දාලා, ඒ යෝජනාව කළේ කොහොමද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, පෞද්ගලික මන්ත්‍රී යෝජනා. 54(1) මම කියවනවා.

*යෝජනාවක් ඉදිරිපත් කර ඇති මන්ත්‍රීවරයෙකුට එම යෝජනාව විවාදයට භාජනය වන දිනයේදී සභා රැස්වීම සඳහා පැමිණිය නොහැකි වුවහොත් සහා රැස්වීම ආරම්භ වීමට ප්‍රථම ලේකම්වරයා මගින් සභාපතිවරයා අමතන ලිඛිත දැනුම් දීමක් මාර්ගයෙන් එම යෝජනාව ඉදිරිපත් කිරීමේ බලය වෙනත් මන්ත්‍රීවරයෙකුට පැවරිය හැකිය.*

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මොට්ට -

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වාඩිවෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා මෙතැන නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔබතුමා -

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පුද්ගලික ප්‍රශ්න නොවෙයි. මේ සභා රීති අනුව ගියාම මන්ත්‍රීවරයා නැතිව යෝජනාව ගන්න බැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැනුත් වැරැදි ප්‍රකාශයක් කළා. මූලාසනය අගෞරවයට ලක් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එක්කෝ මෙතුමාට නීතිය කියා දෙන්න. මම විපක්ෂ නායකතුමාට කියනවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හත් වතාවක් මේ යෝජනාව සභාවට ගෙන ආවා. හත් වතාවේම ගණපූරණය තියා ගන්න බැරි වුණා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

විපක්ෂ නායකතුමාගෙන් පොඩ්ඩක් අහගන්න.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මේ පාර ගෙනාවනම් යෝජනාව පරාදයි. ඕක පරද්දන්නේ නැතිව යන්තම් බේරලා දුන්නා. ඒකට අපේ නියෝජ්‍ය සභාපතිතුමාට ස්තූති කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගණපූරණයක් නැති වුණාම කරන ක්‍රමය අහගන්න ලේකම්ගෙන්.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔබතුමා මේ පළාත් සභාවේ ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක්. රීතිය පැහැදිලි කළා. දැන් ඔබතුමාගේ මතය ප්‍රකාශ කළා. දැන් ඉතින් නිහඬ වෙලා මේ සභාවේ වැඩ කටයුතු කරන්න දෙන්න. ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරයෙකුගේ යෝජනාවක් ගෙනෙන්න හදන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

නැහැ, ගරු මහ ඇමැතිතුමා -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මේක ප්‍රසිද්ධ කළාට පස්සෙ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේක මෙතැනින් එහාට අපට යන්න බැහැ. සභාවක් කරන්නේ. පොඩ්ඩක් තේරුම් ගන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

කථා කර කර හිටපු මන්ත්‍රීතුමාට ආරාධනා නොකර -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මෙච්චර පැහැදිලි කළාට පස්සේ ඔබතුමා කරන එක වැරැදියි නේ? ඔබතුමන්ලාගේම සහෝදර මන්ත්‍රී කෙනෙක්ගේ යෝජනාව.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒකට ආරාධනා නොදී කොහොමද ප්‍රතික්ෂේප කළේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ප්‍රතික්ෂේප කළේ ගරු මන්ත්‍රීතුමා, ඒ යෝජනාව ගෙනාපු මන්ත්‍රීවරයා සභාවේ නොසිටි අවස්ථාවකදී තිබෙන්නේ, ඊළඟ යෝජනාවට යන එක. කථා කරන්නේ නැහැයි කිව්වාලු.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක විනාඩියක් නිශ්ශබ්ද වෙලා ඉන්නවා නම් මේ ගත්තු තීරණය පිළිබඳව දැනුම් දෙන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නම දීලා නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු ඇමැතිතුමා කථා කර කර සිටියේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නම ආවේ නැහැ නේ?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

නම ඕනෑ නැහැ. නම දීලා තමයි කථා කළේ.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාට මම අවස්ථාව ලබා දෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

නැහැ. එහෙම බැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේක වැරැදියි.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

රීති ප්‍රශ්නයක්.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

රීති ප්‍රශ්නයක්. කරුණාකරලා සවන් දෙන්න කෝ? දැන් මේ 2017.06.21 සභා කටයුතු රැස්වීමේ වාර්තාව. මේ මෙසේ උඩ තියෙන එක. මේකේ බොහොම පැහැදිලිව තිබෙනවා -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒකේ දිනෙත් දාලා තිබෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

පොඩ්ඩක් ඉන්න කෝ? ඔබතුමා කථා කරනවාද? නැත්නම් මම කථා කරන්නද?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔබතුමා කථා කරන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

පෞද්ගලික මන්ත්‍රී යෝජනා. 1.3.1 න්‍යාය පත්‍රයෙන් ඉදිරියට ගෙන ආ යෝජනා : ඒකීය රටක් තුළ ජාත්‍යන්තර සබඳතා ඇති කියලා ඒ යෝජනාව ගැන තිබෙනවා. 2017.03.21 දින. හොඳට අහගන්න.

> *2017.03.21 දින සභා රැස්වීමේදී ඉදිරිපත් කරන ලද යෝජනාව, ගණ පූරණය නොමැති වීම හේතුවෙන් එදින සභා රැස්වීමේදී සාකච්ඡා කොට අවසන් නොවූ බැවින් රීති අංක 15(7) ප්‍රකාරව 2017.04.04 දින න්‍යාය පත්‍රයට ඇතුළත් කළද, එදින සභාවේදී රීති අංක 107 යටතේ යෝජනාවක් සාකච්ඡාවට ගන්නා ලද බැවින්, මෙම යෝජනාව එදින සාකච්ඡාවට නොගත් බැවින්ද, එලෙසින්ම 2017.04.25 දිනද මෙම යෝජනාව සාකච්ඡාවට නොගත් බැවින්ද, 2017.05.23 දින ගණපූරණය නොමැති වීමෙන් මෙම යෝජනාව සාකච්ඡා කර අවසන් කිරීමට නොහැකි වූ බැවින්ද, 2017.06.06 වන දින සහ 2017.06.20 වන දින රීති අංක 107 යටතේ යෝජනාවක් ඉදිරිපත්ව තිබූ බැවින් සාකච්ඡා නොවූ බැවින්ද, මෙකී යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට කාරක සභාව විසින් තීරණය කරන ලදී.*

[ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා]

දැන් මේක කථා කරගෙන ගිය එකක්. එතකොට ඔබතුමාට තීන්දු කරන්න බැහැ ආයේ මේ යෝජනාව අලුතින් ගේන්න ඕනෑය කියලා. සම්පූර්ණ වැරැදි වැඩක් කෙරුවේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ. නැහැ. අලුතෙන් ගේන්න නොවෙයි ගරු මන්ත්‍රීතුමා. පොඩ්ඩක් ඉන්න.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

පොඩ්ඩක් ඉන්න කෝ. එහෙමනම් මේ කාරක සභා තිබිලා වැඩක් නැහැ නේ?

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

සාකච්ඡා කරන්න අදාළ මන්ත්‍රීවරයා ඉන්න ඕනෑ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

කාරක සභාවේ තීන්දු මේ සභාව පිළිගන්නේ නැත්නම් මොනවටද මේ කාරක සභා. සභා කටයුතු කාරක සභාව මොකටද?

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

අදාළ යෝජනාව ගෙනාපු මන්ත්‍රීතුමා සභාවේ ඉන්න ඕනෑ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේක සාකච්ඡා කරපු යෝජනාවක්. සාකච්ඡා කරපු යෝජනාව ඉදිරියට ගෙනියන එක විතරයි තිබෙන්නේ. ඒ නිසා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභා රීතිවලට යටත්ව තමයි කාරක සභා රීති තිබෙන්නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මට මේ කාගෙවත් යෝජනා ගෙනෙන එක නොවෙයි. මේ යෝජනාව පැරැද්දුවත් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභා රීතිවලට යටත්ව.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

පැරැදුණත්, දිනුවත්

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා කියන්න, කථා කරන්න කවුරුත් නැහැ නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔව්.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

මේ යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීවරයා සභාවේ ඉන්න ඕනෑ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

සභා කටයුතු එක තියලා මේවා අච්චු ගහලා මේ මේසේ උඩ තියන එක තේරුමක් නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔව්. මොනවද මේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, සභා රීතිවලට යටත්ව තිබෙන්නේ.

[සභාවේ ඝෝෂා]

යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීවරයා නැත්නම් මොකක්ද කරන්නේ?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මෝඩ කථාවක්.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා තේරුම් ගන්න මොකක්ද මේ ඇත්ත කථාව කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමා තේරුම් ගන්න. මෙතුමා සභාවේ නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේ සභාවේ වැරැදි පූර්වාදර්ශ දෙන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීවරයා නැත්නම් මොකද කරන්නේ.

[සභාවේ ඝෝෂා]

යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීවරයා නැත්නම් ඒ යෝජනාව ගන්න බැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ඔය යෝජනාව සභාවට වදයක්.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මෙතුමා එළියට ගියාම කථා කරන එක නතර වෙනවාද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමා නැති වුණා කියමු කෝ? කථා කරන්න කවුරු හරි ඉන්න එපැයි. කථා කරන්න කවුරුත් නැත්නම් කොහොමද කථා කරන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මට ඊළඟ යෝජනාවට යන්න වෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මෙතුමාගේ කථාව මැද්දෙන් නැවතුණේ ගණපූරණය නැතිව.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔව්.

[සභාවේ ඝෝෂා]

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

යෝජනාව ගෙනාපු මන්ත්‍රීවරයා මේ සභාවේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පිළිතුරු කථාව කරන්න ඔබතුමා සභාවේ නැහැ. එතකොට ඊළඟ යෝජනාව ගන්න වෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මෙතුමා ඉන්න ඕනෑ. මෙතුමා එළියේ සිටියේ. කොහොමද කථා කරන්නේ?

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ඉස්සෙල්ලා ගණපූරණය හදා ගත්තා නම් -

[සභාවේ ඝෝෂා]

හත් පාරක් කල් ගියා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කථා කරන්න තිබුණා නේ? නම කියන්න ඕනෑ නැහැ නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

කාටවත් ආරාධනා කරලා නැහැ නේ?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මම මේකට තර්ක ඉදිරිපත් කරන්නේ නැහැ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ දිගින් දිගටම-

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔබතුමාට ආරාධනා කළාද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීතුමා නැහැ. ඊළඟ යෝජනාවට ගියා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගාමිණී තිලකසිරි මැතිතුමා කථා කර කර -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

යෝජනාව -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

එතුමා එහෙම ආරාධනා කළේ නැහැ.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීවරයා සභාවේ ඉන්න ඕනෑ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

යෝජනාව අලුතෙන් ගේන්නේ නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

කොහෙද තිබෙන්නේ?

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

නවත්තපු තැනින් ඉදිරියට යන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

වාසියට බොරු කියන්න එපා. කොහෙද තිබෙන්නේ?

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

පෙන්වන්නම්.

[සභාවේ ඝෝෂා]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

සභාව කල් තිබ්බා නම් ඊළඟ කථිකයාට ආරාධනා කරන්න ඕනෑ. යෝජනාව ගෙනාවේ මම මාස ගණනකට ඉස්සෙල්ලා. මට පිළිතුරු කථාවට ආරාධනා කරන්න ඕනෑ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

පළමුවෙන්ම යෝජනාවක් ගේනකොට හිටියේ නැත්නම් ඒක හරි.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

යෝජනාව මෙලෝ රහක් නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

යෝජනාව ඇවිල්ලා තිබෙන්නේ. ගණපූරණය නැතිව කල් ගියේ. මේ පළමුවැනි යෝජනාව නොවෙයි. එහෙමනම් මෙතුමාගේ තර්කය හරි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මට පිළිතුරු කථාවට ආරාධනා කරන්න ඕනෑ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීවරයා සභාවේ ඉන්න ඕනෑ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

එහෙම එකක් නැහැ.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

එහෙම නැහැයි කියලා කියන්නේ කොහොමද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එයා නැතිව කොහොමද කථා කරන්නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යෝජනාව අලුතින් ගේනවාද? විවාදය නැවැත් වූ තැන් සිට ඉදිරියට ගෙනියනවාද? එහෙම නම් මේ ප්‍රශ්නයට උත්තර තියෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මෝඩ කථා කියන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නිශ්ශබ්ද වෙන්න. විපක්ෂ නායකතුමාට විනාඩියක් කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ප්‍රශ්නයට මමත් library යේ ඉඳලා මෙතැනට ආවා. ඒ එනකොට ඔබතුමාගේ මතයක් තිබුණේ නැහැ, කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාට කථා කරන්නවත්. ඔබතුමා කිව්වේ, කිත්සිරි කහටපිටිය මන්ත්‍රීතුමා නැහැ. මේක අවසන් කරනවා. යෝජනාවක් නැහැයි කියලා. එතකොට මෙතුමා නැගිට්ටා. එදා ගණපූරණය ඇති වුණේ ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා කථා කරන අතරතුරේ. එතකොට දැන් ඒ කථාවට එතැන එකතු වන්නේ ගාමිණී තිලකසිරි ඇමැතිතුමා තමන්ගේ කථාව අවසන් කරන්න ඕනෑ. ඒ අවසන් කළාට පසුව තමයි පිළිතුරු කථාව කරන්නේ. මම කියන්නේ මේ ප්‍රශ්න ඇති කර ගන්නේ නැතිව කටයුතු කරන්න. ආයේ ගිහිල්ලා දැන් පක්ෂ නායකයින්ගේ රැස්වීමක් තිබ්බා නේ? දැන් ඒකෙදීත් මේ විසඳුම නේ අරගෙන ආවේ. කථා කරලා මේක තීන්දු කරන්න. තමුන්නාන්සේලා ඡන්දේ දෙන එක නොදෙන එක වෙනම දෙයක්. ඒ විධියට මේක අවසන් කරන්නය කියලා මම ඉතාම කනගාටුවෙන් ඉල්ලනවා.

**ගරු අමල් සිල්වා**
Hon. Amal Silva

පක්ෂ නායක රැස්වීමක් තිබ්බේ මොකටද?

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒක තමයි මම කියන්නේ. ඒකත් වැරැදියි කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පක්ෂ නායක රැස්වීමේදී ගත්තු තීන්දුව මොකක්ද?

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මම ගියේ නැහැ. මට යන්න බැරි නිසා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ ගත්තු තීන්දුව නිවැරැදියි. න්‍යාය පත්‍රයෙන් මේ යෝජනාව අයින් වෙලා ඊළඟ යෝජනාවට යන්න කියලා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මෙතුමා නැහැයි කියලා නැහැ නේ?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

එහෙම වෙන්නේ කොහොමද? මගේ වරප්‍රසාද ප්‍රශ්නයක් නේ මම කථා කරන්නේ. ඔබතුමා ආරාධනා කරන්න ඕනැ, ගාමිණී තිලකසිරි ඇමැතිතුමාට. මේ කල් තබපු යෝජනාව හැටියට එතුමාට කථා කරන්න. මට තිබෙන්නේ පිළිතුරු කථාවට ආරාධනා කරන්න. ඔබතුමා මොකක්ද මේ ගෙනියන ක්‍රමවේදය.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ක්‍රමවේදය නොවෙයි. ඒ අදාළ මන්ත්‍රීවරයා සභාවේ නැත්නම් ඊළඟ එක්කෙනාගේ යෝජනාවට මම ගියා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

සභාවේ ගෞරවය රකින්න. මුලසුනේ ඉඳගෙන කරන්න යන අපරාධය.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ. සභාවේ යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීවරයා නැති නිසා ඊළඟ යෝජනාවට මම ගියා. න්‍යාය පත්‍රය අනුව.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මීට ඉහත සභා වාර 06 ක් ගිහිල්ලා නැත්නම්, අදත් නැත්නම් එතුමා සභාවේ ඉන්න එපැයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔව්. සභා වාර 06 ක්. ගරු මන්ත්‍රීතුමා තේරුම් ගන්න. මේ සභාව සභා වාර හයක් ඔබතුමාගේ යෝජනාව නිසා නාස්ති වුණා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අගමැතිවරයාට.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

හරි හෝ වැරැදි ක්‍රියාමාර්ගය ඉස්සරහාට ගෙනිහින් තිබෙනවා. එතකොට රීතියෙත් ඒක පැහැදිලිව කියෙව්වා. දැන් මේක දිගින් දිගට ගෙනියන්න එපා. හරිද? මොකද මේ සභාව පවත්වාගෙන යන්න ඕනැ. මේ ප්‍රශ්නය නිසාම මේ සභාව වාර කිහිපයක් කල් තිබ්බා. අද කල් තියන්න බැහැ. පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව යෝජනා කරලා තිබෙන්නේ. කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාට යම් අසාධාරණයක් වුණා නම් දැන් මේ විනාඩි කිහිපය තුළ සාධාරණයක් ඉෂ්ට කර ගත්තා. අනික් එක ඔබතුමා අපේ සහෝදරයෙක් වාගේ, අපේ ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක්. එතකොට ඔබතුමා අපටත් යම් යම් දේවල් කියලා දෙනවා. ඔබතුමා කියන දේවලුත් අපි අහනවා. ඒ නිසා දැන් මේක මෙතැනින් ඉදිරියට ගෙනි යන්න එපා. ඔබතුමා කල් වේලාව ඇතිව මේ පුස්තකාලයේ හිටිය බවට අපේ මන්ත්‍රීවරු තොරතුරු කියනවා. ඔබතුමා අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට එරෙහි නම් ඔබතුමාට මේ දොර ළඟ ඉඳලා ඊට පසුව ඇතුල් වෙන්න තිබුණා නේ? ඒ නිසා මම ඉල්ලා සිටින්නේ, ඔබතුමා වාගේ ජ්‍යෙෂ්ට මේ පළාත් සභාවේ විපක්ෂ නායක ධුරය දරපු කෙනෙක් හැටියට මේක දුරට ගෙනියන්න දෙන්න එපා. ඔබතුමාගේ අදහස් ප්‍රකාශ කළා. කරුණාකරලා කාලීන වැදගත්කමෙන් යුතු යෝජනාවක් අපේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරනවා. ඒකට අවස්ථාව දෙන්න.

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා**
Hon. Gamini Thilakasiri - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම සඳහනක් කළ යුතුයි. මොකද දිගින් දිගටම කථාව යන නිසා මමත් මේ වෙනුවෙන් කථා කරන්න හිටපු කෙනෙක් නිසා. නැත්නම් මම මේ ප්‍රශ්නයට මැදිහත් වෙන්නේ නැහැ. මොකද, නියෝජ්‍ය සභාපතිතුමා හරි හෝ වැරැදි යම්කිසි තීන්දුවක් ගත්තා. අපට මේ අවස්ථාවේ ඒ තීන්දුවට එකඟ වෙන්න සිද්ධ වෙනවා. මේ යෝජනාවට මම කථා කරන්න සිටියේ. මේ යෝජනාව පසුගිය කාලයේ කථා කර කර ඉන්දැද්දී අපේ ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා ගණපූරණය

නැහැයි කියලා ඒ ප්‍රකාශය කරපු නිසා මගේ කථාව අතරමගදී නවත්තන්න සිද්ධ වුණා. නමුත් මමත් විශ්වාස කරනවා, මෙතුමා නොසිටියත් ඒ වෙලාවේ මේ කථාව මගෙන් ආරම්භ වුණා නම් ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. නමුත් ඊට පෙර ඇති වුණු මතය නිසා මෙතුමා නොහිටපු නිසා ඉතාමත් හදිසියේ තීන්දුවක් ගන්න සිද්ධ වුණා, මේ යෝජනාව අහෝසි වෙනවා කියලා. මම කියනවා. මින් ඉදිරියටත් මේ වාගේ යම් යම් අවස්ථාවලදී ඉතාමත්ම ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුතුව මේ කටයුතු කරන්නය කියලා මම කාරුණිකව ඉල්ලීමක් කරනවා. නැත්නම් මම විනාඩි දෙකක් කථා කරලා, මෙතුමා විනාඩියක් කථා කළා. මේක close.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

එහෙමනම් ඉවරයි.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඉවර කළා නම් ඉවරයි. මමත් මාස ගණනක් තිස්සේ මේ ජනාධිපතිතුමා වෙනුවෙන් කථා කරන්න මාස ගණනක් මමත් මේ තුණ්ඩු දෙකක් තියාගෙන සිටියා. නමුත් මට ඒ අවස්ථාව ලැබුණේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

*[නැඟී සිටියේය. ]*
*[Stood.]*

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමා, මගේ නම තුන් හතර වතාවක් දැන් කියැවුණා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු මුලසන හොබවන මන්ත්‍රීතුමා -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

කරුණාකරලා -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මගේ නම දැන් අවස්ථා ගණනාවකදී කියැවුණා. ඒ කියැවුණු හැම අවස්ථාවකදීම කියැවුණේ මගේ යෝජනාවට විරුද්ධ වෙලා එළියේ සිටියා කියලා. කවුරුවත් ඒ චෝදනා ආපු කට්ටිය ප්‍රතික්ෂේප කළෙත් නැහැ. ඒ නිසා මටත් සිද්ධ වෙනවා හිතන්න, ඇත්තටම වුණේ ඒකයි කියලා. සාධාරණව මම හිතන්න ඕනෑ. දැන් මේ පැත්තෙන් තුන් හතර දෙනෙක් කිව්වා, දීපාල් මන්ත්‍රීතුමාගේ යෝජනාවට විරුද්ධත්වය පළ කිරීම සඳහා පුස්තකාලයේ යම් යම් අයවලුන් සිටියා කියලා. යෝජනාත් කළා, පුස්තකාලයේ ඉන්න එපා. විරුද්ධ වෙලා දොර ගාව ඉන්නය කියලා. එහෙම හිටියාම මෙහෙම වරදින්නේ නැහැයි කියලා. හැබැයි කවුරුවත් ඒක ප්‍රතික්ෂේප කළේ නැහැ. ඒ නිසා මටත් හිතෙනවා එහෙමද වුණේ කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අනිවාර්යයෙන්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇත්ත කථාව ඒකයි.

[සභාවේ සෝෂා]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමා 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ප්‍රඥප්ති කාරක සභාවේ සාමාජිකයෙකු විධියට අද දිනයේ තොරතුරු තාක්ෂණ ප්‍රඥප්තිය ආණ්ඩුකාරවරයාගේ සංශෝධන සහිතව -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

රහිතව -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සහිතව -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඡන්දය දීපු උදවියවත් දන්නේ නැහැ සහිතව ද රහිතව ද සම්මත වුණේ කියලා. දැන් තේරෙනවා නේ තත්ත්වේ. ඔන්න තත්ත්වේ. ඔන්න ප්‍රඥප්ති සම්බන්ධයෙන් තිබෙන තත්ත්වය. මම මේ නිලධාරී මහත්වරුන්ගෙන් හරියටම දැන ගත්තේ. සංශෝධන සහිතව සම්මත කළා. මේ වරප්‍රසාද කඩ වුණේ මගේ නොවෙයි ගරු නියෝජ්‍ය සභාපතිතුමා, ප්‍රඥප්ති කාරක සභාවේ. මේකේ මාධ්‍යයට කථා කරන්න හෝ තමන්ගේ අඩු දැනුම, අව දැනුම -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දිගින් දිගටම කථා කරන්න දෙන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

නැහැ. නැහැ. දැනුමක් විධියට භාවිතා කරන්න මේක යොදා ගන්න එක වැරදියි. ප්‍රඥප්ති කාරක සභාව මේක සම්බන්ධයෙන් එකඟත්වය පළ කළේ, පැහැදිලිව මම ඒ අවස්ථාවේදී නිහඬව හිටපු කාරණය, ප්‍රඥප්ති කාරක සභාවේ ගරුත්වය ආරක්ෂා කරන්න ඕනෑ නිසා. මගේ ගරුත්වය නොවෙයි. ප්‍රඥප්ති කාරක සභාවේ ගරුත්වය. මම කිව්වා, 9(2), 24 සහ විගණනය සම්බන්ධයෙන් මම එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඉන්න. ඉන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමා, මුලින් තේරුම් ගන්න. එකඟයි. ඒ එකඟ වෙන්න හේතුව තමයි අද උදෑසන මම පිළිගන්වපු ප්‍රඥප්ති කාරක සභාවේ වාර්තාවේ තියෙනවා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

තත්ත්පරයක් ඉන්න. ප්‍රඥප්ති කාරක සභා වාර්තාවේ තිබෙනවා,

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒකට අවස්ථාව නොවෙයි කියන එකයි මේ කියන්නේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඒක තේරුම් කරන්න - මේක වරප්‍රසාද ප්‍රශ්නයක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රඥප්ති කාරක සභාව පිළිගන්වපු වාර්තාවේ තිබෙනවා මේ තුනට ප්‍රඥප්ති කාරක සභාවේ සාමාජිකයන් එකඟයි. අනික් ඒවාට එකඟ නැහැයි කියලා. කොහොමද ප්‍රඥප්ති කාරක සභාවේ උදවිය මෙතැනට ඇවිල්ලා රෙද්දක් ඇඳගෙන කිව්වේ ආණ්ඩුකාරතුමාගේ යෝජනාවට එකඟයි කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. තවදුරටත් මේ පිළිබඳව කථා කරන්න දෙන්න බැහැ. විවාදයට දෙන්න අවස්ථාව නැහැ. පී.ඩී.අබේරත්න ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. 36(1).

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පිටිපස්සේ මන්ත්‍රීතුමා කථා කරන්න ඉස්සෙල්ලා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මට දෙන්න, අවස්ථාව.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කථා කරන්න. ඔබතුමා කථා කරන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මේ සභාව මේ ගරු මන්ත්‍රීවරු 104 දෙනාගේම ගෞරවය රැකෙන ආකාරයට මුලසුන හොබවන මන්ත්‍රීවරයා සිටින්න ඕනෑ. ඔබතුමා මන්ත්‍රීවරයෙකු හැටියට මේ සභාවේ ඉඳගෙන ඔබතුමා මේ රටේ ජනාධිපතිවරයාට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙච්ච -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

වරප්‍රසාද ප්‍රශ්නය විතරක් කියන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මූලාසනය කටයුතු කළේ, සභා වාර පහකදී මේ සභාවට වුණු අසාධාරණයට සාධාරණයක් ඉෂ්ට වුණා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මට කථා කරන්න ඉඩ දෙන්න. 36(1) යටතේ මට කථා කරන්න ඉඩ දෙන්න. මගේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මේ යෝජනාව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට වුණු අසාධාරණය කෙටියෙන් කියන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මේ යෝජනාව ගෙනාවේ ජනාධිපතිවරයාට, අගමැතිවරයාට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. ඔබතුමාට වුණු අසාධාරණය කියන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ස්තුතිය ප්‍රකාශ කිරීමේ යෝජනාවක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඉතින් ඔබතුමාත් නැහැ නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සභාවට මන්ත්‍රීවරු ගෙන්න ගන්න.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

සභාවේ මන්ත්‍රීවරු නැත්නම් -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මේ පිළිබඳව හොඳ නරක දෙකම කථා කළා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමා පස්ස හැරිලා බලන්න. මන්ත්‍රීවරුත් නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

කථා කරලා ඊළඟට කථා කර කර සිටියේ ගාමිණී තිලකසිරි ඇමැතිතුමා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. දැන් දිගින් දිගටම, දිගින් දිගටම කිව්වා ගාමිණී තිලකසිරි -

[සභාවේ ඝෝෂා]

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

මෙතුමාගේ පාර්ශවයේ මන්ත්‍රීවරුත් නැහැ. සභාවට ගෙන්න ගන්න බැරි වුණා. නිකන් කාලය කනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මේ අහන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔක්කෝම නැඟිටලා ගියා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

එහෙමනම් දැනුත් ගණපූරණය නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සීනුව නාද කරන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

එහෙමනම් ගණපූරණය දැනුත් නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මගේ වරප්‍රසාද ප්‍රශ්නයට උත්තරයක් දීලා ඉන්න. එහෙම නැත්නම් මාව සභාවෙන් එළියට දාන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

දැන් සභාවේ ගණපූරණය තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගණපූරණය සෑහීමකට පත් වෙනවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

සභාවේ ගණපූරණය තිබෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

36(1) යටතේ මගේ වරප්‍රසාදය කඩ කිරීමක් කරලා තිබෙනවා, මූලසුන හොබවන නීතිරීති දන්නේ නැති තමුන්නාන්සේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. හරි. ඒකට කමක් නැහැ. සභාව පිළිගන්නවා නේ?

[සභාවේ ඝෝෂා]

ඒ සම්බන්ධයෙන් මම වරප්‍රසාද කමිටුවට ඉදිරිපත් කරන්නම්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

හරි. වරප්‍රසාද කමිටුවට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට වරප්‍රසාදයක් අහිමි වුණා නම් ඒ කමිටුවෙන් තීන්දුවක් අරගනියි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒ පිළිබඳව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. බොහොම ස්තුතියි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මේ සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ රෙදි ගැලෙව්වා තමුන්නාන්සේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. කමක් නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

රෙදි ගැලෙව්වා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බහුතරය -

[සභාවේ ඝෝෂා]

මම මේ සභාව ගෙනියන්න ඕනෑ බහුතරයේ මතයට. සභාව, සභා රීති අනුව ගෙනියන්න ඕනෑ.

[සභාවේ ඝෝෂා]

ගරු මන්ත්‍රීතුමා, වාඩි වෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සභා වාර හයක රෙදි ගලෝ ගත්තා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

වාඩි වෙන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

පිළිතුරක් දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

වාඩි වෙන්න. පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

වරප්‍රසාද ප්‍රශ්නයට උත්තරයක් දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

වරප්‍රසාද කමිටුවට ඉදිරිපත් කරලා ඔබතුමා පිළිතුරක් දෙන්නම්. දැනට වාඩි වෙන්න. සභාව තවදුරටත් ගෙනියන්න -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මගේ වරප්‍රසාදය -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

තමුන්ගේ සහෝදර මන්ත්‍රීතුමා ගේන යෝජනාවට ඉඩ දෙන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

වරප්‍රසාද කඩ වෙලා තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා ඉඩ දෙන්නේ නැත්නම් මට සභාව කල් තියන්න සිද්ධ වෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගණපූරණයක් නැතිව සභාව -

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ගරු නියෝජ්‍ය සභාපතිතුමා, සභාව කල් තියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි හෝ වැරදි සභාව කල් තියන්න සිද්ධ වෙනවා. දැන් ඔබතුමා ගෙනාපු -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඊළඟට හිටපු කථිකයාට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා ගෙනාපු යෝජනාව නිසා මේ සභාව -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මට තියෙන්නේ පිළිතුරු කථාව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ සභාව දින පහක් අයාලේ ගියා. වෙන යෝජනාවක් ගේන්න බැරි වුණා. ඒ නිසා මේ යෝජනාව ඉදිරිපත් කරපු ඔබතුමා සභාවේ සිටියේ නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගණපූරණය නැති නිසා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා සභාවේ සිටියේ නැති නිසා අපි ඊළඟ යෝජනාවට ගියා. ඒක නිසා -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔබතුමා ඊළඟ යෝජනාවට ගිය ක්‍රමය කියන්න මට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගිය ක්‍රමය ඔබතුමා සභාවේ නොසිටීම.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මේ සභාවේ ගණපූරණය නැතිව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාව ගෙනියන්න බැහැ. ඒ මන්ත්‍රීවරයෙක් නැත්නම්, ඒ යෝජනාවට කථා කරන්න අය නැත්නම් ඊළඟ යෝජනාවට අපි යන්න ඕනෑ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මෙතුමා වාර හයක රෙදි ගලෝ ගත්තා. අලුතෙන් ගලෝ ගන්න දෙයක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

තීන්දුවක් අර ගත්තා. මූලාසනය ගත්තු තීන්දුව නිවැරැදියි.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

මේ කාලය අපරාදේ. සභා වාර පහක් තිස්සේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මූලාසනය ගත්තු තීන්දුව නිවැරැදියි. ඒ තීන්දුව අරගෙන ඉවරයි.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

මොකක්ද මේ කරන විහිළුව?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ නිසා මීට වැඩිය කථා කරන්න දෙන්න බැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපි රෙදි ගැලෙව්වේ නැහැ. මෙයා ගලෝ ගත්තා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නිවැරදිව ගත්තු තීන්දුවක්. වැරදි නම් ඔබතුමා ඉදිරිපත් කරන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

වැරදියි.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාවේ දින පහක් ඔබතුමා නාස්ති කළා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මන්ත්‍රීවරුන්ගේ කාලය නාස්ති වුණා වාගේම මගේ යෝජනාවත් නාස්ති වුණා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේ යෝජනාව නිසා සභා වාර පහක කාලය නාස්ති වුණා. තමුන්නාන්සේ තමුන්නාන්සේගේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා තව දින 10 ක් ගෙනාවත් ඔය යෝජනාවට ඔච්චර තමයි වෙන්නේ. ඒ නිසා අයින් වෙන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒක අපට කමක් නැහැ. සභාවේ ඡන්දයක් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ නිසා ගරු මන්ත්‍රීතුමා ඔබතුමා අයින් වෙලා පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාට යෝජනාව ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දෙන්න. (බාධා කිරීම්)

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS MOTION:

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"කළුතර අගලවත්ත මැතිවරණ කොට්ඨාශයේ (බාධා කිරීම්) අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රත්මලේ ග්‍රාම නිලධාරී වසමේ පිහිටා ඇති තඹදොල ඇල්ල දෙස් විදෙස් සංචාරකයින් නිතර ගැවසෙන ඉතාමත් සුන්දර පරිසරයක් තිබෙන අලංකාර දිය ඇල්ලකි. (බාධා කිරීම්) මෙම ස්ථානයේ සංචාරකයින්ට අවශ්‍ය පහසුකම් සලසමින් සංවර්ධනය කර බස්නාහිර පළාත් සංචාරක අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යා යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ස්ථිර කරන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

*[විසින් ස්ථිර කරන ලදී. ]*
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මගේ වරප්‍රසාද ප්‍රශ්නයට මට උත්තරයක් දෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සංචාරක ව්‍යාපාරය මම භාර ගන්නකම් මේක තිබුණේ Private Company යක්

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

හැටියට. දැන් අපි බස්නාහිර පළාතේ සංචාරක අමාත්‍යාංශය පළාත් සභාවට පත් කරගෙන තිබෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒ අනුව මෙතුමා සඳහන් කරපු -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒ ප්‍රදේශයත් සංචාරක ව්‍යාපාරය -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

සම්බන්ධ කරගෙන අපේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට (බාධා කිරීම්) අවශ්‍ය කටයුතු -

[සභාවේ ඝෝෂා]

ඒ නිසා මම සතුටු වෙනවා පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ඉදිරිපත් කිරීම ගැන. මේ වාගේ කාලීන වැදගත්කමක් තිබෙන ව්‍යාපාරයක -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පුස්තකාලයේ ඇත.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ලබා ගත හැකි මේ වාගේ ස්ථාන හඳුනාගෙන අපේ ගරු මන්ත්‍රීතුමා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පුස්තකාලයේ ඇත.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ව්‍යාපාරය පිළිබඳව බස්නාහිර පළාත තුළ විශේෂ වැඩ පිළිවෙළක් සකස් කළ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ප්‍රධාන ඇමැතිතුමා මේ කථා කරන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මේක ඉතාමත්ම වැදගත් දෙයක්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මගේ වරප්‍රසාද ප්‍රශ්නයට උත්තරයක් දෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අද විශේෂයෙන්ම සංචාරකයෙක් (බාධා කිරීම්) එයා එක දවසයි බස්නාහිර පළාතේ ඉන්නේ. අඩුම වශයෙන් බස්නාහිර පළාතේ සංචාරකයෙක් ගම්පහ, කොළඹ, කළුතර දවස් 15 ක් තියාගන්න පුළුවන්කම තියෙනවාද? දවස් 15 ක්

සංචාරකයෙක් රඳවා ගන්න පුළුවන්කම තියෙනවාද? අපි ඒ සඳහා වැඩ පිළිවෙළක් හදනවා. ඒ වැඩ පිළිවෙළවට මෙතුමාගේ යෝජනාව අපි -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා එළියට දාන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මගේ වරප්‍රසාද ප්‍රශ්නයට උත්තරයක් දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව සම්බන්ධව කථා කරන්න මන්ත්‍රීතුමන්ලාට අවස්ථාව.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

වාඩි වෙලා ඉන්න අපි ඒ වාගේ දෙමව්පියන්ගේ දරුවෝ නොවෙයි. මගේ වරප්‍රසාද ප්‍රශ්නයට උත්තරයක් දෙන්න.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

අගලවත්ත මැතිවරණ කොට්ඨාශයේ අපේ ග්‍රාම සේවා වසමේ තඹදොළ ඇල්ල දෙස් විදෙස් සංචාරකයින්ගේ විශේෂ ආදර්ශ -

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සභාවේ ගණපූරණය නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

[සභාවේ ඝෝෂා]

මේ අවස්ථාවේ සභාව විනාඩි 10 කට තාවකාලිකව අත්හිටුවනවා.

*ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් අ.භා. **01.04** ට යළිත් රැස් විය.*
*Sitting, accordingly suspened untill 01.04 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාවේ ගණපූරණය සම්බන්ධව සෑහීමකට පත් වෙනවාද? කරුණාකර සීනුව නාද කරන්න.

# රීති අංක 12 (1) යටතේ සභාව කල් තැබීම

ADJOURNMENT OF THE COUNCIL SITTING UNDER RULE NO. 12(1)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

තවමත් ගණපූරණය නොමැති නිසා *"දැන් මම සභාව කල් තබනවා."*

*ඊට අනුකූලව පළාත් සභාව අ.භා. **01.09** ට, **2017** ජූලි මස 18 වන දින පූ.භා. **9.30** වන තෙක් කල් ගියේය.*
*Sitting, accordingly adjourned at 01.09 p.m till 9.30 a.m. on 18.07.2017*